# පුවත් විශ්ලේෂණ වාර්තාව

(ළමයින් හා පරිසරය සම්බන්ධව පළ වූ පුවත් ඇසුරින්)

## පළමුවන කලාපය

## 2017

**සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය**

**ජාතික සමාජ සංවර්ධන ආයතනය.**

# පුවත් විශ්ලේෂණය

(ළමයින් හා පරිසරය සම්බන්ධව පළ වූ පුවත් ඇසුරින්)

**පළමුවන කලාපය**

2017

**සංස්කරණය**

**කේ. චාමරි කුමාරි ද තාබ්‍රෙව්**

**සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය**

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

**පුවත් විශ්ලේෂණය**

2017 දෙසැම්බර්

© සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය, ජාතික සමාජ සංවර්ධන ආයතනය.

**ISBN978-955-8003-17-6**

**අක්ෂර සංයෝජනය හා පිටු සැකසුම**
චාමරි තාබේව්/ කාංචනා කරඳවල

**පිට කවර නිර්මාණය**
තරිඳු චින්තක

**විවිධ සහාය**
නයනා ලියනගේ මිය, ඒ. කේ. එස්. අලංකාර මයා

**මුද්‍රණය**
Kaleidoscope print & media solutions
නො: 125, නාවල පාර,
නාරාහේන්පිට, කොළඹ 05
Tel : 0112-368246
Fax : 0112-368712
E-mail : kaleidoscopeprintmedia@gmail.com

**ප්‍රකාශනය**
සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
අංක 488 ඒ, නාවල පාර,
රාජගිරිය.
0112882506/7, 0112368180
E-mail:nisd@slt.lk
Web:www.nisd.lk

**උපදේශකත්වය**

ආචාර්ය රිඩ්ලි ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සමාජ සංවර්ධන ආයතනය

**අධීක්ෂණය**

ෂාමිණී අත්තනායක
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන)
ජාතික සමාජ සංවර්ධන ආයතනය

**නියාමනය හා මඟපෙන්වීම**

එම්. එස්.එම්. අස්මියාස්, අධ්‍යක්ෂ
සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
ජාතික සමාජ සංවර්ධන ආයතනය

**සංස්කරණ උපදේශකත්වය**

එස්.ඒ.එෆ්. ෂානාස්, කථිකාචාර්ය
ජනසන්නිවේදන අධ්‍යනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

**සම්බන්ධීකරණය හා වාර්තාකරණය**

කේ. චාමරි කුමාරි ද තාබ්‍රෙව්
සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
ජාතික සමාජ සංවර්ධන ආයතනය

**සහාය සම්බන්ධීකරණය**

කාංචනා කරඳවල
සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
ජාතික සමාජ සංවර්ධන ආයතනය

# පෙරවදන

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය මගින් වාර්ෂිකව ශාස්ත්‍රීය ග්‍රන්ථ ප්‍රකාශයට පත් කරනු ලබයි. 2017 වර්ෂය සඳහා පර්යේෂණ අංශය මගින් නව ග්‍රන්ථ කිහිපයක් හඳුන්වා දෙන අතර ඉන් එක් ග්‍රන්ථයක්වනුයේ පුවත් පත් ආශ්‍රයෙන් සිදු කරනු ලබන විශ්ලේෂණාත්මක වාර්තාවයි. ශාස්ත්‍රීය ග්‍රන්ථකරණය සියලුම දෙනාට සිදු කළ නොහැකිය. ඒ සඳහා නිර්මාණාත්මකබව ත්, ව්‍යවහාරික ඥානය ත් ඉන් ඔබ්බට ගිය ශාස්ත්‍රීය ඥානය ත් අවැසි වේ. කලා ගුණය හා කලා රසය පිහිටන්නේ වාසනාවන්තයින්ට බව භාරතයේ භාෂා විෂාරද දන්ඩීන් පඬිවරයා හා කාලිදාස පඬිතුමා විවිධ අවස්ථාවල පවසා ඇත. අධ්‍යතනයේ සන්නිවේදන විෂය තුළින් මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව දැනුම ලබා දෙන අතර සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් මුද්‍රිත මාධ්‍යය සමාජයට ප්‍රවෘත්ති, අදහස්, දැන්වීම්, විනෝදාංශ හා වෙනත් සමාජීය කරුණු අඩංගු මුද්‍රණයක් වේ. මුද්‍රිත මාධ්‍ය කලාවේ පුවත් පත් මූලාශ්‍රය කර ගනිමින් මෙම වර්ෂයේ හඳුනවා දෙන මෙම නිර්මාණාත්මක හා ශාස්ත්‍රීය ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලැබූ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශයේ අධ්‍යක්ෂ එම්.එස්.එම්. අස්මියාස් මහතාට සහ සඟරා සංස්කාරකවරුන්ට ත්, සඟරාවේ සාර්ථකත්වය සම්බන්ධයෙන් නොමද දායකත්වයක් ලබා දුන් සියලුම නිලධාරී, නිලධාරිනියන්ට ත් මාගේ කෘතවේදීත්වය පිරිනමන අතරම උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස මෙවැනි ශාස්ත්‍රීය හා පර්යේෂණ කෘති විද්වත් පාඨක ප්‍රජාව වෙත ලබාදීමට හැකිවීම අප ලද සුවිශාල ජයග්‍රහණයක් ලෙස ද සඳහන් කරනු කැමැත්තෙමි.

සමාජ වැඩ අධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ උපාධි පිරිනමනු ලබන එකම උසස් අධ්‍යාපන ආයතනය වන ජාතික සමාජ සංවර්ධන ආයතනය මෙවැනි කලාත්මක හා විෂයානුකුල ශාස්ත්‍රීය ග්‍රන්ථ තුළින් පාඨකයන්ට ස්වකීය දැනුම වර්ධනය කර ගැනීම උදෙසා මහත් පිටුබලයක් ලබා දෙන අතර ඉදිරියට ත් මෙවැනි ශාස්ත්‍රීය ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීමට හැකියාව ලැබේවායි සුබ ප්‍රාර්ථනා කරමි.

**ආචාර්ය රිඩ්ලි ජයසිංහ**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

# උපකාරකානුස්මෘතිය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය කාලීන සමාජ අවශ්‍යතාවයන් හඳුනාගනිමින් සමාජයට අවශ්‍ය පර්යේෂණ හා ප්‍රකාශනයන් සිදු කරනු ලබයි. 2017 වර්ෂය සඳහා පර්යේෂණ අංශය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශයන් අතර නව්‍ය ප්‍රකාශනයක් වශයෙන් පුවත් පත් විශ්ලේෂණ වාර්තාව හඳුනාගත හැකිය.

මුද්‍රණ කලාව වර්තමානයේ ජනප්‍රිය සන්නිවේදන මාධ්‍යයක් වේ. 1900 න් පසුව ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාව තුළ කැපීපෙනෙන වේගවත් දියුණුවක් ඇති විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපානු ලැබුවේ විවිධ අරමුණු හා අවශ්‍යතා අනුව විවිධ භාෂාවන්ගෙන්, විවිධ පුද්ගලයන් හා ආයතනයන් විසින් පුවත්පත් ආරම්භ කිරීම ය. මෙසේ ආරම්භ කරන ලද පුවත්පත් හි වාර්තා වන විවිධාකාරයේ පුවත් තේමා අනුව විග්‍රහයට ලක් කිරීමට හැකි ය. මෙම ග්‍රන්ථය තුළින් ළමයින් හා පරිසරය සම්බන්ධව ප්‍රකාශයට පත් වූ පුවත් පිළිබඳව විශ්ලේෂණාත්මක විග්‍රහයක් සිදු කර ඇත. මෙම ග්‍රන්ථකරණයේ දී උපදේශකත්වය ලබා දුන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රිඩ්ලි ජයසිංහ මහතාට ත්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) ෂාමිණි අත්තනායක මහත්මියට ත්, ග්‍රන්ථ සංස්කරණ උපදේශකත්වය සැපයූ කොළඹ විශ්වවිද්‍යාලයේ, ජන සන්නිවේදන අධ්‍යනාංශයේ කථිකාචාර්ය එස්.ඒ.එෆ්. ෂානාස් මහත්මියට ත් මාගේ ගෞරවණීය ස්තුතිය පුද කර සිටිමි. විශේෂයෙන්ම මෙම ග්‍රන්ථකරණයේ දී අධ්‍යයන කටයුතු මණ්ඩලය හා පාලක සභා සාමාජිකයන් විසින් ලබා දුන් මග පෙන්වීමට කෘතඥ වෙමි.

මෙම පුවත්පත් විශ්ලේෂණ වාර්තාව එළිදැක්වීම සඳහා මෙම කාර්ය කඩිනමින් හා සාර්ථකව නිමා කිරීම සම්බන්ධයෙන් මෙහි ග්‍රන්ථ සංස්කාරක වශයෙන් කටයුතු කළ කේ. චාමරි කුමාරි ද තාබ්‍රෙව්ට ත්, සහය සංස්කාරක කාංචනා කරඳවල මහත්මියට ත් මාගේ විශේෂ ස්තුතිය පුද කරන අතර ග්‍රන්ථ සංස්කරණය සඳහා සහාය දැක්වූ සියලුම දෙනාට ත්, නන් අයුරින් සහාය වූ අධ්‍යයන හා අනධ්‍යයන නිලධාරි මණ්ඩලයට ත්, මෙම සඟරාවේ මුද්‍රණ කටයුතු භාරගනිමින් සාර්ථකව එකී කටයුතු ඉටුකරදුන් කලඩොස්කොප් ආයතනයේ කළමනාකාරතුමන් හා කාර්ය මණ්ඩලයට ත් මාගේ විශේෂ ස්තුතිය පුද කර සිටිමි.

**එම්.එස්.එම්.අස්මියාස්**
**අධ්‍යක්ෂ,**
**සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය**

## සංස්කාරක සටහන

ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පයේ ඉතිහාසය සොයා යාමේ දී එහි ඉතිහාසය ලන්දේසි යුගයෙන් ආරම්භවුව ත් ඈත අතීතයේ සිටම ග්‍රන්ථකරණය සිදුවිය. මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 1802 දි ප්‍රකාශයට පත් කරන ලද පුවත්පත් මාධ්‍යයේ ආරම්භය සනිටුහන් වූ අතර එය රාජ්‍ය පණිවුඩ පමණක් අඩංගු ලේඛනයක් වූ හෙයින් 1832 දි විවිධ විශේෂාංග ඇතුළත් පුවත්පතක් වශයෙන් Colombo Journal ප්‍රකාශයට පත් විය. අධ්‍යනයේ දිනපතා, සතිපතා, සති අන්ත හා මාසික ආදී වශයෙන් පුවත්පත් ප්‍රකාශයට පත් වන අතර මෙම ග්‍රන්ථය තුළින් දිවයින හා ලංකාදීප යන දිනපතා පළ වූ පුවත්පත්වල 2017 මාර්තු මාසය තුළ ළමුන් හා පරිසරය යන තේමාවන් යටතේ ප්‍රකාශයට පත් පුවත් පිළිබඳව විචාරාත්මක විශ්ලේෂණයක් කර තිබේ. එමෙන් ම තෝරා ගත් පුවත්හි ප්‍රධාන ශීර්ෂ පාඨයට අදාළ පසුබිම හා වාර්තාකරණයේ ස්වභාවය පිළිබඳව ද මෙහි විශ්ලේෂණයක් සිදු කර තිබේ.

මෙම විශ්ලේෂණාත්මක ග්‍රන්ථකරණයෙහි දී ආරම්භයේ සිට අවසානය දක්වාම නිවැරදි උපදේශකත්වය හා මඟපෙන්වීම ලබා දුන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රිඩ්ලි ජයසිංහයන් මෙහි දී සිහිපත් කිරීමට කැමැත්තෙමි. එමෙන් ම සඟරාවේ සාර්ථකත්වය පිටු පස නිබඳව හුන් සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශයෙහි අධ්‍යක්ෂ එම්.එස්.එම්. අස්මියාස් මහතා හා සියලු පර්යේෂණ නිලධාරීන්, පර්යේෂණ සහකාරවරුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් කෘතවේදීව සිහිපත් කරමි.

කොළඹ විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යනාංශයේ කථිකාචාර්ය එස්.ඒ.එෆ්. ෂානාස් මහත්මියට මෙම ග්‍රන්ථයෙ හි සාර්ථකත්වය උදෙසා ත්, ශාස්ත්‍රීය බව සංවර්ධනය කිරීම උදෙසා ත් ග්‍රන්ථ සංස්කරණ උපදේශකත්ව කටයුතු සිදු කිරීම වෙනුවෙන් ලබා දුන් සේවය සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන අතර, සහය සංස්කාරකවරියට ත් මාගේ ගෞරවය හිමි වේ. සඟරාවේ මුද්‍රණ කටයුතු සාර්ථකව කරදුන් කලඩොස්කොප් ආයතනයේ කාර්ය මණ්ඩලයට සහ නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට ත් කෘතඥතාව හිමි වේ.

**සංස්කාරක:**

**කේ. චාමරි ද තාබ්‍රෙව්**
**සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය**
**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

# පටුන


| | | |
|---|---|---|
| | පෙරවදන | I |
| | උපකාරකානුස්මෘතිය | ii |
| | සංස්කාරක සටහන | iii |
| | පටුන | iv-v |
| | වගු පටුන | vi |
| | **පළමු පරිච්ඡේදය** | |
| | **හැඳින්වීම** | 1-7 |
| 1.1 | අධ්‍යයන පසුබිම | 1-4 |
| 1.2 | අධ්‍යයනයේ අරමුණු | 4 |
| 1.3 | අධ්‍යයන ක්‍රමවේදය | 5 |
| 1.4 | අධ්‍යයන දුෂ්කරතා, සිමාකම් හා අත්දැකීම් | 6 |
| 1.5 | පරිච්ඡේදකරණය | 6-7 |
| | **දෙවන පරිච්ඡේදය** | |
| | **සංකල්ප නිර්වචනය** | 8-29 |
| 2.1 | පුවත්පත් පිළිබඳ අර්ථකතනය | 8-9 |
| 2.2 | ළමයා පිළිබඳ අර්ථකතනය | 10 |
| 2.3 | ළමයා හා ළමා අපරාධ පිළිබඳව සමාජ විද්‍යාත්මක විශ්ලේෂණය | 11-18 |
| 2.4 | පරිසරය පිළිබඳ අර්ථකතනය | 18-24 |
| 2.5 | පරිසර ගැටළු | 24-26 |
| 2.6 | පරිසර සංරක්ෂණය | 25-29 |

## තෙවන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| | **දත්ත විශ්ලේෂණය** | 30-50 |
| | හැඳින්වීම | 30 |
| 3.1 | විශ්ලේෂණයට පාදක වූ පුවත් හි ස්වභාවය | 31 |
| 3.2 | ළමයින් සම්බන්ධව පළ වූ පුවත් හි ස්වභාවය | 32-33 |
| 3.3 | ළමා ලිංගික හිංසනයන් සම්බන්ධ පුවත් | 33-35 |
| 3.4 | ළමා ඝාතන සම්බන්ධ පුවත් | 35-36 |
| 3.5 | අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් මුහුණ පාන ගැටළු | 36-38 |
| 3.6 | අනතුරු හේතුවෙන් ළමුන්ට සිදු වන හානි | 38-39 |
| 3.7 | ළමුන්ගේ චර්යාමය ගැටළු | 39-42 |
| 3.8 | ළමා හිමිකම් කඩකිරීම් | 42-45 |
| 3.9 | පරිසරය සම්බන්ධව පළ වූ පුවත් | 46-47 |
| 3.10 | අලි මිනිස් ගැටුම | 47 |
| 3.11 | ස්වභාවික සම්පත් විනාශ කිරීම | 48-49 |
| 3.12 | පරිසර සංරක්ෂණය ආශ්‍රිත පුවත් | 49-50 |


## සිව්වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| | **සමාලෝචනය, නිගමන හා යෝජනා** | 51-56 |
| | හැඳින්වීම | 51 |
| 4.1 | සමාලෝචනය | 52-53 |
| 4.2 | නිගමන | 53-55 |
| 4.3 | යෝජනා | 55-56 |
| | ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය | 57 |
| | ඇමුණුම 01 | 58-64 |

# වගු පටුන


| | | |
|---|---|---|
| වගුව 3.1.1 | විශ්ලේෂණයට පාදක වූ පුවත් පත් | 31 |
| වගුව 3.1.2 | විශ්ලේෂණයට පාදක වූ පුවත්හි ස්වභාවය | 31 |
| වගුව 3.2.1 | ළමයින් සම්බන්ධව පළ වූ පුවත්වල තේමාවන් | 32 |
| වගුව 3.3.1 | ළමා ලිංගික හිංසනයන් සම්බන්ධ පුවත් | 34 |
| වගුව 3.4.1 | ළමා ඝාතනයන්ට සම්බන්ධ වූ හේතූන් | 35 |
| වගුව 3.5.1 | අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් මුහුණපාන ගැටළු | 36 |
| වගුව 3.5.2 | අනාරක්ෂිතභාවය හේතුවෙන් සිදු වූ කායික හානි හා ජීවිත හානි | 37 |
| වගුව 3.6.1 | ළමුන්ට සිදු වූ අනතුරුවල ස්වභාවය | 38 |
| වගුව 3.6.2 | අනතුරු හේතුවෙන් ළමුන්ට සිදු වූ කායික හානි හා ජීවිත හානි | 39 |
| වගුව 3.7.1 | ළමුන්ගේ චර්යාමය ගැටළු | 41 |
| වගුව 3.8.1 | ළමා හිමිකම් කඩකිරීම් | 42 |
| වගුව 3.9.1 | පරිසරය සම්බන්ධව පළ වූ පුවත් | 46 |

# පළමු පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 අධ්‍යයන පසුබිම

සමාජ ආර්ථික සාධක පදනම් වන ලෝකයේ සමස්ත සමාජ ක්‍රියාවලිය ම විවිධ විපර්යාසයන්ට ලක් වෙමින් පවති. ජීව අජීව සෑම දෙයක් කෙරෙහි ම බලපා ඇති මෙම තත්ත්වය මිනිස් ජීවිතවලට ප්‍රබල වශයෙන් බලපෑම් කර තිබේ. සමාජ සම්මතයන් අභිබවායමින් සමාජ රැකවරණය ලැබිය යුතු ප්‍රජා සමූහයන් වර්තමානයේ අවදානම් තත්ත්වයට පත්ව තිබේ. මානව ක්‍රියාවලියේ ළමාවිය හා වැඩිහිටිවිය කෙරෙහි මෙය ප්‍රබල වශයෙන් බලපා ඇත. සමාජයේ වැඩි අවධානයක් යොමු ව ඇති ප්‍රජා කණ්ඩායමක් වශයෙන් ළමයින් හඳුනාගත හැකිය. වර්තමාන සමාජයේ වැඩි වශයෙන් හිංසනයන්ට ගොදුරුවන මානව කණ්ඩායමක් වශයෙන් ද ළමයින් කණ්ඩායම හඳුනාගත හැකිය. විශේෂයෙන් ම කායිකව හා මානසිකව ළමුන්ව විවිධ හිංසනයන්ට ගොදුරුවීම නූතනයේ ප්‍රබල සමාජ ගැටලුවක් වේ. ළමයින් සම්බන්ධ ගැටලු මෙන් ම පරිසරය ද වර්තමානයේ අභියෝගයට ලක්ව ඇත. නූතන මානවයාගේ ප්‍රාථමික අවශ්‍යතා මෙන්ම ද්විතියික අවශ්‍යතා පරිසරය තුළින් ඉටු කර ගත්ත ද, පරිසරය කෙරෙහි අවධානය යොමුවීම සීමා වන්නට විය. මිනිසාගේ අවධානය පරිසරය කෙරෙහි යොමු නොවනවිට පරිසරය තුළ සිදුවන වෙනස්වීම්, පරිසර විනාශයන් හා මානවයා හා පරිසරය අතර පවතින සම්බන්ධතාව අවබෝධ කර ගැනීමට නොහැකි වේ. එම තත්ත්වය තුළ මානව ක්‍රියාකාරකම් තුළින් පරිසරය විනාශයට පත්වේ.

රටේ යම් තැනක දී සිදුවන සිදුවීමක් එසැණින් වාර්තා කිරීමට වර්තමානයේ තාක්ෂණය දියුණු තත්ත්වයක පවතී. වර්තමාන සමාජයේ පුවත් වාර්තාකරණය ආකාර කිහිපයකට අනුව සිදුවේ. එය විද්‍යුත් හා මුද්‍රිත වේ. විද්‍යුත් මාධ්‍ය මඟින් එසැණින් පුවත් වාර්තා කිරීමේ හැකියාව පවතින අතර මුද්‍රිත මාධ්‍යයට එසේ හැකියාවක් නොමැත. මුද්‍රිත මාධ්‍යය මඟින් තොරතුරු හා පුවත් ඉදිරිපත් කිරීමේ දී යම්කිසි ප්‍රමාදයක්වූවත් විස්තරාත්මකව හා කාලයක් එම තොරතුරු හා පුවත් මූලාශ්‍ර වශයෙන් ළඟ තබා ගැනීමේ හැකියාව පවතී. විශේෂයෙන් ම ග්‍රාහකයාට අවශ්‍ය වේලාවට නිදහසේ පුවත් කියවීමේ හැකියාව පවතියි. එසේම මුද්‍රිත මාධ්‍ය

මඟින් වාර්තා කරනු ලබන පුවත් හා තොරතුරු පළවීමට යම් කාලයක් ගත වන හෙයින් විශ්වාසවන්තව හා විස්තරාත්මකව පුවත් ඉදිරිපත් කිරීමේ හැකියාව හිමි වේ.

මුද්‍රිත මාධ්‍ය මඟින් විවිධ තේමාවන් යටතේ පුවත් ඉදිරිපත් කරනු ලබන අතර මෙම ග්‍රන්ථය තුළ විශ්ලේෂණයට ලක් කර තිබෙනුයේ ළමයින් හා පරිසරය ආශ්‍රිතව පළ වූ පුවත් සම්බන්ධව ය. ළමයින් හා පරිසරය සම්බන්ධව විවිධාකාරයේ පුවත් වාර්තා වන අතර මෙම පුවත් මනෝ සමාජ පැතිකඩකින් විග්‍රහයට ලක් කිරීමට හැකිය. මෙම විශ්ලේෂණාත්මක වාර්තාව තුළින් උත්සාහ දරා තිබෙනුයේ පුවත්පත් හි පළ වූ ළමයින් හා පරිසරය සම්බන්ධ පුවත් විශ්ලේෂණාත්මකව විග්‍රහයට ලක් කිරීමය.

පුවත්පත් හි ළමුන් සම්බන්ධව පළ වූ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී වැඩි වශයෙන් වාර්තා වී තිබෙනුයේ  ළමා අපරාධ සම්බන්ධයෙන් ය. ළමා අපරාධයක් වශයෙන් හඳුන්වනු ලබන්නේ සමාජ සම්ප්‍රදාය විසින් ඉදිරිපත් කර ඇති හා සමාජ සම්මතයන් විසින් ගොඩනඟා ගත්තා වූ ඇගයුම් හා ධර්මතාවයන් ඉක්මවා යමින් ඊට වෙනස් ආකාරයකින් ළමයාට කායිකව හා මානසිකව පීඩාකාරී අයුරින් හා හිංසාකාරී අයුරින් සැලකීමක් වශයෙන් අර්ථ දැක්විය හැකිය. ළමුන් විවිධ ආකාරයන්ට හිංසනයන්ට පත් වේ. එහෙයින් ළමා අපරාධයක් සිදුවීම කෙරෙහි බලපානු ලබන සාධක කවරේ ද යන්න විමසා බැලීම කාලෝචිත වේ. ළමා අපරාධයක් සිදුවීම කෙරෙහි සමාජ ආර්ථික සාධකයන් බලපානු ලබයි. ආර්ථික සාධකය මුල්කර ගනිමින් ලෝකය භෞතික අංශයෙන් ඉදිරියට ගමන් කරනු ලබන ආකාරය වර්තමානයේ දැක ගැනීමට හැකියාව ඇත. ආර්ථික සාධකය මුල්කර ගනිමින් සංවර්ධනයක් ලොව තුළ ඇති වන විට එම ආර්ථිකයෙන්ම මානව සමාජයේ කොටසක් පහසුකම් භුක්ති විඳින අතර තවත් කොටසක් දුගීබවින් පීඩාවට ලක් වේ. මෙම තත්ත්වයන් ද්විත්වයම හේතුවෙන් සමාජය තුළ ළමා අපරාධයක්  සිදුවීමේ ඉඩකඩ පවතී.

ළමා අපරාධ සඳහා බලපාන සාධකයක්වනුයේ ළමුන්ට නිසි රැකවරණය නොමැතිකම ය. විස්තෘත පවුල් ක්‍රමයක් තුළ ළමුන්ට නිසි ආරක්ෂාවක් හිමි වුව ද, වර්තමානයේ පවතින න්‍යෂ්ටික පවුල් ක්‍රමය නිසා ළමුන්ට ලැබෙන ආරක්ෂාව හීන වී ගොස් ඇත. තව ද මව හා පියා දෙදෙනාම රැකියාවල නියුක්තවීම හේතුවෙන්

ළමුන්ගේ ආරක්ෂාව අවදානම් තත්ත්වයකට පත්ව තිබේ. ළමයාට මනා ආරක්ෂාවක් නොමැති විට විවිධ පුද්ගලයන් විසින් විවිධාකාරයෙන් ළමුන් අපචාරයන්ට ලක් කරනු ලබයි. එහෙයින් ළමුන්ට මනා ආරක්ෂාවක් ලබා දීමට වැඩිහිටියන් වගබලා ගත යුතු වේ. ළමයාගේ ශාරීරික සෞඛ්‍යයට සහ වර්ධනයට හානි ගෙන දෙන ලෙස ළමයා වේදනාවට ලක් කරන ක්‍රියාවන් කිරීම මෙන්ම ළමයාගේ යහපත වෙනුවෙන් කළ හැකි දේවල් පැහැර හැරීම ළමා අපරාධ වේ. කායික හා මානසික වශයෙන් පරිණත නොවූ ළමයාගේ සියලු ශක්තීන් වැරදි ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනීම ද ළමා අපරාධ ක්‍රියාවක් වේ. ළමයා යනු අනාගතය භාර ගැනීමට සිටින පුරවැසියෝ වශයෙන් හඳුන්වාදිය හැකිය. මේ නිසා ඔවුන්ට නිසි වැඩීමක් සඳහා නිසි රැකවරණය, නිසි පෝෂණය, නිසි සෞඛ්‍ය පහසුකම්, විවේකය, හා විනෝදය යන ආදිය ලබා දීම සමාජයේ වගකීම වේ.

මිනිසාගේ අවධානය පරිසරය කෙරෙහි  යොමු නොවන විට පරිසරය තුළ සිදුවන වෙනස්වීම්, පරිසර විනාශයන් හා මානවයා හා පරිසරය අතර පවතින සම්බන්ධතාව අවබෝධ කර ගැනීමට නොහැකි වේ. එම තත්ත්වය තුළ මානව ක්‍රියාකාරකම් තුළින් පරිසරය විනාශයට පත්වේ. මානව ක්‍රියාකාරකම්වලින් ඍජුව හෝ වක්‍රව පරිසරය විනාශයට පත්වේ. පරිසර විනාශය මඟින් සිදුවන අහිතකර ප්‍රතිඵලයන් උපනූපන් මානවයාට භුක්ති විඳීමට සිදුවේ. පරිසරය ක්ෂය සම්පතක් වන හෙයින් පරිසරය නවීකරණය කොට නිර්මාණය කිරීමට නොහැකිය. පරිසරය නව්‍යකරණයක් නොවන හෙයින් පවතින සම්පත්වලින් මානව අවශ්‍යතා පූරණය කරනු ලැබුව ද, වර්තමාන මානව අවශ්‍යතා පූරණය කිරීමට පවතින පාරිසරික සම්පත් ප්‍රමාණවත් නොවේ. මානව අවශ්‍යතා උදෙසා පරිසරය සංරක්ෂණය කළ යුතුය. මානව සත්ත්වයන් අවබෝධ කරගත යුතු කරුණක් වනුයේ වර්තමාන අවශ්‍යතා උදෙසා පරිසරය පරිභෝජනය කරමින් අනාගත පරම්පරාවේ පරිභෝජන අවශ්‍යතා උදෙසා පරිසරය සංරක්ෂණය කළ යුතු බවයි.

අතීතයට සාපේක්ෂව වර්තමානයේ පරිසර විනාශයන් බහුලය. පරිසර විනාශය ත් සමඟ විවිධ පාරිසරික ගැටළු නිර්මාණය විය. මෙම පාරිසරික ගැටළු දෙස විවිධ න්‍යාය, පර්යාලෝක ඔස්සේ විමර්ශනය කිරීම සිදු විය. කාර්මික විප්ලවයෙන් පසුව පරිසරයට සිදු වූ විනාශය, පරිසර හානිය අති විශාල ය. සමාජයීය විද්‍යාවන්ගේ ද,

ස්වාභාවික විද්‍යාවන්ගේ ද විවිධ කතිකාවත් ගොඩනගන පාර්ශවයන් අතර පාරිසරික ගැටළු පිළිබඳව අවධානය යොමු විය. එවැනි පසුබිමක් තුළ පරිසරය මූලික කරගත් විවිධ විද්‍යාත්මක දැනුම් කේන්ද්‍රයන් ගොඩනැගෙන්නට විය. සමාජ විද්‍යාව, මානව විද්‍යාව යන විෂයයන් පරිසරය කෙරෙහි අවධානය යොමු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාරිසරික සමාජ විද්‍යාව, පාරිසරික මානව විද්‍යාව ආදි විෂය ධාරාවන් නිර්මාණය විය. මෙම විෂයයන් තුළින් මානවයා හා පරිසරය අතර ත්, සමාජය හා පරිසරය අතර ත්, පවතින අන්තර් සම්බන්ධතාවයන් අධ්‍යයනය කරන්නට විය. මානවයා පරිසරයෙන් ව්‍යුක්ත කිරීමට නොහැකිය. මානවයා පරිසරයේ කොටසක් වශයෙන් හැඳින්විය හැකිය.

මෙම විශ්ලේෂණාත්මක වාර්තාව තුළින් පරිසරය හා ළමයින් සම්බන්ධව නව මතවාදයන් සමාජය තුළ ගොඩනැගීම හා ළමයින් සම්බන්ධ ගැටලු හා පරිසරය සම්බන්ධ ගැටලු අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මෙම අධ්‍යයන වාර්තාව මහඟු පිටුවහලක් වේ.

## 1.2 අධ්‍යයනයේ අරමුණු

- ළමයින් සම්බන්ධව හා පරිසරය සම්බන්ධව පුවත්පත් වාර්තාකරණයේ ස්වභාවය හඳුනාගැනීම
- ළමයින් හා පරිසරය සම්බන්ධයෙන් වාර්තාවන පුවත් ප්‍රභේදයන් වර්ගීකරණය කර හඳුනාගැනීම
- ළමා අපරාධ මෙන් ම පරිසර ගැටළු කෙරෙහි බලපාන සාධකයන් පිළිබඳ පුවත්පත් හි අනාවරණය හඳුනාගැනීම
- ළමා අපරාධ අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා පරිසර ගැටළු අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හා නව ප්‍රතිපත්තීන් පිළිබඳව පුවත්පත් වාර්තාකරණයේ ස්වභාවය හඳුනාගැනීම

### 1.3 අධ්‍යයන ක්‍රමවේදය

- දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් වන දිවයින හා ලංකාදීප යන දිනපතා පුවත්පත් ද්විත්වය මූලික කර ගනිමින් 2017 මාර්තු මාසය තුළ ප්‍රකාශයට පත් වූ පුවත්පත් අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබේ. විශේෂයෙන් ම මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත මත පදනම් වී අධ්‍යයනය කරනු ලැබේ.

ප්‍රාථමික දත්තවලට අමතරව ද්විතයීක දත්ත එක්රැස් කිරීමක් ද සිදුවේ. ඒ යටතේ උක්ත අධ්‍යයනය සම්බන්ධයෙන් ලියවී ඇති පර්යේෂණ වාර්තා පුවත්පත් හා ප්‍රකාශන, පොත්පත් හා අන්තර්ජාලය තුළින් ලබා ගත් තොරතුරු උපයෝගී කර ගනු ලැබේ.

- නියැදිය තෝරා ගැනීම

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් වන දිවයින හා ලංකාදිප යන පුවත්පත් ද්විත්වය මූලික කර ගනිමින් 2017 මාර්තු මාසය තුළ ප්‍රකාශයට පත් වූ පුවත්පත් අධ්‍යයනය සඳහා යොදා ගනු ලබයි. එම පුවත්පත් හි පළ වන ළමුන් හා පරිසරය යන තේමාවන් ද්විත්වය යටතේ වන පුවත් විශ්ලේෂණයට යොදා ගන්නට විය.

| **පුවත්පත් නාමය** | **පුවත් පත් සංඛ්‍යාව** |
|---|---|
| දිවයින | 25 |
| ලංකාදීප | 25 |
| මුළු පුවත්පත් එකතුව | 50 |

### 1.4 අධ්‍යයන දුෂ්කරතා, සීමාකම් හා අත්දැකීම්

මෙම අධ්‍යයනයට අදාළ තොරතුරු ලබා ගැනීමේ දී විවිධ අත්දැකීම්, දුෂ්කරතා හා සීමාකම්වලට මුහුණදීමට සිදුවිය. එකී දුෂ්කරතා හා සීමාකම් වඩා හරවත් සපයා ගැනීමකට පත් කරවා ගනිමින් දුෂ්කරතා හා සීමාකම් අවම කරගනිමින් අධ්‍යයනය සාර්ථකව සිදු කරන ලදී. අධ්‍යයනය අතරතුර මුහුණ දුන් දුෂ්කරතාවයවනුයේ ප්‍රාථමික දත්තයන් සපයා ගැනීම ය. අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කර ගැනීම මූලික ව ප්‍රවෘත්ති පත්‍ර ආශ්‍රයෙන් සිදු කරන ලද නිසා එහි අදාළ තොරතුරු සෙවීමට පුවත්පත් ඒකරාශි කර ගනිමින් ගොනුවක් සාදා ගැනීමේ අවශ්‍යතාවය මතු විය. ඒ අනුව දිනපතා සිංහල පුවත්පත් වන දිවයින හා ලංකාදීප යන පුවත්පත් අධ්‍යයනය සඳහා පාදක කරගන්නා ලදී. අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට පැවතියේ සීමිත කාලයක් වන හෙයින් අධ්‍යයනය සඳහා 2017 වර්ෂයේ මාර්තු මාසයේ පළ වන පුවත්පත් පමණක් යොදා ගන්නට විය. මාර්තු මාසයේ දිවයින හා ලංකාදීප යන පුවත්පත් අධ්‍යයනය සඳහා අඛණ්ඩව දිනපතා රැස්කර ගැනීමෙන් අනතුරුව අවසන් පුවත්පත් ගොනුවක් සකස් කර ගන්නා ලදී. අඛණ්ඩව පුවත්පත් පරිශීලනය කිරීම ඔස්සේ දෛනික පුවත් වාර්තා කිරීම් පිළිබඳව අවබෝධයක් හිමි විය.

පුවත්පත් පරිශීලනය කරමින් සකස් කර ගන්නා ලද අවසන් පුවත්පත් ගොනුව පරිශීලනය කරමින් අධ්‍යයන තේමා ද්විත්වයට අනුව පුවත් ගොනු කර ගන්නා ලදී. අධ්‍යයනයේ තේමා ද්විත්වයට අනුව ද්විතීයික දත්ත රැස් කරගනිමින් අධ්‍යයනයේ විෂයාත්මක බව සංවර්ධනය කරන ලදී. එහිදී ද්විතියික දත්ත සම්පාදනය කිරීම සඳහා පුස්තකාල පරිහරණය කිරීමේ දී අභියෝගයන්ට හා විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නට විය.

### 1.5 පරිච්ඡේදකරණය

මෙම අධ්‍යයන වාර්තාව ප්‍රධාන පරිච්ඡේද හතරකින් සමන්විත වේ. පළමු පරිච්ඡේදය මඟින් අධ්‍යයනය ක්‍රියාත්මක වීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ඇත. පළමු පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කර ඇත්තේ අධ්‍යයනයේ පසුබිම,

අධ්‍යයනයේ අරමුණු, අධ්‍යයන ක්‍රමවේදය, අධ්‍යයන දුෂ්කරතා, සීමාකම්, අත්දැකීම් හා අධ්‍යයනයේ පරිච්ඡේද විකාශය වී තිබෙන ආකාරය පිළිබඳව සාකච්ඡා කර ඇත.

දෙවන පරිච්ඡේදය මඟින් විග්‍රහයට ලක් කර තිබෙනුයේ අධ්‍යයන ප්‍රස්තුතයට අදාළ සංකල්ප නිර්වචනය කිරීම ය. එහිදි ද්විතීයික දත්ත හා සාහිත්‍ය පරිශීලනය පාදක කරගනිමින් සංකල්ප නිර්වචනය සිදු කර ඇත. පුවත්පත් පිළිබඳ අර්ථකතනය හා එහි ඉතිහාසය පිළිබඳව ත්, ළමයා හා පරිසරය යන සංකල්පයන් පිළිබඳව මුලික වශයෙන් දෙවන පරිච්ඡේදය මඟින් විග්‍රහයට ලක් කර ඇත.

තෙවන පරිච්ඡේදය මඟින් අධ්‍යයන අරමුණුවලට අනුව රැස්කර ගත් දත්තයන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව විශ්ලේෂණයට ලක් කර ඇත. අධ්‍යයන නියැදියට අනුව තෝරාගත් පුවත්පත් ද්විත්වයෙහි ළමයින් හා පරිසරය සම්බන්ධව වාර්තාවී ඇති පුවත් විශ්ලේෂණයට ලක් කර ඇත.

සිව්වන පරිච්ඡේදය මඟින් සමස්ත අධ්‍යයනය පිළිබඳව ඉදිරිපත් කරනු ලබන සමාලෝචනය හා අධ්‍යයන දත්ත හා තොරතුරු මඟින් එළඹිය හැකි නිගමන හා යෝජනා සාකච්ඡාවට ලක් කර ඇත.

# දෙවන පරිච්ඡේදය
# සංකල්ප නිර්වචනය

**හැඳින්වීම**

## 2.1 පුවත්පත් පිළිබඳ අර්ථකතනය

ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය යටත්විජිත සමයේ සිදු වු අතර, මුද්‍රණ ශිල්පය ආරම්භවීම කෙරෙහි අධ්‍යයන ක්‍රමය බලපෑම් කරන ලදි. ශ්‍රී ලංකාවේ පැවති අධ්‍යාපන ක්‍රමය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී මුද්‍රණ ශිල්පයේ අවශ්‍යතාවයක් නොවීය. මන්ද මුලකාලීන අධ්‍යාපන ක්‍රමය සඳහා යොදා ගනු ලැබුයේ ''වැලිපිල්ලය''. අතීතයේ දී වැලිපිල්ලේ ලියා පසුව පුස්කොළ පොතක ලිවීම පමණක් සිදු වූ අතර සාම්ප්‍රදායික ලේඛනකරණය අතික්‍රමණය කරමින් එවකට පැවති අධ්‍යාපන ක්‍රමය සඳහා කඩදාසි භාවිතා කිරීමට සිදු විය. ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ආරම්භවූයේ පෘතුග්‍රීසි සමයේ වන අතර ලන්දේසි ක්‍රමය මඟින් ක්‍රිස්තියානි දේවස්ථානය මූලික කර ගනිමින් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වන්නට විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආගමික ග්‍රන්ථ මුද්‍රණයවීම සිදුවිය. ආරම්භක යුගයේ මුද්‍රණාලයන් මඟින් ආගමික ග්‍රන්ථ මුද්‍රණය වීම සිදු විය. ආරම්භක යුගයේ මුද්‍රණාලයන් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබෙන්නට වූ අතර, පෞද්ගලික මුද්‍රණාල නොවීය. පෞද්ගලික මුද්‍රණාලයන් ආරම්භවනුයේ 1900 ගණන්වලදීය.

මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 1802 දි ප්‍රකාශයට පත් කළ ගැසට් පත්‍රය පුවත්පත් මාධ්‍යයේ ආරම්භක සන්ධිස්ථානය ලෙස ප්‍රකාශයට පත් විය. ආරම්භක ගැසට් පත්‍රය තුළ ගැසට් පත්‍රයක අරමුණින් ඉවත් ව පුවත් පළ කිරීම සිදුවිය. පසුකාලීනව ගැසට් පත්‍රය තුළ රාජ්‍ය පණිවුඩ පමණක් ඉතිරි කර සෙසු විශේෂාංග ඉන් ඉවත් කරනු ලැබූ අතර එහි ප්‍රතිඵලයවූයේ 1832 දී Colombo Journal පුවත්පත ප්‍රකාශයට පත්වීමය. මෙලෙසින් පුවත්පත් මාධ්‍ය ආරම්භ වූ අතර මෙම පුවත් මාධ්‍ය වර්ධනයට ආගමික, ආධ්‍යාපනික, දේශපාලනික සංස්ථාවන්ගේ බලපෑම සෘජු ලෙස බලපාන ලදී. විශේෂයෙන් ම මිෂනාරි ආගමික මතවාද හා බ්‍රිතාන්‍ය

රාජ්‍ය බලය ලංකාව තුළ ව්‍යාප්ත කිරීමේ අටියෙන් පුවත්පත් රැසක් බිහි විය. 1864 අරුණෝදය, 1866 ඥානාර්ත ප්‍රදීපය, 1867 සත්‍ය මාර්ග ආදි පුවත් පත් ප්‍රකාශයට පත් විය. මේවන විට පුවත් මාධ්‍ය ජනතාවට පුවත් සපයන ප්‍රබල මාධ්‍යයක් ලෙස හඳුනාගත හැකිය.

පුවත්පත් කලාවේ අධ්‍යයතනයට සාපේක්ෂව 1800-1900 යුගය වැදගත් යුගයකි. විශේෂයෙන් ම මෙම යුගයේ දී පුවත්පත් ප්‍රකාශනය තුළ යම් තරඟකාරී රටාවක් යටතේ පුවත් ප්‍රකාශනය සිදු වූ බව වටහා ගත හැකිය. මේ බව 1880 දෙසැම්බර් 03 වන දින පළ වු සරසවි සඳරැස පුවත්පත ප්‍රකාශයට පත් වු අරමුණ පහත සඳහන් කවි ශීර්ෂ පාඨයන්ගෙන් අවබෝධ කරගැනීමට හැකිය.

| | |
|---|---|
| සරණෙට එකළෙසා නොම හැකිල නෙක | දෙසා |
| නරඟන වැඩ නිසා සුවපතන නොව | ලසා |
| පෙර පඬිසෙට වසා කර ඇසුරු තතු | ලෙසා |
| සරසවි සඳරැසා පළ කරනු මන | තොසා |

කෙසේ නමුත් 1900න් පසුව ලංකා පුවත්පත් කලාවේ කැපී පෙනෙන හා වේගවත් දියුණුවක් ඇති විය. මෙයට හේතුව විවිධ භාෂාවන්ගෙන්, විවිධ අරමුණු, අවශ්‍යතා පෙරදැරි කොටගත් විවිධ පුද්ගලයන්, ආයතන, සංවිධාන විසින් පුවත්පත් මාලාවක් ආරම්භ කරන ලදී. විශේෂයෙන් ම ලාභය පරමාර්ථය කර ගෙන ද පුවත්පත් බිහි වීම ආරම්භ විය. 77 විවෘත ආර්ථිකය සමඟින් විවිධ විෂයානුබද්ධ පුවත්පත් බිහි වීම ආරම්භ විය. 1980 වන විට පුවත්පත් කලාවට පෞද්ගලික අංශයේ ප්‍රබල දායකත්වයක් ලැබෙන්නට විය. විශේෂයෙන්  ම උපාලි පුවත්පත් සමාගම, විජය පුවත්පත් සමාගම, මෙහිලා ඉතා වැදගත්ය. 90 දශකයේ පුවත්පත් ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයතනික සංයුතිය යටතේ හා පෞද්ගලික ආයතන සංයුතියේ සිට පුවත්පත් ප්‍රකාශයට පත් විය. රජයේ පුවත්පත් ලේක් හවුස් ආයතනයෙන් ප්‍රකාශයට පත් වේ.

## 2.2 ළමයා පිළිබඳ අර්ථකතනය

1989 නොවැම්බර් 20 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ සමුළුව විසින් ''ළමයින්ගේ අයිතීන් පිළිබඳ ප්‍රඥාප්තියේ'' (Convention of the rights of the child) සකස් කොට එළි දක්වා ඇත. එහි පළමුවන වගන්තියේ දරුවා යන්න අර්ථ දක්වා ඇත්තේ මෙසේ ය. '' ඒ ඒ රටෙහි නීතිය විසින් දරුවකු වයෝපූර්ණභාවයට පත්වීමේ පූර්ව වයස් සීමාවක් නියම කර ඇත්තේ නම් මිස, අවුරුදු දහඅටකට (18) අඩු සෑම පුද්ගලයෙකු ම දරුවකු ලෙස සැළකේ''. ශ්‍රී ලංකාවේ ''දරුවන් හා තරුණයන්'' පිළිබඳ ආඥා පනතේ දැක්වෙන පරිදි, දරුවෙකු නැතහොත් ළමයෙකු සේ පිළිගැනෙන්නේ අවුරුදු 14ට අඩු අයකු බව සඳහන් වේ. එයට අනුව තරුණයෙකු ලෙස සැලකෙන්නේ වයස අවුරුදු 14 ට වැඩි හා 16 ට අඩු අයෙකි. 1956 අංක 48 දරණ ළමයින් සහ තරුණයන් පිළිබඳ ආඥා පනතෙහි ද සමාන අර්ථ දැක්වීමක් දැකිය හැක.

ඒ අනුව අප රටේ නීතිය අනුව දරුවකු නැතහොත් ළමයෙකු ලෙස පිළිගැනෙන්නේ වයස අවුරුදු දාහතරට (14) අඩු පුද්ගලයන් ය. අපේ නීති පද්ධතිය විසින් දරුවෙකු වෙන් කර ගනු ලබන මූලිකම මානය වයස් සීමාවය. දරුවන්ගේ මනසට දැරිය හැකි ශක්තිය අනුව ද, නීතිය විසින් ඉහත මානය නම්‍යශීලිව සලකා බැලෙනු ඇත. දණ්ඩ නීති සංග්‍රහයේ 75 වන වගන්තියට අනුව වයස අවුරුදු අටකට අඩු පුද්ගලයෙකු (ළමයකු) විසින් කරන කිසිවක් වරදක්සේ නොසැලකේ. එම සංග්‍රහයේම 76 වන වගන්ති ප්‍රකාරව අවුරුදු අටට වැඩි නමුත් අවුරුදු 12 ට අඩු ළමයකු ද තමා විසින් කරනු ලබන ක්‍රියාවේ ස්වභාවය හෝ ප්‍රතිඵලය අවබෝධ කර ගැනීමට තරම් වැඩී නැති අවස්ථාවක ඉහත තත්ත්වයෙහිලා සැලකෙන බව සඳහන්ව ඇත (අබේසේකර සහ වීරක්කොඩි, 1993: 81).

ළමයා පිළිබඳව අර්ථ නිරූපණය සඳහා ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ අර්ථකතනය ද වැදගත් වේ. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට අනුව Child යන්න අර්ථ දක්වා ඇත්තේ Young human being below the age of puberty, unborn or newborn human being, one's son or daughter" (Oxford dictionary, 1992, page 141 ) යනුවෙනි. ඒ අනුව ''ළමයා යනු දරුවා, නූපන් හෝ අලුත උපන් දරුවා, පුතා හෝ දුව, පැවත එන්නා, ළාමක පුද්ගලයා'' වේ.

### 2.3 ළමයා හා ළමා අපරාධ පිළිබඳව සමාජ විද්‍යාත්මක විශ්ලේෂණය

ළමා අපරාධ පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට ප්‍රථමව අපරාධ යනු කුමක්දැයි අර්ථකතනය කර ගැනීම ඉතා වැදගත් වේ. එයට හේතු වනුයේ බාලාපරාධ, අපරාධවල එක් කොටසක් වන හෙයිනි. අපරාධ සම්බන්ධව සමාජ විද්‍යාත්මක දෘෂ්ඨී කෝණයකින් අවධානය යොමු කිරීමේදී එය සමාජමය හා නීතිමය සංසිද්ධියක් ලෙස හඳුනාගත හැකිය. මෙහිදී සමාජ අර්ථකතනය ආගමික, සංස්කෘතික පැතිකඩකින් අලිඛිතව හෝ ලිඛිතව සිදු කරනු ලබයි. අපරාධයක් නීතිය තුළ අර්ථකතනය කරනු ලබන ආකාරය විමසා බැලීම ඉතා වැදගත්ය. එයට හේතුවනුයේ අපරාධ නැමැති සංසිද්ධිය නීතිමය වශයෙන් ද සම්බන්ධ වන නිසා ය. අපරාධ නීතියේ හා නීති ශාස්ත්‍රයේ නිර්වචනය වී තිබෙන්නේ, "නීතියෙන් සුවිශේෂීව තහනමට ලක් කොට ඇති යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමකි" (එදිරිවීර , 2011: පිටු අංක 12). මෙම නිර්වචනය ට අනුව ඊට දඬුවමක් ද අයත් වන බව නිර්වචනය වේ. සර් ජේම්ස් ස්ටෙපන් ඔහුගේ අපරාධ නීතියේ ඉතිහාසය (1883) කෘතියේ සඳහන් කර ඇත්තේ අපරාධයකට දඬුවම්දීමේ දී ඔහුගේ වයස, මානසික තත්ත්වය අවධානයට ලක් කළ යුතු බවයි. ඩී.ආර්. ටැප්ට් (D.R. Taft) පෙන්වා දෙන්නේ සමාජ සම්මත නීති කැඩීම පෙරලා සමාජයටම අහිතකර ආකාරයෙන් බලපාන බැවින් එම සමාජ විරෝධී චර්යාව අපරාධ ලෙස නීතිය විසින් සළකනු ලබයි.

අපරාධ සමාජ සංවිධානයට වැදගත් වන්නක් ලෙස සලකනු ලබන්නේ එයින් සමාජයට ඉටුවන කාර්යභාරයන් කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙන්නන් විසිනි. අපරාධ සමාජ සංවිධානයට එරෙහිව යන්නක් බව බොහෝ සමාජ විද්‍යාඥයින් හා අපරාධ විද්‍යාඥයින්ගේ මතයයි. අපරාධ සමාජ සංවිධානය තුළ තිබිය යුතු බව එමිල් ඩුර්කයිම් හා ඔහුගේ අනුගාමිකයන් පිළිගනී. ඩුර්කයිම් අපරාධ නිර්වචනය කරනු ලබන්නේ ''අපරාධ යනු සමාජමය සංසිද්ධියක් හා මානව ක්‍රියාවක් ලෙසය. අපරාධ සාමාන්‍ය මෙන්ම කෘත්‍යාත්මකව ද වැදගත් වන්නේය. මෙයින් සම්පූර්ණයෙන් ම ගැලවීමට සමත් සමාජයක් නොමැත. එසේ ම නිදහස වෙනුවෙන් අප විසින් ගෙවනු ලබන මිලක් ලෙස අපරාධ හැඳින්විය හැකිය" (එදිරිවීර, 2011 : පිටු අංක 89). ඩුර්කයිම් අපරාධ විග්‍රහයට අනෝමීය තත්ත්වය නැමැති සංකල්පය ඉදිරිපත් කරයි. සමාජයේ ධර්මතා රහිතවීම අනෝමීය

තත්ත්වයයි. එවැනි තත්ත්වයක දී පුද්ගලයා අපරාධ හා එවැනි සමාජ අපචාරයන්ට සම්බන්ධ වෙති. කෘත්‍යවාදීන් පෙන්වා දී තිබෙනුයේ අපරාධ සමාජ වෙනස්වීමට හේතු වී තිබෙන බවයි. වර්තමානයේ අපරාධයක් ලෙස සලකනු ලබන ක්‍රියාවක් යම් කාල පරිච්ඡේදයක දී සාමාන්‍ය ක්‍රියාවක් බවට පත්විය හැකිය. එවැනි අවස්ථා ඕනෑම සමාජයක දක්‍ක ගත හැකිය. උදාහරණයක් වශයෙන් ගතහොත් 1969 වර්ෂයේ බ්‍රිතාන්‍යයේ සමලිංගික සේවනය සාපරාධී අපරාධයක්වුවත් වර්තමානයේ සාපරාධී තත්ත්වයට පත් නොවේ. එය ලිහිල් සාමාන්‍ය ක්‍රියාවක් බවට පත්ව තිබේ. කෘත්‍යවාදීන් පෙන්වා දෙන්නේ සමාජය තුළ යම් ආකාරයකට අපරාධ තිබිය යුතු බවයි. ඒ තුළින් සමාජය තුළ සාමුහික විඥාණයක් ගොඩනැගෙන බව කෘත්‍යවාදීන්ගේ අදහසයි. රොබට් කේ. මර්ටන් පවසනුයේ අපරාධ යම් සමාජයක සංස්කෘතිය හා සමාජ ව්‍යුහය තුළින් ගොඩනැගෙන්නා වූ එහිම ප්‍රතිඵලයක් ලෙස සිදුවන බවය. එය සමාජයේ සෑම සාමාජිකයෙකු විසින්ම ගොඩනගා ගනු ලබන සමාජ සාරධර්ම සහ එම සාරධර්ම තුළින් ගොඩනැගෙන සාරධර්ම සම්මුතියන්ගේ ප්‍රතිඵලයකි. බොහෝවිට මෙවැනි අවස්ථාවන් තුළ සමාජ සාරධර්ම බිඳ වැටීමට හේතු වේ. එවිට එහි දකින්නට ලැබෙන්නේ අනෝමීය තත්ත්වයක් බව මර්ටන්ගේ අදහසයි. ජී. අනෙසොව් නමැති නව මාක්ස්වාදී අපරාධ විද්‍යාඥයාගේ අපරාධ විද්‍යාවේ මූලධර්ම කෘතියේ අපරාධයක් යන්නට නව අර්ථකතනයක් ලබාදෙයි. අපරාධයක් යනු ''මිනිසා ක්‍රියා කරන ජීවත්වන යථාර්ථවාදී ලෝකය තුළ නිදහසේ ගොඩනැගෙන්නක් නොව, එය සමාජමය තත්ත්වයක් බවත් මිනිසා අපරාධ සිදුකරන බවත් අනෙසොව් පවසයි (හෙට්ටිගේ, 2011: 72)

මාක්ස්වාදී අපරාධ විද්‍යාඥයකු වන විලියම් චැම්බ්ලිස් අපරාධයක් යනු කුමක්දැයි අර්ථකතනය කරනු ලබන්නේ ඉහත අර්ථකථනයන් සියල්ලටම වඩා වෙනස් ආකාරයකටය. ඔහු පවසන්නේ ධනේශ්වර සමාජ ක්‍රමය තුළ අපරාධ බහුලව සිදුවෙන බවයි. එයට හේතුවන්නේ ධනේෂ්වර පංතිය ලාභ උපරිම කරණයට කටයුතු කිරීම බව විලියම් ප්‍රකාශ කර සිටී. ධනේෂ්වර අධිකාරීත්වය කම්කරුවන්ට ඉතාමත් අඩු වැටුප් ලබාදෙන අතර එයින් ධනේෂවරයන්ගේ අභිප්‍රාය සනාථ වේ. අඩු වැටුප් ගෙවීම හරහා නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමට ඔවුන්ට හැකියාව ලැබේ. ධනේෂ්වර සමාජයේ රැකියා විරහිත විශාල පිරිසක් මෙම ක්‍රියාවලියෙන් පීඩනයට පත්වේ. එහි අනිවාර්ය ප්‍රතිඵලය ලෙස තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අපරාධ සිදුවෙන බව විලියම්

චැම්බල්ස්ගේ අදහසයි (රත්නපාල, 2003: 32) ඊ. එච්. සදර්ලන්ඩ් ප්‍රකාශ කරනු ලබන්නේ අපරාධ හා බාලාපරාධ අනෙක් පුද්ගලයින් සමඟ ඇති කර ගනු ලබන අන්තර් ක්‍රියාවන් තුළින් ගොඩනගා ගනු ලබන ඉගෙනුම් ක්‍රියාවලියක් බවයි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් වැදගත් වී ඇත්තේ ප්‍රාථමික සමූහ වන පවුල් ඒකක සහ සම වයස් කණ්ඩායම්ය (රත්නපාල, 2003 ፡ 34).

ඉහත නිර්වචන සමූහය තුළින් අපරාධයක් යනු කුමක්දැයි අර්ථකතනය වන අතර ඒ සඳහා විවිධ මතයන් ඉදිරිපත් වී තිබේ.

ඉංග්‍රීසි භාෂාවේ Delinguency ලෙස හඳුන්වනුයේ බාලාපරාධයයි. එය ලතින් වචනයක් පාදක කොට සැකසුනකි. එයින් අර්ථ දෙකක් ගම්‍ය කරයි. එනම්,

i. නොසළකා හරින ලද
ii. සමාජය විසින් අනුමත කරන ලද පුද්ගලයාගෙන් අපේක්ෂිත චර්යාවන් පැහැර හැරීම.

ඉහත අර්ථ දෙක දෙස විචාර පූර්වකව බලන කළ, එය සමාජ කතිකාවතකට මඟ විවර කරනු ඇත. එනම්, වැරදි ක්‍රියාවක් යනු කුමක්දැයි එහි අර්ථපූරණය නොවේ. අනුමත කරන ලද පුද්ගල චර්යාව කුමක්දැයි එම අර්ථයන් තුළ අන්තර්ගත නොවේ. කේ. කරුණාතිලක පවසනුයේ බොරු කියන, හොරකම් කරන, මිනී මරණ, ගෙදරින් පලා යන, පාසල් නොයන ළමයින් අතීතයේ සිටම තම දෙමාපියන්ට මෙන්ම සමාජයට ද බලවත් කරදරයක් හා ගැටලුවක් වූ අතර අපරාධයේ තරාතිරම කුමක් වුවත් අපරාධය කරනු ලබන බාලයාට වැඩිහිටි අපාරධකරුවන්ට මෙන් සැළකීමට නුපුළුවන්වීම මෙම ගැටලුව තව තවත් දුෂ්කර කරන්නක් විය. බාලයා බොහෝවිට නොමේරූ අයෙකු නිසා අපරාධ කරනු ලබන ඔහු දෙස සමාජය බැලීමට පුරුදුව ඇත්තේ වැඩිහිටි අපරාධකරුවෙකු දෙස බලන ආකාරයෙන් නොවේ. බාලයකු නොමඟට ගමන් කිරීම හෝ ඔහු විසින් කරනු ලබන අපරාධවලට හේතු සොයා බලා පිළියම් යෙදීමෙන් ඔහු වැඩිහිටි අපරාධකරුවෙකු හෝ සමාජ විරෝධී පුද්ගලයෙකුවීමෙන් වළක්වා ගත හැකිය. (කරුණාතිලක, 1998, පිටු අංක 16).

අපරාධ විද්‍යාඥයන් විවිධාකාරයෙන් බාල අපරාධයක් යනු කුමක්දැයි අර්ථකතනය කරනු ලබයි. එම අර්ථකතනයන්ට විශේෂයෙන්ම ඔවුනගේ න්‍යායාත්මක දෘෂ්ඨීය බලපානු ලබයි. හිලී හා බ්‍රොනර් යන අපරාධ විද්‍යාඥයන් දෙපළ විසින් බාල අපරාධයක් යන්න අර්ථකතනය කරනු ලබන්නේ මෙසේය. ''බාලාපරාධයක් යනු වැරදි ක්‍රියාවක් කිරීම හෝ නපුරුකම්වල යෙදීමක් නොවේ. නමුත් බහුල වශයෙන් පවුල් සබඳතා ජාලය තුළ සුවිශේෂී හැඟීම් බිඳ වැටීමේ ප්‍රතිඵලයක් ලෙසින් ජනිත වන්නාවූ චර්යා රටාවයි. (කරුණාතිලක, පිටු අංක 40) මෙම නිර්වචනයට අනුව පැහැදිලි වන්නේ පවුල් ඒකකය තුළින් ඉටුකර ගත නොහැකි එහෙත් ඒ තුළ වර්ධනය වු යම් මානසික හැඟීමක් කඩවීම හේතුකොට ගනිමින් ඇතිවූ ඉච්ඡාභංගත්වය මත විවිධ වැරදි ක්‍රියාවන්හි, නපුරුකම්හි නිරත වීම බාලාපරාධ වශයෙන් හැඳින්විය හැකිය. ඇමරිකානු බාලාපරාධ කාර්යාංශ පාලන වර්තාවේ බාලාපරාධ යන්නට ලබාදෙන අර්ථකතනය වනුයේ තමන්ගේ සුභසාධනයට තර්ජනයක් ඇති කර ගැනීමට නැත්නම් අනිත් අයගේ වැඩ කටයුතුවලට බලපාන පරිදි සමාජ විරෝධි ලෙස හැසිරීම හෝ නගර සභාව විසින් හෝ රජය විසින් පනවන ලද නීතියෙන් වයසින් බාල අයෙකු විසින් උල්ලංඝනය කිරීම බාලාපරාධයකි. මෙම අර්ථකතනය තුළ සමාජමය පැතිකඩකට වඩා, නෛතිකමය අර්ථයක් ලබාදී ඇත. සමාජ සාරධර්ම, ඇගයුම් පද්ධතිය තුළ වැරදි යැයි සම්මත ක්‍රියාවක් නීතියෙන් වැරදි ක්‍රියාවක ලෙස අර්ථකතනය වී නොමැති නම් එය වැරැද්දක් හෝ බාලාපරාධයක් නොවේ. ඇමරිකානු බාලාපරාධ කාර්යාංශය විසින් බාලාපරාධයක් යන්නට පුළුල් නෛතික ආවරණයක් සිදුකර තිබේ. ඇමරිකානු විශ්වකෝෂයෙහි බාලාපරාධ යන්න නිර්වචනය කර ඇත. ලෝකයේ බොහෝ රටවල් එකඟ වන පරිදි එම රටවල් සතු අපරාධ නීතිය බාලයකු විසින් කඩ කිරීමත්, එසේම එය සමාජ විරෝධි ක්‍රියාවක්වීමත් බාලාපරාධයකි.

ඉහත නිර්වචනයන් දෙස අවධානය යොමු කර බලනවිට ඒවා එක් අංශයක් මුලික කරගෙන අර්ථකතනය කර තිබේ. එහෙත් එය යම් වෙනසකට භාජනය කරමින් රිචඩ් ඒ ක්ලොවාර්ඩ් සහ ලොයිඩ් ඊ ඔහිලින් යන අපරාධ විද්‍යාඥයින් දෙදෙනා බාලාපරාධ යන්නට නිර්වචනයක් එකතු කර තිබේ. බාලාපරාධ ක්‍රියාවක් ප්‍රධාන මූලිකාංග දෙකකට අනුව නිර්වචනය කළ හැකිය. එනම් සමාජයේ මුලික ධර්මතාවයන් කඩ කිරීමේ චර්යාවන්වීම සහ නිල වශයෙන් සාපරාධි යුක්තිය පිළිබඳ ආයතන මඟින් විනිශ්චය කර ඇති නීතිමය ධර්මතාවන් කඩ කිරීමයි.

(එදිරිවීර , 2011: 49) ඉහත නිර්වචනය තුළ සමාජ ධර්මතා, ඇගයුම් වලට අනුකූල චර්යා රටාවත්, නෛතික රාමුවට අනුකූල චර්යා රටාවත් යන දෙඅංශයම සැළකිල්ලට ගෙන බාලාපරාධයක් අර්ථකතනය කර ඇත.

ඉහත සඳහන් අර්ථකතනයන් තුළින් අපරාධයක් හා බාලාපරාධය යනු කුමක්දැයි පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකිය. බාලාපරාධය හා අපරාධය එකිනෙකට වෙනස් වන්නක් බව ඉහත නිර්වචනයන්ගෙන් හඳුනාගත හැකිය. එහෙත් බාලපරාධය හා අපරාධය එකිනෙකින් වෙනස් කර හඳුනාගැනීම සඳහා යොදා ගනු ලබන මූලික මිණුම් දණ්ඩ වන්නේ පුද්ගලයාගේ වයස් ව්‍යුහයයි. ලෝකයේ බොහෝ රටවල බාලාපරාධ හා සම්බන්ධ උපරිම වයස් සීමාව වශයෙන් සළකනු ලබන්නේ වයස අවුරුදු දහ අටය (18). එහෙත් යුරෝපීය රටවල්වල, බෙල්ජියම් මෙම වයස් සීමාව දහසය වේ (16). ස්වීඩනයේ එය විසි එකක් (21) වන අතර, ඇමරිකානු රාජ්‍ය නීති සංග්‍රහයේ එම වයස් සීමාව දහසයට (16) ද, පින්ලන්තයේ ද එය අවුරුදු වයස අවුරුදු දහසය (16) ලෙස සඳහන් කර ඇත. බාලාපරාධ හඳුනා ගන්නා අවම වයස් සීමාව ද සංකීර්ණ තත්ත්වයකි.

බාල අපරාධ සිදුවීම කෙරෙහි බලපාන සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලන හා පුද්ගල කරුණු කවරේ ද යන්න විවිධ අධ්‍යයනයන් දෙස් විදෙස් මට්ටමින් සිදුකර තිබෙන බව පර්යේෂණ නිබන්ධන, ග්‍රන්ථ, සඟරා හා ලිපි අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකිය. බාලාපරාධ පිළිබඳව ආනුභාවික අධ්‍යයනයක් කළ පළමු විද්‍යාඥයා ලෙස හඳුන්වන්නේ සිරිල් බර්ම් නම් විද්‍යාඥයාය. එම අධ්‍යයනය 1925 දී The Young Delinguent නමින් ප්‍රකාශයට පත්විය. ඔහු විසින් කරන ලද එම අධ්‍යයනයෙ දී බාලාපරාධයක් සිදුවිමට හෝ සිදුකිරීමට බලපාන බහුවිධ සාධක රාශියක් හඳුනා ගෙන ඇත. ඔහු විසින්ම එම බහුවිධ සාධකයන් අතරින් සාධක හතරක් ප්‍රධාන වශයෙන් ඉස්මතු කර තිබේ. එනම් ආවේණික, පාරිසරික, කායික හා මනෝ විද්‍යාත්මක යන සාධක හතරය (එදිරිවීර, 2011 : 112 - 115). සිරිල් බර්ම් විසින් ඉදිරිපත් කරන ලද ආවේණික යන සාධකය හා කායික යන සාධකය ප්‍රායෝගිකත්වයෙන් බැහැරට යන්නකි. ඔහු විසින් තෝරා ගත් නියැදියට අනුකූලව එම සාධකයන් නිවැරදිවීමට ඉඩ ඇත. එහෙත් එය නැවත නැවත සත්‍යක්ෂණය කිරීමට අපහසුය. යම් දරුවකුගේ කායික අංග ලක්‍ෂණ හෝ පවුලේ ආවේණික ලක්‍ෂණ මත සිදුනොවේ. ලංකාවේ බාලාපරාධ සඳහා රැඳවුම් කඳවුරු වල

නේවාසික දරුවන්ගේ කායික ලක්ෂණ සාමාන්‍ය බාලාපරාධ සඳහා රැඳවුම් කඳවුරු වල නේවාසික දරුවන්ගේ කායික ලක්ෂණ සාමාන්‍ය අපරාධයක් නොකළ, නොකරන දරුවකුට සමානය. ඔවුන්ගේ පවුල් වල පරම්පරාවම අපරාධ සිදුකළ අය නොවේ. ගාල්ල ළමා පුනරුත්ථාපන ආයතනයේ ළමයින්ගේ පවුල් විස්තර අන්තර්ගත ලේඛණ පරිශීලනයේදී මෙය මනාව ප්‍රත්‍යක්ෂ වේ (හෙට්ටිගේ, 2011 : පිටු අංක 69 - 70). පාරිසරික සාධක බාල අපරාධයක් සිදුවීම කෙරෙහි බලපාන්නට පුළුවන. විශේෂයෙන්ම නූතන ලංකාවේ ඇතැම් ප්‍රදේශවල නීති විරෝධි මත් ද්‍රව්‍ය වෙළඳාම සඳහා කුඩා දරුවන් යොදා ගනී. විශේෂයෙන්ම මෙම තත්ත්වය අනුරාධපුරය, ත්‍රිකුණාමලය ප්‍රදේශවල සිදුවන බව මාධ්‍යය විසින් අනාවරණය කරන ලදී. කුඩා දරුවන් මත්ලෝලීන් බවට පත්වීම කෙරෙහි බලපාන්නට වූයේ පාරිසරික සාධකයකි. එවැනි ආකාරයකට පාරිසරික සාධක නිසා සමාජය තුළ බාල අපරාධකරුවන් බිහිවේ. තවදුරටත් වීදි දරුවන් විවිධ අපරාධවලට යොදා ගන්නා වැඩිහිටියන් වේ. විශේෂයෙන්ම කුඩා දරුවන් යොදා ගෙන ''පික් පොකට්'' ගැසීම සිදු කරන ජාවාරම්කරුවන් පිටකොටුව ප්‍රදේශය වැනි ජනාකීර්ණ ප්‍රදේශවලදී අත්අඩංගුවට ගෙන තිබෙන බව පොලිස් වාර්තා අනාවරණය කරයි. මිරිහාන පොලිස් වාර්තා අංශයේ, උප පොලිස් පරීක්ෂක ඒ. හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රකාශයක් ඇසුරෙනි.)

සිරිල් බර්ට් පවසන ආකාරයට මනෝ විද්‍යාත්මක සාධක ද අපරාධයක් වීම කෙරෙහි බලපෑම් කිරීමට පුළුවන. මෙහි දී සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ ඉඩ්, ඊගෝ, සුපර් ඊගෝ විශ්ලේෂණය ඉතා වැදගත්ය. ෆ්‍රොයිඩ් පෙන්වා දෙන ආකාරයට සිත කොටස් තුනකින් යුක්ත වේ. ඉන් පළමුවැන්න ඉඩ් සංස්කාරයයි. ඉඩ් සංස්කාරය තුළ (සිතෙහි ස්වභාවය) දිග හැරෙනුයේ මිනිසාගේ ප්‍රාථමික අවශ්‍යතා පිළිබඳවය. මනුෂ්‍ය වර්ගයා ආරම්භ වූ අවදියේ දී මිනිසා තුළ මූලික අවශ්‍යතා වූ කුසගින්න, පිපාසය, චණ්ඩභාවය, ලිංගික අවශ්‍යතාවන් සහ නිදිමත යන ඒවා සපුරා ගන්නේ කෙසේ ද යන්න මෙම සංස්කාරය තුළින් සිදුවේ. මෙම සියලු අවශ්‍යතා සතුන් තුළද දක්නට ලැබෙන්නේය. ඉඩ් සංස්කාරයේ දී සිදුවනුයේ මිනිසා මෙම අසීමිත අවශ්‍යතා සඳහාම පමණක් පෙළඹීමය. මනෝ විද්‍යාඥ ෆ්‍රොයිඩ් පෙන්වා දෙන ආකාරයට ඊගෝ පද්ධතිය තුළ ඇත්තේ, ඒ ඒ සමාජ සංස්කෘතිය තුළින් මිනිසුන් ඉගෙන ගන්නා දෙයයි. හැසිරිය යුත්තේ කෙසේ ද? නොහැසිරිය යුත්තේ කෙසේද? යන්න මෙමඟින් හැඳින්වේ. චර්යාත්මක සංස්කෘතියේ ආරම්භය සනිටුහන් වන්නේ

එලෙසය. ඔබ මෙසේ කළ යුතුයි, මෙසේ නොකළ යුතුයි යන්නය. හොඳ නරක හඳුනා ගන්නේ එලෙසය. බොහෝ මිනිස්සු මෙම කාරණාව හොඳින්ම ඉගෙන ගනිති. එසේ ඉගෙන ගත් මිනිසුන්ට සමාජයට පොදු ලෙස ජීවත්වීම අසීරු වන්නේ නැත. නමුත් ඇතැම් පිරිසකට මෙම කරුණු මෙලෙසම ඉගෙනීමේ හැකියාවක් ඇත්තේ නැත. එනම් සමාජ ගතවීමේ හැකියාවක් ඇතමෙකුට නොමැතිවීමය. චර්යාත්මක හැසිරීම සමාජයට අනුගත නොවූ විට අපරාධ සිදු කරනු ලබයි.

සිග්මන් ෆ්‍රොයිඩ් සිතේ ස්වභාවය පිළිබඳව අධ්‍යයනය කිරිමේ දී තෙවැනි සිත ලෙසට විස්තර කරනුයේ සුපහන් සිත පිළිබඳවය. යම් ආකාරයකට ඉඩ් සංස්කාරයේ මූලික අවශ්‍යතා ඉටු කිරීමේ පෙළඹවීමක් පරාජයට පත්කර ගත නොහැකි වුවහොත් පහන් සිතක් ඇතිවේ. ඒ මොහොතේ දී හදවතට දනෙනුයේ පසුතැවිල්ලකි . අපරාදේ මට ඉවසන්න තිබුණා. මට ඒ දේ නොකර ඉන්න තිබුණා යැයි යම් සිදුවීමකට පසුතැවිලි වෙති. එය හෘද සාක්ෂිය ලෙස හැඳින්වේ. සමාජය තුළ වන ඇතැම් අපරාධ ඇසූ විට හෝ දුටුවිට අපට එකවර කියැවනුයේ හිතක් පපුවක් තියෙන පුද්ගලයෙකු එසේ කරන්නේ කොහොම ද කියා ය. බොහෝ අපරාධවල සුලමුල වන්නේ එයයි. සමාජය තුළ මිනිසා සංස්කෘතිකගත නොවන්නේ නම් හිතක් පපුවක් ඇති මිනිසුන් සමාජය තුළ ජීවත්වීමට ඉඩක් ලැබෙන්නේ නැත. එය පොදුවේ සමාජයටම බලපාන බරපතල කරුණකි. මෙම තත්ත්වය ඇත්තේ සමාජය තුළ ජීවත්වෙන සමස්ත ජනකායෙන් දශම එකකට හෝ දශම එකකට වඩා අඩු ප්‍රමාණයකින් පමණි.

සිරිල් බර්ට් සහ සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් පවසන ආකාරයට අපරාධකාමී චර්යාවට මනෝ විද්‍යාත්මක සාධක බලපෑම් කරයි. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්ගේ දර්ශනයට අනුව පුද්ගල අංශයන් ඉටුකර ගැනීමට නොහැකි වූ විට පුද්ගලයා තුළ චණ්ඩතාවය හට ගනී. කුඩා දරුවෙකුට කුඩා කාලයේ සිටම දෙමාපිය උණුසුම, සෙනෙහස අවශ්‍ය වේ. එම අවශ්‍යතාවය නොවන විට දරුවන් තුළ චණ්ඩතාවය හටගනී. මෙම චණ්ඩතාවය ඇතිවෙන විට දරුවන් තුළ අපරාධකාමී චර්යාවන් ඇති වේ. බොහෝ දරුවන් දෙමාපියන්ට අකීකරු ලෙස හැසිරීම, පාසල් අධ්‍යාපනයෙන් ඈත්වීම වැනි දේ සිදුවීමට මෙම කුඩා කාලයේ හට ගන්නා චණ්ඩතාවය බලපෑම් කරයි. විදෙස්ගත වන දෙමාපියන්ගේ දරුවන් අධ්‍යාපනයෙන් ඉහළට යනවා වෙනුවට අධ්‍යාපනයෙන් ඈත් වන ස්වභාවය ඉහළය. මත්ද්‍රව්‍ය භාවිතා කරන පිරිමි දරුවන්

පුනරුත්ථාපනයට යොමු කරන ලද අවස්ථා වේ. එසේම විදෙස්ගත දෙමාපියන්ගේ ගැහැණු දරුවන් සිය දෙමාපිය උණුසුම නොලැබීමෙන් විරුද්ධ ලිංගිකයන්ගේ සෙනෙහසට රැවටී දූෂණයට ලක්වීම, අඩු වයසින් විවාහ වීම, අඩු වයසින් ගැබ් ගැනීම් සිදුවෙන බව ලංකාවෙන් වාර්තා වේ. විශේෂයෙන්ම මේ සඳහා බලපානුයේ ෆ්‍රොයිඩ්ගේ දර්ශනයට අනුව පුද්ගල අංශයන් සන්තර්පනය නිවැරදිව සිදු නොවීමය.

ව්‍යුහාත්මක කෘත්‍යවාදී අදහස් විශ්ලේෂණය කිරීමේ දී ළමා අපරාධ සිදුවීමට බලපානුයේ ඉහත සඳහන් අදහස්වලට වඩා වෙනස් අදහසකි. කෘත්‍යවාදීන් පවසනුයේ සමාජය වූ කලී එකිනෙකා හා බද්ධ වූ කොටස්වලින් සෑදුම් ලත් ඒකකයකි. ඒ ඒ කොටස් සමාජ පැවැත්මට විවිධ වූ කෘත්‍යයන් ඉටු කරනු ලබයි. ඒ සමාජ සමබරතාවය හා සහජීවනය උදෙසාය. එවැනි සමාජයක සිටින පුද්ගලයා එම සමාජීය ආයතනයන්ගෙන් සමාජානුයෝජනය වේ. සමාජයක් තුළ පවුල, අධ්‍යාපනය, ආගම, දේශපාලනය, ආර්ථිකය වැනි සමාජ සංස්ථා පවතී. පුද්ගලයා නිරන්තරව මෙම සංස්ථා සමඟ අන්තර් සම්බන්ධතා පවත්වති. පුද්ගල චර්යාවේ පැවැත්මට මෙම සංස්ථා වැදගත් වේ. යම් ආකාරයකට මෙම සංස්ථාවන් පුද්ගල සමාජානුයෝජනයට දායක නොවුණහොත් පුද්ගලයා තුළ හුදකලාභාවයක් හටගනී. සංස්ථා අතර නිවැරදි අන්තර් සම්බන්ධතාවයක සිදු නොවන විට පුද්ගලයා සාමාජානුයෝජනයවනුයේ සමාජයට අහිතකර ආකාරයටය. සෑම සංස්ථාවක්ම කෘත්‍යයක් ඉටු කරන අතර එම ඉටු කරන කෘත්‍යය පුද්ගලයාට දුෂ්කෘත්‍යයක් වේ නම් පුද්ගලයාගේ චර්යාමය කෘත්‍යය දුෂ්කෘත්‍යයක් විය හැකිය.

## 2.4 පරිසරය පිළිබඳ අර්ථකතනය

ආරම්භයේ දී ලෝකයේ ජනගහනය පරිසරයට වඩා වැඩි අවධානයක් යොමු කරන්නට විය. එයට හේතු වූයේ සරල සමාජ පරිසරය මූලික කරගනිමින් ජීවත් වීමයි. ඒ අනුව තහවුරු කරනු ලබනුයේ සරල සමාජයක් පරිසර කේන්ද්‍රීය වූ සමාජයක් වූ බවයි. එඬේර යුගය, ගොවි යුගය ආදී යුගවල ජීවත් වූ ජනතාව පරිසරය මූලික කරගත් සරල ජීවිකාවක් ගත කරන්නට විය. නමුත් කාර්මීකරණය, ගෝලීයකරණය, නවීකරණය වූ සමාජවල පරිසරයට අඩු අවධානයක් යොමු විය.

එම සමාජවල වැඩි අවධානයක් යොමු වූයේ ආර්ථිකය, දේශපාලනය, ආගම, පවුල ආදී සංස්ථා කෙරෙහිය. නූතන මානවයාගේ ප්‍රාථමික අවශ්‍යතා මෙන්ම ද්විතියික අවශ්‍යතා පරිසරය තුළින් ඉටු කර ගත්ත ද, පරිසරය කෙරෙහි අවධානය යොමුවීම සීමා වන්නට විය. මිනිසාගේ අවධානය පරිසරය කෙරෙහි යොමු නොවන විට පරිසරය තුළ සිදුවන වෙනස්වීම්, පරිසර විනාශයන් හා මානවයා හා පරිසරය අතර පවතින සම්බන්ධතාව අවබෝධ කර ගැනීමට නොහැකි වේ. එම තත්ත්වය තුළ මානව ක්‍රියාකාරකම් තුළින් පරිසරය විනාශයට පත්වේ. දැනුවත්ව සිදුවන මානව ක්‍රියාකාරකම්වලින් හා නොදැනුවත්ව සිදුවන මානව ක්‍රියාකාරකම්වලින් බොහෝ දුරට පරිසරය විනාශයට පත්වේ. පරිසර විනාශය මඟින් සිදුවන අහිතකර ප්‍රතිඵලයන් නැවතත් මානවයාට භුක්ති විඳීමට සිදුවේ. සමාජය තුළ පවතින සමාජ ක්‍රමයන් වෙනස් වෙමින් සමාජ ක්‍රමයන් නිර්මාණය වේ. එහෙත් පරිසරය ක්ෂය සම්පතක් වන හෙයින් පරිසරය නවීකරණය කොට නිර්මාණය කිරීමට නොහැකිය. මානව අවශ්‍යතා උදෙසා පරිසරය සංරක්ෂණය කළ යුතුය. වර්තමාන අවශ්‍යතා උදෙසා පරිසරය පරිභෝජනය කරමින් අනාගත පරම්පරාවේ පරිභෝජන අවශ්‍යතා උදෙසා පරිසරය සංරක්ෂණය කළ යුතු වේ.

අතීතයට සාපේක්ෂව වර්තමානයේ පරිසර විනාශයන් බහුලය. පරිසර විනාශයත් සමඟ විවිධ පාරිසරික ගැටළු නිර්මාණය විය. මෙම පාරිසරික ගැටළු දෙස විවිධ න්‍යාය, පර්යාලෝක ඔස්සේ විමර්ශනය කිරීම සිදු විය. කාර්මික විප්ලවයෙන් පසුව පරිසරයට සිදු වූ විනාශය, පරිසර හානිය අති විශාලය. සමාජයීය විද්‍යාවන්ගේ ද, ස්වාභාවික විද්‍යාවන්ගේ ද විවිධ කතිකාවත් ගොඩනඟන පාර්ශවයන් අතර ක්‍රමිකව වර්ධනය වන මෙම පාරිසරික ගැටළු පිළිබඳව අවධානය යොමු විය. එවැනි පසුබිමක් තුළ පරිසරය මූලික කරගත් විවිධ විද්‍යාත්මක දැනුම් කේන්ද්‍රයන් ගොඩනැගෙන්නට විය. සමාජ විද්‍යාව, මානව විද්‍යාව යන විෂයයන් පරිසරය කෙරෙහි අවධානය යොමු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාරිසරික සමාජ විද්‍යාව, පාරිසරික මානව විද්‍යාව ආදී විෂය ධාරාවන් නිර්මාණය විය. මෙම විෂයයන් තුළින් මානවයා හා පරිසරය අතරත්, සමාජය හා පරිසරය අතරත්, පවතින අන්තර් සම්බන්ධතාවයන් අධ්‍යයනය කරන්නට විය. මානවයා පරිසරයෙන් ව්‍යුක්ත කිරීමට නොහැකිය. මානවයා පරිසරයේ කොටසක් වශයෙන් හැඳින්විය හැකිය.

පරිසරය පිළිබඳව විශ්වයේ විවිධාකාර ලෙස විග්‍රහයට ලක්කර තිබේ. පරිසරය විශ්වයේ කේන්ද්‍රීය සාධකයකි. පරිසරය මිනිසාට බලපායි. එය විවිධාකාරයෙන් බලපායි. මිනිසා ද පරිසරයට බලපායි. එම බලපෑම් ද විවිධාකාර වේ. ඉර, හඳ, අහස, වාතය, ගහකොළ, මහ පොළව සහිත මේ විශ්වයෙහි භෞතික පරිසරය මිනිස් ජීවිතය හා සමාජය ද කෙරෙහි බලපානු ලබන වැදගත්ම සාධකයක් වේ. 19 වන ශතවර්ෂයේ සිට සමාජය තුළ පරිසරය යන වචනය නිරන්තරව අසන්නට ලැබේ. පරිසරය යනු කුමක්ද? මිනිසුන් පරිසරය පිළිබඳව කතිකාවතක් ගොඩනගා තිබෙනුයේ මන්ද? පරිසරය යනු අත්‍යවශ්‍යම සමාජ සාධකයක් ද? මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීම ඉතා වැදගත් වේ. පරිසරය සම්බන්ධව විවිධ වූ ක්ෂේත්‍රයන් තුළ විවිධ ආකාරයට නිර්වචනයන් ඉදිරිපත් කර තිබේ. යම් පුද්ගලයෙකුගෙන් පරිසරය යනු කුමක්දැයි විමසන විට පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වූ අර්ථකතනයන් ලබා දේ. පරිසරය යනු කුමක්ද යන්නට විවිධ විෂයාත්මක දිශානතින් හරහා නිර්වචනයන් ඉදිරිපත් කර තිබේ. එම ඉදිරිපත් කරන ලද නිර්වචන ආර්ථිකමය, දේශපාලනමය, සමාජ විද්‍යාත්මක ආදී මානයන් ඔස්සේ ඉදිරිපත් කර තිබේ.

පරිසරය යනු කුමක්දැයි හඳුනා ගැනීමේ දී පැහැදිලි අර්ථකතනයක් ලබා ගැනීම සඳහා පාරිසරික විද්‍යා ශබ්දකෝෂය උපකාරී වේ. පරිසරය මූලික කරගත් වාග් මාලාවක් සඳහා නිර්වචනයක් මෙම ශබ්දකෝෂය තුළ අන්තර්ගත කර තිබේ. මෙම පාරිසරික විද්‍යාව ශබ්ද කෝෂයෙහි පරිසරය යන්නට ලබා දෙන අර්ථකතනය පහත ආකාර වේ.

> "පරිසරය යනු අප අවට ඇති භෞතික හා භෞතික නොවන සියල්ලන්ගෙන් සමන්විත වන වට පිටාවයි. ජීවියෙකුගේ පැවැත්ම අත්‍යවශ්‍යයෙන්ම ජෛව විවිධත්වයෙන් යුතු ස්වාභාවික පරිසරයක් තිබිය යුතුමය. පරිසරය බාහිර හා අභ්‍යන්තර වශයෙන් බෙදී යයි. සෑම ජීවියෙකුගේම ජීවිත කෙරෙහි බාහිර පරිසරය බලපානු ලබයි. බාහිර පරිසරය ජීව, අජීව සංරචක සමඟ අන්තර් ක්‍රියා කරයි. අභ්‍යන්තර තත්ත්වයන් යටතේ රසායනික ද්‍රව්‍ය ප්‍රධාන වේ. බාහිර

පරිසරය ජීවියාගේ අභ්‍යන්තර පරිසරය කෙරෙහි බලපායි" (පාරිසරික විද්‍යා ශබ්දකෝෂය, 2008: පිටු අංක 16).

පරිසරය යනු සීමා කර පෙන්විය හැකි දෙයක් නොව, පරිසරයට සමස්තයම අදාළ වේ. භෞතික හා භෞතික නොවන සියල්ලම පරිසරයට අදාළ වේ. එනම් අප හා අප අවට ඇති සියල්ලම පරිසරයට අදාළ වේ. පරිසරය තුළ වන වස්තූන්, බාහිර හා අභ්‍යන්තර වශයෙන් බණ්ඩනය කිරීමක් කර තිබෙන අතර එම බන්ඩනය කිරීමට මූලික හේතුවවනුයේ අර්ථකතනීය පහසුවය. නැතහොත් එය පරිසරය පිළිබඳ දෙයාකාර අර්ථකතනයක් කිරීමක් සඳහා නොවන බව පැහැදිලි වේ. මානවයාගේ මෙන්ම සෑම ජීවියෙකුම කෙරෙහි බාහිර පරිසරය බලපානු ලබන අතර එය අභ්‍යන්තර පරිසරය කෙරෙහි ද බලපානු ලබයි. ඒ අනුව මෙම බාහිර හා අභ්‍යන්තර පරිසරය එකිනෙකින් වෙන් කිරීමට හැකියාවක් නොමැත. ඉහත සඳහන් අර්ථකතනය තුළ ඉතා පුළුල් විග්‍රහයක් කර තිබෙන අතර, එය සාරාංශගත කොට සරලව ඉදිරිපත් කළ හොත් එහි සඳහන්වනුයේ පරිසරය යනු අප අවට ඇති පරිසරයයි.

පරිසරය පිළිබඳව අර්ථකතනය කිරීමේ දී මානවයා වැදගත් වේ. මානවයා හා මානවයාගේ ක්‍රියාකාරීත්වය මූලික කර ගෙන පරිසරය අර්ථකතනය කර තිබේ. ඇතැම් නිර්වචනයන් තුළ මානවයා ද ඇතුළුව ජීවියා යන අර්ථකතනයන්ගෙන් පරිසරය නිර්වචනය කර තිබේ. ඇතැම් නිර්වචනයන් ඍජුවම මානවයා මූලික කර ගනිමින් පරිසරය යනු කුමක්දැයි නිර්වචනය කර තිබේ.

"පරිසරය යනු, මිනිසා අවට පවතින්නා වූ භෞතික හා අභෞතික සියලු වස්තූන්ය. මිනිසා ද පරිසරයේ මූලික සාධකයකි. මිනිසාට පරිසරයෙනුත්, පරිසරයට මිනිසාගෙනුත් ව්‍යුක්ත විය නොහැක" (පෙරේරා, 2013: පිටු අංක 03).

මානවයාගේ අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී මානව පරිසරය හා බද්ධ වේ. මානවයා පරිභෝජනය කරනු ලබන්නේ පරිසරයේ තිබෙන භෞතික හා අභෞතික වස්තූන්ය. ඉහත සඳහන් නිර්වචනය තුළ ද, පාරිසරික විද්‍යා ශබ්දකෝෂයෙහි

පරිසරය යන්නට ලබා දෙන නිර්වචනයට සමාන වූ අදහසක් ඉදිරිපත් කර තිබේ. එනම් පරිසරය යනු භෞතික හා අභෞතික සියල්ලම යන අදහසය. මානවයාගේ පරිභෝජනයට පරිසරය අත්‍යවශ්‍ය සාධකයක් වේ. මානවයාගේ ක්‍රියාකාරකම් නිසාවෙන් පරිසරය විනාශයට පත් වන අතර, එහි අයහපත් ප්‍රතිඵලයන් භුක්ති විඳීමට ද සිදු වනුයේ මානවයාටමය. මානව ක්‍රියාවන් නිසාවෙන් හානියට පත්වන පරිසරය පවත්වා ගෙන යාමට මානවයාගේ දායකත්වය අවශ්‍ය වේ. පරිසරය යනු නැවත ගොඩනැගිය නොහැකි, යථා තත්ත්වයට පත් කළ නොහැක්කක් වේ. එබැවින් පරිසරය සංරක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. මේ සඳහා මානවයාගේ මැදිහත්වීම අවශ්‍ය වේ. මේ අනුව පැහැදිලි වනුයේ මානවයාට පරිසරයෙනුත්, පරිසරයට මානවයාගෙනුත්, ව්‍යුක්තව ජීවත් විය නොහැකි බවය. මානවයා හා පරිසරය අතර පවතින්නා වූ අන්තර් සම්බන්ධතාවය ඉතා කිට්ටු සම්බන්ධතාවයක් වේ. ඉහත නිර්වචනයට අනුව මානවයා පරිසරයේ මූලික සාධකයක් වේ.

පරිසරය යනු අප අවට පවතින වටපිටාව යැයි නිර්වචනය කළ ද, එයට විවේචනයන් ඉදිරිපත් කර තිබේ. මහාචාර්ය සරත් කොටගම ඉහත සඳහන් අප අවට පවතින වටපිටාව පරිසරය යන්න අර්ථකතනය කිරීමට විරුද්ධව අදහස් ඉදිරිපත් කර තිබේ. මහාචාර්ය සරත් කොටගම එම අර්ථකථනයට විරුද්ධව අදහස් දක්වනුයේ එම අර්ථකතනය තුළ මිනිසා නැමැති ජීවියා ඇතුළත් නොකිරීම නිසාය. වර්තමානයේ පරිසරය හඳුන්වනුයේ "මිනිසා ඇතුළු ඔහු ජීවත් වන වටපිටාවයි" (කොටගම, 2001: 61). සිදුකරන සෑම ක්‍රියාවක්ම මානවයා සිදු කරන්නේ නම් පරිසරය අර්ථකතනය කරනු ලබන විට මානවයා ඉන් ව්‍යුක්ත කොට කතා කිරීමට අපහසු බව මහාචාර්ය සරත් කොටගමගේ අදහසයි. අනාදිමත් ඉතිහාසයක සිට ඔරොත්තු දෙන සමාජයක් බිහි වීම දක්වා වූ කාල පරිච්ඡේදය තුළ මිනිස් කටයුතු හා පරිසරය අතර පවතින සම්බන්ධතාවය ප්‍රධාන අංශ තුනක් (03) ක් හරහා දැක්විය හැකිය. එනම්,

01. යටත් වීම - ස්වභාව ධර්මයේ බලවේග හඳුනා නොගත් නිසා එම බලවේගවලට යටත් වූ යුගය. සාම්ප්‍රදායික ජන කණ්ඩායම් බොහෝමයක් හා ක්ෂේත්‍ර ප්‍රජාව මෙහිදී වැදගත්ය.

02. අභිභවනය - විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කරගනිමින් ස්වභාව ධර්මයේ නියාම අභිබවා යාම බොහෝ පරිසර සාධකවලට හේතුව මෙය වේ.

03. සහයෝගීතාව - ස්වභාව ධර්මය සමඟ සහයෝගයෙන් වැඩ කිරීම. තිරසාර සමාජයක් සඳහා මෙය වැදගත් වේ. (කොටගම, 2001 ፡ 61 - 22)

මහාචාර්ය සරත් කොටගම මතු කිරීමට උත්සහ දරා තිබෙනුයේ මානවයා හා පරිසරය අතර පවතින සම්බන්ධතාවය පරිසර අර්ථකතනය කිරීමේ දී වැදගත් වන බවය. විශේෂයෙන්ම සමාජ විකාශනය පිළිබඳව ද අවධානය යොමු කරමින් ඔහු එම මානවයා හා පරිසරය අතර, පවතින ද්විත්ව සම්බන්ධතාවය පෙන්වා දෙනු ලබයි.

පරිසරය යනු කුමක් ද යන්නට අර්ථකතනයන් විවිධය. පරිසරය යනු කුමක් ද? යන්න තේරුම් ගැනීමට මහාචාර්ය සරත් කොටගම නිර්වචනයක් ඉදිරිපත් කර තිබේ. මහාචාර්ය කොටගම පරිසරය ප්‍රධාන කොටස් තුනකට බෙදා දක්වයි. එනම්,

1. ස්වාභාවික පරිසරය.
2. ගොඩනඟන ලද පරිසරය.
3. මතවාදී පරිසරය (කොටගම, 2001፡ පිටුව 62)

ස්වාභාවික පරිසරය යනුවෙන් හැඳින්වෙනුයේ මිනිසාගේ මැදිහත්වීමකින් තොරව ගොඩනැඟුන වටපිටාවයි. මිනිසාගේ අවම මැදිහත්වීමකින් පවතින භූමි වුවද ඇතැම් අවස්ථාවල දී ස්වභාවික පරිසරයට අයත් වනු ඇත. එනම් උදාහරණ වශයෙන් සිංහරාජ වනාන්තරය, හෝර්ටන් තැන්න ආදියයි. ස්වභාවිකව පැවති පරිසරයත් මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට උචිත පරිදී සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් වෙනස් කර නිර්මාණය කරන ලද වටපිටාව ගොඩනඟන ලද පරිසරය වේ. මතවාදී පරිසරය යනු මිනිසාගේ සංස්කෘතිමය වටපිටාව බොහෝ දුරට නිර්මාණය වනුයේ පරිසරික සම්පත්වල තත්ත්වය හා ආර්ථික ක්‍රමයේ සැකැස්ම මතය. මෙම අංශ තුන පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ලබා ගැනීම හරහා

පරිසරය පිළිබඳව යම් අදහසක් ගොඩනගා ගත හැකිය. පරිසරයට විවිධ නිර්වචනයන් ඉදිරිපත් කර තිබේ. පුද්ගල මානයන් හා විද්‍යාත්මක සාධකයන් පදනම් කරගනිමින් උක්ත නිර්වචනයන් සිදු කර තිබේ. පරිසරය යනු අප අවට තිබෙන මානවයා හා බැඳුණු සමාජ අවශ්‍යතාවයන් ඉටුකරනු ලබන්නක් වේ. පරිසරය යනු සෑම සත්වයෙකුටම අවශ්‍ය කරනු ලබන්නකි. පරිසරයට මානවයාගෙන් වියුක්ත විය නොහැකි අතර මානවයාටත් පරිසරයෙන් වියුක්ත විය නොහැකිය. මානවයාගේ අයථා පරිසර පරිභෝජනය නිසාවෙන් පරිසර ගැටලු නිර්මාණය වී තිබේ. පරිසරය හා මානවයා අතර පවතින මෙම ද්වීපාර්ශවීය සම්බන්ධතාවය බිඳීගොස් තිබේ.

## 2.5 පරිසර ගැටලු

පසුගිය දශක දෙක තුළ සාමාජීය විද්‍යාඥයින් පාරිසරික ගැටලු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර තිබේ. පාරිසරික ගැටලු හඳුනා ගැනීම හා ඒවාට සුදුසු විසඳුම් සෙවීම සම්බන්ධයෙන් සාමාජීය විද්‍යාඥයන්ගේ කාර්යභාරයේ ඇති වැදගත්කම පාරිසරික ක්ෂේත්‍රයේ පිළිගැනීමක් හිමි විය. පාරිසරික ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීම බලන විට ඒවා ස්වභාවයෙන්ම මතුවන ඒවා නොවේ. එම ගැටලු බොහෝ විට විවිධ පුද්ගලයන් විසින් හෝ යම් යම් සංවිධාන තුළින් ඉස්මතු කර දක්වන ඒවා ලෙස සැලකිය හැකිය. එම නිසාවෙන් පාරිසරික ගැටලු සමාජ ප්‍රශ්න ලෙස සලකයි. විවිධ කාල තුළ විවිධ සමාජයන්හි ඇති වූ පරිසර ගැටලු සලකා බලන්නේ නම් ඒවා 19 වන ශතවර්ෂයේ පැවැති අදහසක් වන වනජීවී පරිහානියේ සිට විසිවන ශත වර්ෂයේ ඕසෝන් ස්ථරය පිරිහීම (Ozone Depletion) දක්වා විවිධත්වයෙන් යුක්තය. පාරිසරික ගැටලු හඳුනාගැනීමේ දී විද්‍යාව හා තාක්ෂණය මෙන්ම ජන සන්නිවේදනය ද වැදගත් වේ. විද්‍යාව හා ජන සන්නිවේදනය පාරිසරික ගැටලු හඳුනාගැනීමේ දී වැදගත් වනවා යනු පාරිසරික හානිය හඳුනාගැනීමත්, ඒ පිළිබඳව දැනුම වර්ධනය කිරීම පරිසර හානිය අර්බුදයක් ලෙස ඉදිරිපත් කිරීමත්, පරිසර ගැටලුවලට විසඳුම් සෙවීමටත් මෙය ප්‍රයෝජනවත්වීමය.

පාරිසරික ගැටලු වශයෙන් පිරිසිදු වාතය, ජලය දූෂණය වීම, ඕසෝන් ස්ථරය විනාශ වීම, වන විනාශය, පස විනාශ වීම ආදී විවිධාකාරයේ පරිසර හානියන් වී ඇත. මිනිසුන් රෝගීවීම ආදිය හරහා ඒවා මානවයාට ද අයහපත් අයුරින් බලපා තිබේ. මිනිසා හා පරිසරය කොටස් දෙකක් වශයෙන් සැලකීමට යොමු වූයේ කවදා සිටද, එතැන් සිට පරිසර විනාශයේ ආරම්භය සිදුවිය (කොටගම, 2001: පිටුව 61). පරිසරයට සිදුවන විනාශයන් හරහා පරිසර ගැටලු නිර්මාණය වේ. මානවයා පරිසර ගැටලු සියල්ලම පිළිබඳව දැනුවත් වී නොමැත. පරිසර ගැටලු පිළිබඳව අවබෝධයක් මානවයා තුළ ඇති කිරීමට ජනසන්නිවේදනය වැදගත් වේ. බොහෝ පරිසර ගැටලු ජනතාව අතරට පත්වනුයේ ජනමාධ්‍ය මඟින් හෝ වෙනත් මාර්ගයන් හරහාය. උදාහරණයක් වශයෙන් 19 වන සියවසේ අම්ල වැසි පිළිබඳව දැන සිටියත්, 1960 ගණන්වලදී ස්වීඩන් ජාතික ජීව විද්‍යාඥයෙක් වන ස්වන්තේ ඕඩේන් (Svante Oden) ස්කැන්ඩිනේවියානු රටවල මසුන් මිය යැමට අම්ල වැසි බලපා ඇති ආකාරය ජනමාධ්‍ය තුළින් පෙන්වා දෙන තුරු ඒ පිළිබඳව ජනතාවට උනන්දුවක් ඇති නොවීය (හැනෙනිග්, 1995: පිටුව 43). 1970 දී ඇමරිකාවේ පැවැත්වූ මිහිතල දිනය නවීන පාරිසරික ව්‍යාපාරයේ ආරම්භයේ ලෙස හැඳින්විය හැකිය. පරිසරය පිළිබඳ අවබෝධයක් ජනතාව තුළ ඇති කිරීම සඳහා එය සුළුවෙන් ආරම්භ කරන ලද්දකි. එහෙත් එය මිලියන ගණනින් ජනතාවගේ සහභාගීත්වය නිසා බහුවිධ අරමුණුවලින් යුක්ත විශේෂ සිද්ධියක් බවට පත්විය. නව පරිසරවාදයේ ආරම්භක දිනය ලෙස එය සැලකිය හැකි අතර, එයට ජනසන්නිවේදනය මඟින් අසීමිත ප්‍රචාරයක් ද ලැබුණි (ගොට්ටලීබ්, 1993: පිටුව 199).

පරිසර දූෂණය ද පාරිසරික ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය. පරිසර ගැටලු පරිසරාත්මක ප්‍රතිපත්ති සකස් කිරීමේ දී පදනම වන්නේය. පාරිසරික ප්‍රතිපත්තින් මෙන් ම, පරිසර ගැටළු ද පදනම් කරගෙන ගොඩනැගෙන අතර එම පාරිසරික ප්‍රතිපත්තින්ගේ අරමුණ වනුයේ එම පරිසර ගැටලුව පාලනය කිරීමත්, එයින් වන හානිය වැලැක්වීමත් ය. මිල්ටන් දක්වන හැටියට බ්‍රිතාන්‍යයේ පාරිසරික ප්‍රතිපත්ති බලනවිට සමහරවිට පරිසර ප්‍රතිපත්ති හේතුවෙන් පරිසර විරෝධී තත්ත්ව ඇති වී තිබේ (සිරිසේන, 2013: පිටුව 55). පරිසර ප්‍රතිපත්තින් නිර්මාණය කිරීමේ දී එම ප්‍රතිපත්ති ජාතික මට්ටමින් හා ජාත්‍යන්තර මට්ටමින් නිර්මාණය කර තිබේ. පරිසර

ප්‍රතිපත්ති දෙස බලන විට රට තුළ පරිසර දූෂණ ගැටලු පිළිබඳ දැඩි ප්‍රතිපත්ති අනුගමනය කරන අතර, ඒවා වෙනස්කම් ඇති කිරීමට අපහසු වන අතර, ජාත්‍යන්තර පාරිසරික ගැටලු සම්බන්ධ ප්‍රතිපත්ති ලිහිල් ප්‍රතිපත්ති අනුගමනය කරයි(සිරිසේන, 2013: පිටුව 55). පරිසර ප්‍රතිපත්තිවල යම් යම් වෙනස් ස්වරූපයන් දක්නට ලැබුණද, එම පරිසර ප්‍රතිපත්තිවල අරමුණු වනුයේ පරිසර සංරක්ෂණය හෝ පරිසර විනාශයන් පාලනය කිරීමය.

පාරිසරික ගැටලුවක් ලෙස හැඳින්වීමේ දී පරිසර දූෂණය පිළිබඳව අවබෝධයක් ලබා ගත යුතුය. පරිසර දූෂණයක් යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුමක් ද? ඒ සඳහා ඉදිරිපත් කරන අර්ථකතනයන් කවරේද යන්න පිළිබඳව ද අවබෝධයක් ලබා ගත යුතුය. පරිසර දූෂණය යනු කුමක් ද යන්නට ඉදිරිපත් කර තිබෙන නිර්වචනයක් පහතාකාර වේ. එනම්,

> "මුළු මහත් ජෛව සංහතීන්ගේ පැවැත්ම තර්ජනයට ලක් කරමින්, පාරිසරික තුලිතතාව බිඳී යන පරිද්දෙන් අප අවට ඇති පරිසරයට අපවිත්‍ර හෝ අහිතකර ද්‍රව්‍ය එකතුවීම හෝ එකතු කිරීම පරිසර දූෂණය නම් වේ" (පෙරේරා, 2010: පිටුව 97).

පරිසර දූෂණය යනු පවතින පරිසර පද්ධතියට හානිවීමත්, පරිසර සමතුලිතතාවය බිඳවැටීමත් වේ. මෙම පරිසර දූෂණය දෙස බලන විට පරිසර දූෂණය ක්ෂේත්‍ර කිහිපයක් පුරාවට සිදුව තිබේ. එනම් ජල දූෂණය, වායු දූෂණය, වෙරළ දූෂණය, ශබ්ද දූෂණය ආදී වශයෙන් පරිසර දූෂණය සිදුව තිබෙන අතර මෙම පරිසර දූෂණය වර්තමානයේ ද සිදුවෙමින් පවතී.

## 2.6 පරිසර සංරක්ෂණය

විනාශයවෙමින් තිබෙන පරිසරය සුරැකීම සඳහා පරිසරය සංරක්ෂණය කළ යුතු වේ. සංරක්ෂණය යනු කුමක්ද? ඒ සඳහා පවතින නිර්වචනයන් පිළිබඳව විමසා බැලීම වැදගත් වේ. සංරක්ෂණය යන්නෙහි අර්ථය සෙවීමේ දී ශබ්දකෝෂයක සහාය ලබා

ගැනීම වැදගත් වේ. ඒ අනුව ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයෙහි සංරක්ෂණය යන්නට ලබා දී තිබෙන අර්ථයේ සිංහල අර්ථය පහත සඳහන් වේ.

> "සුරැකීමේ ක්‍රියාව (විනාශකාරී, බලපෑම්, ස්වභාවික ක්ෂය වීම හෝ අපතේ යෑම්වලින් ආරක්ෂා කිරීම) ජීවය, සෞඛ්‍යය, පූර්ණත්වය ආදියේ පැවැත්ම ආරක්ෂා කිරීම" (කොටගම, 2001: පිටුව 01).

ඉහත සඳහන් අර්ථකතනය තුළින් සංරක්ෂණය හෝ සංරක්ෂණ ක්‍රියාවලිය යනු සිදුවිය හැකි වෙනස්වීමක් වැලැක්වීම ලෙස හැඳින්වේ. සංරක්ෂණය කිරීමේ දී සිදුවනුයේ සිදුවිය හැකි වෙනස්වීමක් වැලැක්වීමක්ය යන අර්ථය පරිසර සංරක්ෂණය කිරීමේ දී භාවිතා කළ හැකිද? එය යම් ආකාරයකට පරිසරයට ගලපා ගැනීම අපහසුය. පරිසරයේ සිදුවන සියල්ල මානවයාට අවශ්‍ය ආකාරයට පාලනය කිරීමට හැකියාව පවතී ද? සංරක්ෂණය කිරීමේ දී මානවයාගේ මැදිහත්වීමක් තිබෙන අතර ස්වාභාවික පරිසරය තුළ සිදුවන සියල්ලට මානවයාට මැදිහත්වීමේ හැකියාවක් පවතී ද යන්න ගැටලුකාරී වේ. ස්වභාවධර්මයේ සිදුවන වෙනස්වීම් අපට වැලැක්විය නොහැකිය. පරිසර පද්ධතිය ගතික වන අතර, එය සෑමවිටම වෙනස්වෙමින් පවතී. මේ අනුව පැහැදිලි වනුයේ සංරක්ෂණය යන්නට ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයෙහි ලබා දෙන අදහස නිවැරදි වුව ද එය පරිසර සංරක්ෂණයේ අර්ථකතනය කිරීම සඳහා යොදා ගැනීමට නොහැකි බවය.

පරිසර සංරක්ෂණය යන්නට ඒ අනුව ලබා දෙන අර්ථකතනය කුමක්ද? සංරක්ෂණය හා සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා විද්‍යාත්මක අර්ථකතනයක් මේ වන විට ඉදිරිපත් වී ඇත. ස්වාභාවික සම්පත් සංරක්ෂණය සඳහා වන ජාත්‍යන්තර ආයතන (IUCN), එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (U.N.E.P) හා ලෝක ව්‍යාප්ත සොබාදහම් අරමුදල (W.W.F.) යන ආයතන මඟින් ලෝක සංරක්ෂණ උපාය මාර්ග 1980 ලියවිල්ලෙහි සංරක්ෂණය මෙසේ අර්ථ ගන්වා ඇත.

> "සංරක්ෂණය යනු අනාගත පරම්පරාවල අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කිරීමේ හැකියාව පවත්වා ගන්නා අතරම, වර්තමාන පරම්පරාවට හැකි ප්‍රශස්ථ ප්‍රයෝජන ලබා දිය හැකි අයුරින් ජෛව ගෝලයේ

මිනිස් භාවිතය නැණවත්ව කළමණාකරණය කිරීමයි" (කොටගම, 2001: පිටු අංක 02).

ඉහත සඳහන් අර්ථකතනය තුළ සංරක්ෂණය කිරීම යනු කුමක් ද යන්න පිළිබඳව මෙන්ම, සංරක්ෂණය කළ යුත්තේ කුමන අරමුණකින් ද, කුමක් උදෙසා ද යන්න සඳහන් වී තිබේ. විශේෂයෙන්ම වර්තමානයේ අවශ්‍යතා සපුරා ගන්නා ඇතැම් පුද්ගලයන් පරිසරයට වන විනාශය පිළිබඳව නොසිතයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිසරයට හානිකර තත්ත්වයන් ඇති වෙනවා මෙන්ම, අනාගත අවශ්‍යතා ඉටු කර ගැනීමට බාධා ඇතිවේ. එම තත්ත්වය වෙනස් කළ හැකි දෙයක් වන අතර, මිනිසා කළ යුත්තේ අවශ්‍යතා බුද්ධිමත්ව කළමණාකරණය කර ගැනීමය. එසේ නොවනවිට වර්තමානයට වඩා අනාගතයේ අවශ්‍යතා ඉටු කර ගැනීමට යාමේ දී අර්බුදකාරී තත්ත්වයන් නිර්මාණය වීමේ ඉඩකඩ පවතී.

සංරක්ෂණය යන වචනය විවිධ විෂයයන් සමඟ අර්ථ ගැන්වීමේ දී එකිනෙකට වෙනස් අර්ථ ඉදිරිපත් කර තිබේ. උදාහරණයක් ලෙස ගතහොත් පුරාවිද්‍යාව විෂය තුළ සංරක්ෂණයේ අරමුණුවනුයේ කෞතුක වස්තුවක වෙනස්වීම පමා කිරීම හෝ නැවැත්වීම විය හැකිය. එහෙත් පරිසර සංරක්ෂණයේ අරමුණ වනුයේ පරිසර සම්පත් අනාගතය උදෙසා ද පවත්වාගෙන යාමයි. සංවර්ධනය හා පරිසර සංරක්ෂණය අතර බිඳළිය නොහැකි සබඳතාවයක් ගොඩනැඟී පවතී. මිනිස් අවශ්‍යතා සංතර්පනය කිරීම සඳහා ස්වභාවික සම්පත් භාවිතා කිරීමේ දී එම සම්පත් දිගින් දිගටම පවත්වාගෙන යා හැකි අයුරින් නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීම සඳහා ජගත් ප්‍රජාව යොමුවූයේ සංරක්ෂණ අරමුණු සමඟින්ය.

සංරක්ෂණයේ අභිමතාර්ථයන් හඳුනාගැනීමට හැකියාව තිබේ. සංරක්ෂණයේ අභිමථාර්ථයන් ක්‍රියාත්මක වීමේ දී වර්තමාන අවශ්‍යතා සංතර්පනය කිරීම මෙන්ම අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද අර්බුදකාරී තත්ත්වයන් මඟහැරෙනු ඇත. පුද්ගල අවශ්‍යතා පිරිමසන අතරතුරම සම්පත්හි ආරක්ෂාව සැලසීම සඳහා පරිභෝජනයේ සීමාවන් හා එහි බලපෑම් හඳුනාගැනීම සඳහා සංරක්ෂණ අභිමතාර්ථයන් පැවතීම යෝග්‍ය වේ.

පරිසර සම්පත් කළමණාකරණය කිරීමේ දී, පරිභෝජනයට නොගත් පරිසර සම්පත් කළමණාකරණය කිරීමේදී පරිසරයට අවම හානියක් ලබා දෙමින් අදාළ සම්පත් මානව අවශ්‍යතා උදෙසා භාවිතා කිරීම සිදුවේ. භාවිතයට ගනිමින් පවතින පරිසර සම්පතක් කළමණාකරණය කිරීමේ දී භාවිත සම්පත් චිරස්ථායී සංවර්ධනයට එනම් වර්තමානයේ මෙන්ම අනාගත පරම්පරාවේ ද ප්‍රයෝජනය උදෙසා පරිභෝජනයට ඉඩ සැලසෙන පරිදී යොදා ගැනීම කළ යුතුවේ. අධිපරිභෝජනය නිසාවෙන් තර්ජනයට පත් වූ සම්පත් කළමණාකරණය කිරීමේ දී දිගු කාලීන කෙටි කාලීන වාරණ පැනවීම, විකල්ප සම්පත් ගවේෂණය කිරීම යනාදිය ප්‍රධාන වේ. වර්තමානයේ වෙරළාශ්‍රිත කොරල්පර විනාශය මැඩීමට මෙවැනි ක්‍රම යොදා ගෙන ඇත.

පරිසරය සංරක්ෂණය කිරීමෙහිලා විශාල මෙහෙයක් ඉටු කරනු ලබනුයේ ලෝක සංරක්ෂණ සංගමයයි. (IUCN) , දෙවන ලෝක යුද්ධය නිමා වෙත්ම, පරිසරයට විශාල විනාශයක් සිදුවිය. පරිසරය ආරක්ෂා කර ගැනීමේ මූලික අරමුණින් මෙම ලෝක සංරක්ෂණ සංගමය පිහිටුවා තිබේ. ලෝක සංරක්ෂණ සංගමය 1948 දී යුරෝපා රටවල විද්‍යාඥයින් රැසකගේ සහභාගීත්වයෙන් ආරම්භ විය. ලෝක සංරක්ෂණ සංගමය පිහිටුවීමේ මූලික අරමුණ වනුයේ පරිසර සංරක්ෂණය ලෝකයේ ජෛව විවිධත්වය සුරැකීමත්, ස්වභාවික සම්පත් භාවිතය සාධාරණ හා තිරසාර ලෙස සිදු කිරීමට ලෝක වාසීන්ට උපදෙස්, උපකාර හා සහයෝගය ලබා දීමටත් ය. මේ සඳහා ඔවුන් විද්වතුන් හා තාක්‍ෂණ දැනීම හුවමාරු කර ගැනීම, පරිසර සංරක්ෂණ සම්බන්ධ නීති රීති කෙටුම්පත් සකස් කිරීමට සහාය වීම, අවදානමට ලක් වූ වඳ වූ ජීවී විශේෂ හා පරිසර පද්ධති සම්බන්ධ තොරතුරු රැස් කර රතු දත්ත පොත නිකුත් කිරීම ආදියයි. ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ විවිධ ලිපි සඟරා මුද්‍රණය කර රතු දත්ත පොත නිකුත් කිරීම ආදියයි. ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ විවිධ ලිපි ගොනු සඟරා මුද්‍රණය කර බෙදා හැරීම ආදී විවිධ කාර්යයභාරයන් මෙම සංගමයෙන් ඉටුවේ. ලෝක සංරක්ෂණ සංගමයට අනුයුක්ත ශ්‍රී ලාංකීය ආයතනය 1988 දී ආරම්භ කරන ලදී. රජය සමඟ ලෝක සංරක්ෂණ සංගමය අවබෝධතා ගිවිසුම 1993 දී අත්සන් කරන ලදී (කුරේ, 2006: පිටුව 37).

# තෙවන පරිච්ඡේදය

# දත්ත විශ්ලේෂණය

**හැඳින්වීම**

අධ්‍යයන වාර්තාවේ තෙවන පරිච්ඡේදය මඟින් 2017 මාර්තු මාසය තුළ දිවයින හා ලංකාදීප යන පුවත්පත්වල ළමයින් හා පරිසරය සම්බන්ධව පළ වූ පුවත් විවිධ තේමාවන් යටතේ මනෝ සමාජීය පදනමකින් යුතුව විශ්ලේෂණය කිරීම තෙවන පරිච්ඡේදය මඟින් සිදු වේ.

මෙම විශ්ලේෂණය සඳහා ප්‍රාථමික දත්ත වශයෙන් යොදා ගනු ලබන්නේ ලිඛිත මූලාශ්‍රයන් ය. ප්‍රාථමික දත්තවන ළමයින් හා පරිසරය සම්බන්ධව පළ වූ පුවත් ගැඹුරින් විශ්ලේෂණය කිරීම මෙම පරිච්ඡේදය මඟින් සිදු වේ. විශ්ලේෂණයේ පහසුව සඳහා උප ශීර්ෂයන් කිහිපයක් යටතේ විශ්ලේෂණය සිදු කරනු ලබන අතර එය ගුණාත්මක හා ප්‍රමාණාත්මක යන දෙයාකාරයෙන් සිදු වේ.

අධ්‍යයන දත්ත විශ්ලේෂණයේ දී ළමා අපරාධ, අනාරක්ෂිතබව හේතුවෙන් ළමුන්ට සිදුවන පීඩාවන්, ළමයින්ගේ දක්ෂතා හා වැරදි සම්බන්ධව පළ වූ පුවත් ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් තෙවන පරිච්ඡේදය තුළ විශ්ලේෂණයට ලක් කර ඇත. එසේම පරිසර ගැටලු, පරිසර විනාශ කිරීම්, පරිසර සුන්දරත්වය ආදී තේමාවන් යටතේ පළ වූ පුවත් සම්බන්ධව ද විශ්ලේෂණය තෙවන පරිච්ඡේදය තුළ අන්තර්ගත කර ඇත.

ප්‍රාථමික දත්තයන් විශ්ලේෂණය කිරීමේ දී ඊට ද්විතියික දත්තයන් ද යොදා ගනිමින් වඩාත් ගැඹුරින් විශ්ලේෂණ කාර්යයේ යෙදී ඇත.

## 3.1 **විශ්ලේෂණයට පාදක වු පුවත් හි ස්වභාවය**

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් වන දිවයින හා ලංකාදිප යන පුවත්පත් ද්විත්වය මුලික කර ගනිමින් 2017 මාර්තු මාසය තුළ ප්‍රකාශයට පත්වූ පුවත්පත් අධ්‍යයනය සඳහා යොදා ගනු ලැබීය.

වගු අංක 3.1.1 විශ්ලේෂණයට පාදක වු පුවත්පත්

| **පුවත්පත් නාමය** | **පුවත්පත් සංඛ්‍යාව** |
|---|---|
| දිවයින | 25 |
| ලංකාදිප | 25 |
| **මුළු පුවත්පත් එකතුව** | **50** |

ඉහත සඳහන් පුවත්පත් ද්විත්වය පාදක කර ගන්මින් දත්ත විශ්ලේෂණයේ දී ප්‍රධාන වශයෙන් තේමාවන් ද්විත්වයක් තෝරා ගන්නට විය. එහිදී 2017 මාර්තු මාසයේ දිවයින හා ලංකාදීප යන පුවත්පත්වල පළ වූ ළමයින් සම්බන්ධ පුවත් හා පරිසරය සම්බන්ධව පළ වූ පුවත් දත්ත විශ්ලේෂණය සඳහා උපයුක්ත කර ගනු ලැබීය. එහිදී විශ්ලේෂණයට යොදා ගත් පුවත් සංඛ්‍යාව පුවත්පත් අනුව පහත පරිදි වේ.

වගු අංක 3.1.2 විශ්ලේෂණයට පාදක වු පුවත්හි ස්වභාවය

| **පුවත් තේමාව** | **දිවයින** | **ලංකාදීප** | **මුළු පුවත් සංඛ්‍යාව** |
|---|---|---|---|
| ළමයින් සම්බන්ධව පළ වු පුවත් සංඛ්‍යාව | 34 | 33 | **67** |
| පරිසරය සම්බන්ධව පළ වු පුවත් සංඛ්‍යාව | 20 | 05 | **25** |
| **මුළු පුවත් එකතුව** | **54** | **38** | **92** |

**මුලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව 2017**

මෙම අධ්‍යයන වාර්තාවේ පුවත් විශ්ලේෂණය සඳහා පුවත් 92ක් උපයුක්ත කර ගන්නා ලදී. ඉන් ළමයින් සම්බන්ධව වාර්තා වූ පුවත් 67ක් වේ. ඉන් පුවත් 34ක් දිවයින පුවත්පතෙහි වාර්තාවී තිබුණ අතර ලංකාදීප පුවත්පතෙහි ළමයින් සම්බන්ධව වාර්තාවී තිබූ පුවත් සංඛ්‍යාව 33ක් වේ. දිවයින හා ලංකාදීප යන පුවත්පත් ද්විත්වයෙහි පරිසරය සම්බන්ධව පුවත් 25ක් වාර්තා වී තිබුණ අතර ඉන්

පුවත් 20ක් දිවයින පුවත්පතෙහි වාර්තා වී තිබෙන අතර පුවත් 05ක් තරම් සුළු ප්‍රමාණයක් ලංකාදීප පුවත්පතෙහි වාර්තා කර ඇත.

### 3.2 ළමයින් සම්බන්ධව පළ වූ පුවත් හි ස්වභාවය

ළමුන් පිළිබඳව සමාජය තුළ වැඩි අවධානයක් පවතින හෙයින් ළමයින් සම්බන්ධව විවිධ ආකාරයේ පුවත් වාර්තා වේ. මෙම විශ්ලේෂණ වාර්තාව තුළ ළමයින් සම්බන්ධව පළ වූ විවිධාකාරයේ පුවත් විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ලදී. අධ්‍යයනය සඳහා යොදා ගත් මුළු පුවත් සංඛ්‍යාවෙන් ළමයින් සම්බන්ධ පුවත් 67ක් වන අතර අධ්‍යයනය සඳහා යොදා ගත් 2017 මාර්තු මාසයේ පුවත්පත්හි ළමුන් සම්බන්ධව දෛනිකව පුවත් වාර්තා වී තිබුණි. එම පුවත් විවිධ තේමාවන් යටතේ වාර්තා වී තිබෙන්නට විය.

2017 මාර්තු මාසයේ ලංකාදීප හා දිවයින යන පුවත් පත් හි ළමයින් සම්බන්ධව පළ වූ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී ශීර්ෂයන් කිහිපයක් යටතේ විග්‍රහයට ලක් කිරීමට හැකිය. එහිදී ළමයින් සම්බන්ධව පළ වූ පුවත් පහත ශීර්ෂයන් යටතේ විග්‍රහයට ලක් කළ හැකිය.

වගු අංක 3.2.1 ළමයින් සම්බන්ධව පළ වු පුවත්වල තේමාවන්

| **පුවත් තේමාව** | **දිවයින** | **ලංකාදීප** | **මුළු පුවත් සංඛ්‍යාව** |
|---|---|---|---|
| ළමා ලිංගික හිංසනයන් සම්බන්ධ පුවත් | 08 | 06 | 14 |
| ළමා ඝාතනයන් සම්බන්ධ පුවත් | 02 | 03 | 05 |
| අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් මුහුණපාන ගැටලු | 07 | 04 | 11 |
| අනතුරු හේතුවෙන් ළමුන්ට සිදුවන හානි | 04 | 12 | 16 |
| ළමුන්ගේ චර්යාමය ගැටලු | 04 | 01 | 05 |
| ළමුන්ගේ දක්ෂතා හා ඇගයුම් | 0 | 01 | 01 |
| ළමා හිමිකම් කඩකිරීම් | 03 | 02 | 05 |
| වෙනත් | 07 | 02 | 09 |
| **මුළු පුවත් එකතුව** | **35** | **32** | **67** |

**මුලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව 2017**

අධ්‍යයනය සඳහා පාදක කර ගත්තාවූ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දි ළමුන් සම්බන්ධව පළ වු පුවත් 67ක් වූ අතර ඉන් පුවත් 35ක් වාර්තා වනුයේ දිවයින පුවත්පතෙහි වන අතර පුවත් 32ක් ලංකාදීප පුවත්පත් තුළ වාර්තා වී තිබුණි. 2017 මාර්තු මාසයේ පළ වූ දිවයින හා ලංකාදීප යන පුවත්පත් ද්විත්වයේ ළමයින් සම්බන්ධව වාර්තා වන පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී වැඩි වශයෙන් වාර්තා වනුයේ අනතුරු හේතුවෙන් ළමුන්ට සිදුවන හානි සම්බන්ධ පුවත් ය. අනතුරු හේතුවෙන් ළමුන්ට සිදුවන හානි සම්බන්ධව වාර්තාවන මුළු පුවත් සංඛ්‍යාව 16ක් වන අතර ඉන් පුවත් 04ක් දිවයින පුවත්පත් හි පළ වන්නට වූ අතර පුවත් 12ක් ලංකාදීප පුවත්පත් හි පළ වී ඇත. ළමා ලිංගික හිංසනයන් සම්බන්ධව ද වැඩි වශයෙන් පුවත් වාර්තා වී තිබෙන අතර ඒ සම්බන්ධව වාර්තා වන මුළු පුවත් සංඛ්‍යාව 14ක් වන අතර ඉන් පුවත් 08ක් දිවයින පුවත්පත් හි පළ වන්නට වු අතර පුවත් 06ක් ලංකාදීප පුවත්පත්හි පළ වී ඇත. සමාජය තුළ ළමුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය යුතු අතර ළමුන් කෙරෙහි රැකවරණ සැලැස්මක් තිබිය යුතුය. අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් මුහුණපාන ගැටලු පිළිබඳව පුවත්පත් හි පුවත් වාර්තා වී ඇති පුවත් සංඛ්‍යාව 11ක් වන අතර ඉන් පුවත් 07ක් දිවයින පුවත්පතෙ හි ද පුවත් 04ක් ලංකාදීප පුවත් පතෙහි ද පළ වී ඇත. ළමා ඝාතනයන් සම්බන්ධ පුවත්, ළමුන්ගේ චර්යාමය ගැටලු, ළමුන්ගේ දක්‍ෂතා හා ඇගයුම්, ළමා හිමිකම් කඩකිරීම් පිළිබඳව ද පුවත් වාර්තා වී ඇති අතර එම පුවත් සංඛ්‍යාව 10ට අඩු සංඛ්‍යාවක් විය.

### 3.3 ළමා ලිංගික හිංසනයන් සම්බන්ධ පුවත්

ළමා ලිංගික හිංසනයන් පිළිබඳව විවිධ පුවත් වාර්තා වන අතර ජනමාධ්‍ය තුළින් ඒ සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දෙන බව වර්තමානයේ ජනමාධ්‍ය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී අවබෝධ වේ. ලිංගික හිංසනයන් සම්බන්ධව ලංකාවේ හා ජාත්‍යන්තරයේ විධිමත් නීති මාලාවන් ස්ථාපිත කර තිබුණ ද ළමා ලිංගික හිංසනයන් පිළිබඳව වාර්තාවීම්හි අඩුවක් දක්නට නොමැත. ළමා ලිංගික හිංසනයන් සම්බන්ධව අධිකරණ පද්ධතිය තුළ ක්‍රියාත්මක වන නඩු සංඛ්‍යාව ද ඉහළ ප්‍රතිශතයක් වීමෙන් අනාවරණයවනුයේ ළමා ලිංගික හිංසනයන් සිදුවීමේ සමාජ අවකාශයක් පවතින බවය. පුවත් විශ්ලේෂණ වාර්තාව තුළ ළමුන් සම්බන්ධව වාර්තා වී තිබෙන පුවත් සංඛ්‍යාව 67ක් වන අතර ඉන් ළමා ලිංගික

හිංසනයන් සම්බන්ධව පළ වු පුවත් 14ක් විය. එම ලිංගික හිංසනයන් සිදු වූ ආකාරය අනුව විශ්ලේෂණය සිදු කළ හැකිය. එය පහත පහත පරිදි වේ.

වගු අංක 3.3.1 ළමා ලිංගික හිංසනයන් සම්බන්ධ පුවත්

| **ළමා ලිංගික හිංසනයන් පුවත්පත්වල දැක් වූ අයුරු** | **දිවයින** | **ලංකාදීප** | **මුළු පුවත් සංඛ්‍යාව** |
|---|---|---|---|
| ප්‍රේමය නිසාවෙන් සිදු වූ ලිංගික හිංසනයන් | 01 | 0 | 01 |
| ඥාතින්ගෙන් ළමුන්ට වන ලිංගික හිංසනයන් | 02 | 1 | 03 |
| සමාජ වෘත්තිකයන්ගෙන් ළමුන්ට වන ලිංගික හිංසනයන් | 05 | 02 | 07 |
| වෙනත් | 0 | 03 | 03 |

**මුලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව** 2017

පවුලක් තුළින් නිවැරදිව, පුළුල්ව ආරක්ෂාවක් නොලැබෙනවිට ළමුන් සමාජය තුළ අනාරක්ෂිත වේ. දෙමාපිය සෙනෙහස ද අහිමි දරුවා සමාජයේ තමාට හිතවත් පාර්ශවයන්ට සමීපවීමට උත්සාහ දරති. එවැනි අවස්ථාවල දී බොහෝ දරුවන් දූෂකයන්ගේ ග්‍රහණයට ලක්වේ. ළමයා යනු ස්වාධීනව සිය ආරක්ෂාව සපයා ගැනීමට අපහසු අයෙක් වන හෙයින් භාරකරුවන් විසින් ළමුන්ගේ ආරක්ෂාව සැපයිය යුතුය. ළමයින්ට නිසි ආරක්ෂාවක් නොවන හෙයින් ළමුන් ප්‍රේම සම්බන්ධතා ආරම්භ කරනු ලබන අතර ඉන් අනවබෝධය නිසාවෙන් ළමුන් විවිධාකාරයේ හානිකර තත්ත්වයන්ට මුහුණ දෙති. ප්‍රේම සම්බන්ධතාවයන් හේතුවෙන් ළමුන්ට සිදු වන ලිංගික හිංසනයන් වාර්තා වේ. දරුවන් කෙරෙහි දෙමාපියන් හා භාරකරුවන් විසින් නිසි රැකවරණයක් ලබා නොදීම හේතුවෙන් මෙවැනි තත්ත්වයන්ට මුහුණ දෙති. ළමුන් ලිංගිකව හිංසනයට පාත්‍රවන තවත් ආකාරයක්වනුයේ පවුලේ ඥාතීන්ගෙන්ය. දෙමාපියන් දරුවා කෙරෙහි දක්වන අඩු අවධානය හා දරුවන් වෙනත් භාරකරුවෙකුට යොමු කිරීම හරහා දරුවන් විවිධාකාරයේ හිංසනයන්ට පාත්‍ර වේ. පවුලේ විශ්වාසවන්තයින් හා ඥාතීන් හරහා වන ලිංගික හිංසනයන් වර්තමානයේ ජනමාධ්‍ය මඟින් වාර්තා වේ. ප්‍රේමවන්තයින්ගෙන් හා ඥාතීන්ගෙන් වන ලිංගික හිංසනයන් පිළිබඳ පුවත්

කිහිපයක් දිවයින හා ලංකාදීප යන පුවත්පත් හි වාර්තා වී ඇත. විවිධ වෘත්තිකයින් හරහා ළමුන්ට වන ලිංගික හිංසනයන් පිළිබඳ පුවත් ද වාර්තා වී ඇත. එහිදී ළමුන් වෙනුවෙන් සේවය කරනු ලබන නිලධාරින්, රාජ්‍ය ආරක්ෂාව උදෙසා සේවයේ නියුතු නිලධාරින් වැනි සමාජය තුළ යම් වැදගත් සේවයක් ඉටු කරනු ලබන නිලධාරින් විසින් ළමුන්ට සිදු කරනු ලැබූ ලිංගික හිංසනයන් පිළිබඳව පුවත් පත් වාර්තා කර ඇත. ළමා ලිංගික හිංසනයන් සම්බන්ධව පළ වූ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී විවිධ වෘත්තිකයින් විසින් සිදු කරනු ලැබූ ලිංගික හිංසනයන් සම්බන්ධ පුවත් වැඩි වශයෙන් වාර්තා වේ. එක් මාසයක් තුළ මෙතරම් ළමා ලිංගික හිංසනයන් සම්බන්ධ පුවත් වාර්තා වීම තුළින් අනාවරණය වනුයේ ළමා ලිංගික හිංසනයන් සිදුවීමේ යම් ඉහළ ප්‍රවණතාවයක් පවතින බවයි.

### 3.4 ළමා ඝාතනයන් සම්බන්ධ පුවත්

ළමුන්ට ලිංගිකව හිංසනයන් සිදු කිරීම් සම්බන්ධ පුවත් විද්‍යුත් හා මුද්‍රණ මාධ්‍ය මඟින් වාර්තා කරනු ලබයි. ලිංගික හිංසනයන් පමණක් නොව ළමුන් ඝාතනය කිරීම් පිළබඳව ද පුවත් වාර්තා වේ. විශේෂයෙන්ම ලිංගික හිංසනයන් සිදු කර ඝාතනය කිරීම් හා දෙමපියන්ගේ අනාරක්ෂිත බව, දෙමාපියන්ගේ නොසැලකිල්ල නිසාවෙන් ළමුන් ඝාතනයට ලක් වේ. ජිවත්වීම මානව අයිතිවාසිකමක් වශයෙන් පිළි ගත්ත ද ළමුන්ගේ ජිවත්වීම යම් යම් අවස්ථාවල දී විවධ පාර්ශවයන්ගේ තීරණයන් මත රඳා පවතී. අධ්‍යයනය තුළ අවධානය යොමු කරනු ලැබූ මාර්තු මාසයේ දිවයින හා ලංකාදීප යන පුවත්පත් හි ළමා ඝාතනයන් සම්බන්ධව පුවත් 06ක් වාර්තා කර ඇත. එය පහත පරිදි වගුගත කිරීමට හැකිය.

වගු අංක 3.4.1 ළමා ඝාතනයන් සම්බන්ධ වූ හේතූන්

| ළමා ඝාතනයන් සඳහා මුල් වූ හේතූන් | දිවයින | ලංකාදීප | මුළු පුවත් සංඛ්‍යාව |
|---|---|---|---|
| ළමා ලිංගික හිංසනයන් සිදු කර ඝාතනය කිරීම | 0 | 01 | 01 |
| දෙමාපියන් විසින් සිදු කර ඝාතනයන් | 01 | 02 | 03 |
| වෙනත් | 01 | 01 | 02 |

**මූලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව 2017**

ලිංගික හිංසනයන් සිදු කර ඝාතනය කිරීම් පිළිබඳව එක් පුවතක් පමණක් වාර්තා වේ. එසේම දෙමාපියන් විසින් පහරදී ඝාතනය කිරීම් හා දෙමාපියන්ගේ අනියම් සම්බන්ධතාවයන්ගේ ප්‍රතිඵලය හේතුවෙන් ඝාතනය කිරීම් පිළිබඳ පුවත් තුනක් වාර්තා කර ඇත. ළමුන්ගේ ආරක්ෂාව සැපයිය යුතු පාර්ශවයන් විසින්ම ළමුන්ගේ ජීවත්වීමේ අයිතිය අහිමි කර ඇත.

### 3.5 අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් මුහුණපාන ගැටළු

පුද්ගලයාට නිදහස් හා ස්වාධීන ජීවිකාව උදෙසා ආරක්ෂිත පරිසරයක ජීවත්වීම වැදගත් වේ. ළමා පෞරුෂ සංවර්ධනය උදෙසා සමාජ පරිසරය වැදගත් වේ. ළමා පෞරුෂ සංවර්ධනය උදෙසා ජීවත්වන පවුල් පරිසරය මෙන්ම ඔහු ජීවත්වන සමාජ පරිසරය ද වැදගත් වේ. ළමයා ජීවත්වන පරිසරයේ හා ජීවත්වන සමාජ පරිසරයේ පවතින ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් එය පෞරුෂ සංවර්ධනයට අහිතකර අයුරින් බලපානු ලබයි. අධ්‍යයනයේ දී ජීවත්වන පරිසරය හේතුවෙන් ළමුන් මුහුණ දෙන ගැටළු කිහිපයක් අනාවරණය විය. එය පහත පරිදි වේ.

වගු අංක 3.5.1 අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් මුහුණපාන ගැටළු

| අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් ට සිදු වූ හානි | දිවයින | ලංකාදීප | මුළු පුවත් සංඛ්‍යාව |
|---|---|---|---|
| පියාගේ බීමත්කම හේතුවෙන් ළමුන් මුහුණපාන ගැටළු | 0 | 01 | 01 |
| දෙමාපියන්ගේ නොසැලකිල්ල හේතුවෙන් දරුවන්ටවන හානි | 04 | 04 | 08 |
| සමාජයේ හා නිවසේ යටිතල පහසුකම්වල අඩුපාඩු නිසාවෙන් ළමුන්ට සිදුවන හානි | 02 | 04 | 06 |

**මූලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව 2017**

ළමයා මූලික සමාජානුයෝජනය ලබනුයේ පවුලේ සාමාජිකයින්ගේ ආභාසයෙන් වන හෙයින් පවුලේ සාමාජිකයින්ගේ භූමිකාව ආදර්ශමත් විය යුතුය. පවුලේ සාමාජිකයින්ගේ අවිධිමත් චර්යාවන් හේතුවෙන් ළමුන්ගේ ජීවිතවලට හානි සිදුවූ

පුවත් 09ක් වාර්තා වන අතර ඉන් එක් පුවතක් පියාගේ බීමත්කම හේතුවෙන් සිදු වූවක් වන අතර සෙසු පුවත් 08 වාර්තා වනුයේ දෙමාපියන්ගේ නොසැලකිල්ල හේතුවෙන් ළමුන්ට සිදු වු හානි පිළිබඳවය. පියාගේ බීමත්කම ළමුන්ගේ කායික හා මානසික සංවර්ධනය යන දෙඅංශයටම හානි ඇති කරනු ලබයි. විශේෂයෙන්ම ළමයා පියාගේ බීමත්කම හේතුවෙන් ආතතියට පත් වන අතර ඉන් ළමයාගේ මානසික සංවර්ධනයට බාධා ඇති වේ. විශේෂයෙන්ම බීමත්කම හේතුවෙන් මෙන්ම විවිධ හේතු පාදක කර ගනිමින් ඇතැම් පුද්ගලයන් විසින් දරුවන්ට විවිධ කායික හා මානසික පීඩාවන් සිදු කරනු ලබයි. ළමයා යනු නිරන්තරවම නව්‍යතාවයකින් යුත් දේ ගවේෂණය කරමින් අත්දැකීම් ලබන කණ්ඩායමක් වන හෙයින් දෙමාපියන් විසින් දරුවන් කෙරෙහි විශේෂ අවධානයකින් පසුවිය යුතුය. එසේ නොවන විට දරුවන් විවිධාකාරයේ අනතුරුවලට පත් වේ. දෙමාපියන්ගේ අනවධානය හා නොසැලකිල්ල හේතුවෙන් දරුවන්ට විවිධ හානි සිදු විය හැකි අතර ඒවා අවම කර ගැනීමට දෙමාපියන් විසින් වගබලා ගත යුතුය. විශේෂයෙන්ම ළමුන් ගැවෙසන තැන්වල යටිතල පහසුකම් හා අවට පරිසරය ළමයකුට ජීවත්වීමට සුදුසු පරිසරයක් විය යුතුය. සමාජයේ හා නිවසේ යටිතල පහුසකම්වල අඩුපාඩු නිසාවෙන් ළමුන්ට සිදු වන හානි පිළිබඳව පුවත්පත් වාර්තා කරනු ලබන අතර එවැනි පුවත් 06ක් ලංකාදීප හා දිවයින පුවත්පත් වාර්තා කර ඇත. මෙම අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන්ට කායික හානි මෙන්ම ජිවිත හානි ද සිදු වී ඇත. විශ්ලේෂණයට පාදක කර ගත් පුවත් අතරින් අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන්ට සිදු වු හානි පිළිබඳ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී ඉන් ළමුන්ට සිදු වූ කායික හානි හා ජිවිත හානි පිළිබඳව පහතකාරයට දැක්විය හැකිය.

වගු අංක 3.5.2 අනාරක්ෂිතභාවය හේතුවෙන් සිදු වූ කායික හානි හා ජිවිත හානි

| **අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන්ට සිදු වු හානි** | **දිවයින** | **ලංකාදීප** | **මුළු පුවත් සංඛ්‍යාව** |
|---|---|---|---|
| කායික හානි | 01 | 02 | **03** |
| ජිවිත හානි | 03 | 07 | **10** |

**මුලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව** 2017

අනාරාක්ෂිතභාවය හේතුවෙන් ළමුන්ට සිදු වූ හානි පිළිබඳව අවධානය යොමු කිරීමේ දී කායික හානි සිදු වූ පුවත් 03ක් වාර්තා වන අතර ජීවිත හානිවීම් පිළිබඳ පුවත් 07 ක් වාර්තා වේ. මේ අනුව පැහැදිලි වනුයේ ළමුන්ගේ ජීවිත කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකිරීම තුළ ළමුන්ට විවිධ ආකාරයේ හානි සිදු විය හැකි බවය.

### 3.6 අනතුරු හේතුවෙන් ළමුන්ට සිදුවන හානි

සමාජය තුළ අනතුරු විවිධ ආකාරයට සිදු විය හැකිය. එහිදී ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි අනතුරු වනුයේ මාර්ග අනතුරු හා ස්වභාවික අනතුරුය. 2017 මාර්තු මාසයේ දිවයින හා ලංකාදීප යන පුවත්පත් දෙවර්ගය තුළ ළමුන්ට සිදු වූ අනතුරු පිළිබඳ පුවත් 16ක් වාර්තා කර ඇත. එම පුවත්හි ස්වභාවය පහතාකාරයට දැක්විය හැකිය.

වගු අංක 3.6.1 ළමුන්ට සිදු වූ අනතුරුවල ස්වභාවය

| **ළමුන් ට සිදු වූ අනතුරුවල ස්වභාවය** | **දිවයින** | **ලංකාදීප** | **මුළු පුවත් සංඛ්‍යාව** |
|---|---|---|---|
| මාර්ග අනතුරු | 02 | 04 | 06 |
| ස්වභාවික අනතුරු | 02 | 04 | 06 |
| වෙනත් | 0 | 04 | 04 |

**මුලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව 2017**

රියපැදවීමේ දී රියදුරාගේ වරදින් හා පදිකයන්ගේ වරදින් සිදු වන විවිධාකාරයේ අනතුරු මාධ්‍ය තුළ වාර්තා වේ. මාර්ගය තුළ දී ළමුන් මුහුණ දුන් අනතුරු පිළිබඳ පුවත් 06ක් වාර්තා වේ. වර්තමාන සමාජයේ මාර්ග අනතුරු සිදුවීමේ වැඩි ප්‍රවණතාවයක් දක්නට ඇත. ශ්‍රි ලංකා සමාජයේ මාර්ග නීති පද්ධතිය විධිමත් තත්ත්වයට ගොඩනගමින් මාර්ග නීති උල්ලංඝණය කරනු ලබන පුද්ගලයන් සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. ස්වභාවික අනතුරු සිදුවීම් නිසාවෙන් ළමුන්ට සිදු වූ අනතුරු 06ක් වාර්තා වේ. ස්වභාවික අනතුරු වශයෙන් හඳුනාගත හැකි වූයේ පස් කඳුවලට යටවීම, තාප්පය කඩා වැටීමෙන් ඊට යට වීම, අනාරක්ෂිත

ළිංවලට වැටීම් ආදී පුවත් වාර්තා වී ඇත. මෙම අනතුරු හේතුවෙන් ළමුන්ට කායිකව හානි සිදු වූ ප්‍රමාණය හා ජිවිත හානි සිදු වූ ප්‍රමාණය පහත ආකාරයට දැක්විය හැකිය.

වගු අංක 3.6.2 අනතුරු හේතුවෙන් ළමුන්ට සිදු වූ කායික හානි හා ජිවිත හානි

| **අනතුරු හේතුවෙන් ළමුන් ට වන හානි** | **දිවයින** | **ලංකාදීප** | **මුළු පුවත් සංඛ්‍යාව** |
|---|---|---|---|
| කායික හානි | 1 | 4 | 05 |
| ජිවිත හානි | 4 | 7 | 11 |

**මුලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව 2017**

ස්වභාවික අනතුරුවලට හා මාර්ග අනතුරුවලට පත්වීම හේතුවෙන් ළමුන් මුහුණපාන ලද අනතුරුවලින් කායික හා ජිවිත හානි සිදුවීම් පිළිබඳව වගු අංක 3.6.2 හි සඳහන් කර ඇත. එහිදී අනතුරුවලට මුහුණ දුන් ළමුන්ගෙන් කායික හානි සිදුවීම් සම්බන්ධ පුවත් 05ක් වාර්තා වී තිබෙන අතර වැඩි වශයෙන් වාර්තා වනුයේ අනතුරුවලට මුහුණ දීම හේතුවෙන් ජිවිත හානිවීම් සම්බන්ධ පුවත් ය. මාර්ග අනතුරුවීම් සම්බන්ධ පුවත් 06ක් වාර්තා වන අතර එම අනතුරුවලට මුහුණ දුන් සියලුම ළමුන් මියගොස් ඇති බව වාර්තා වේ. ජිවිත හානි සිදුවීම් සම්බන්ධ සෙසු පුවත් වනුයේ අනාරක්ෂිත ළිංවලට වැටීම, නිවසේ බිත්තියක් කඩා වැටීම, යටිතල පහසුකම් අනාරක්ෂිතව ඉදි කර තැබීම් නිසාවෙන් සිදු වූ අනතුරුය.

සමස්තයක් වශයෙන් බලන කළ මෙම අනතුරු සිදු ව ඇත්තේ පවුල හා සමාජය තුළ පවතින වගකීම් සහිතව කටයුතු නොකිරීම, අනවධානය, අනාරක්ෂිතබව ආදී හේතු නිසාවෙන්ය. මෙම අනතුරු වළක්වා ගත හැකි මට්ටමේ අනතුරු බව පුවත් අන්තර්ගතය තුළින් ඉස්මතු වේ.

### 3.7 ළමුන්ගේ චර්යාමය ගැටළු

ළමා චර්යාව ධනාත්මක හා නිශේධාත්මක විය හැකිය. ලංකාදීප හා දිවයින පුවත්පත් ද්විත්වයෙහි ළමුන්ගේ චර්යාමය ගැටළු පිළිබඳව වාර්තා කර ඇත. එහිදී

2017 මාර්තු මාසයේ දිවයින හා ලංකාදීප පුවත්පත් ද්විත්වයෙහි චර්යාමය ගැටළු වශයෙන් ප්‍රධාන කාණ්ඩයන් ද්විත්වයක් හඳුනාගත හැකිය. එහිදී පාසල තුළ දී සිදු කරනු ලබන අපගාමි චර්යාවන් හා සොරකම් කිරීම් සම්බන්ධයෙන් වාර්තා කර ඇත. ළමුන්ගේ චර්යාමය ගැටළු ප්‍රමාණාත්මකව පහතින් දක්වා ඇත.

වගු අංක 3.7.1 ළමුන්ගේ චර්යාමය ගැටළු

| **ළමුන්ගේ චර්යාමය ගැටළු පුවත්පත් හි වාර්තා වූ අයුරු** | **දිවයින** | **ලංකාදීප** | **මුළු පුවත් සංඛ්‍යාව** |
|---|---|---|---|
| පාසල තුළ දී සිදු කරනු ලබන අපගාමී චර්යාවන් | 03 | 0 | 03 |
| සොරකම් කිරීම් | 0 | 01 | 01 |
| වෙනත් | 01 | 0 | 01 |

**මූලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව 2017**

පාසල තුළ දී සිදු කරනු ලැබූ අපගාමි චර්යාවන් වශයෙන් වාර්තා කර ඇත්තේ පාසල් විනය පද්ධතිය ඉක්මවා යමින් හැසුරුණු පාසල් සිසුන් සම්බන්ධවය. එහිදී අවිනීත චර්යාවන් හේතුවෙන් පාසල් ළමුන්ට හිංසා කිරීම් හා පාසල් පරිපාලනයට බාධාවක් වෙමින් හැසිරීම් පිළිබඳව වාර්තා කර ඇත. ළමුන්ගේ චර්යාමය ගැටළු වශයෙන් වාර්තා වී තිබූ සෙසු පුවත් වනුයේ සොරකම් කිරීමක් සම්බන්ධවය.

දරුවකු තුළ චර්යාමය ගැටළු ඇතිවීම කෙරෙහි විවධ හේතු බලපානු ලබයි. චර්යාමය ගැටළු ඇතිවීම කෙරෙහි සාමාජානුයෝජනය බලපානු ලබයි. දරුවකු මුලිකව ම සමාජානුයෝජන පියවර ආරම්භ කරනු ලබන්නේ පවුල තුළින් ය. පවුල තුළින් දෙමාපිය ආභාසයෙන් දරුවකු සමාජයේ ජීවත් විය යුතු ආකාරය ඉගෙන ගනී. එහෙත් එය නිවැරදිව ඉටු නොවන විට දරුවන් තුළ අපගාමී චර්යාවන් ගොඩනැගීමට ඉඩ තිබේ. අපගාමී චර්යාව වර්ධනය වී අපරාධ සිදුකරන තත්ත්වයට පත්වේ. පවුල් සංස්ථාව තුළ සමාජානුයෝජනය වන දරුවා වැඩිහිටියන්, ගුරුවරු, දෙමව්පියන් යනු කවුරුන් ද පිළිබඳ අවබෝධයක් ලබන අතර ඔවුන්ට ගෞරව කිරීමට, කීකරුවීමට පවුල් තුළින් ම පුහුණුවක් ලබාදිය යුතු ය. එම පුහුණුව ආගමික සංස්ථාව තුළිනු ත්, අධ්‍යාපනික සංස්ථාව තුළිනු ත් තව

තවත් වැඩි දියුණු කරවනු ලබයි. කුඩා කාලයේ සිට ම වැඩිහිටියන්ගේ අවවාද, ආදර්ශ ලබන දරුවා සමාජය තුළ පරමාදර්ශීව ජීවත්වීමට අවශ්‍ය හුරුව, අභ්‍යාසය ලබයි. එහෙත් නූතන ශ්‍රී ලාංකික සමාජය තුළ දෙමාපියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරුන්ට අවනත නොවන දරුවෝ ජීවත් වෙති. බොහෝවිට සමාජ ගුණධර්ම ඉගෙනීමට ඉහත ප්‍රජාව ඉතා වැදගත්ය. එහෙත් ගුණධර්ම නොඅසමින් සමාජ විරෝධී ක්‍රියා සිදු කරන දරුවෝ සිටිති. දුම්පානය, සොරකම, පාසල් නොයෑම, රණ්ඩු කර ගැනීම වැරදි ක්‍රියා බව තේරුම් ගනුයේ සමාජයේ ජීවත් වීමෙනි. නූතන ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී ප්‍රජාව ජීවත්වන ප්‍රදේශවල ජීවත් වන අඩු වයස් දරුවන් දුම්පානය කිරීම, සොරකම, රංචු ගැසීම, රණ්ඩු කිරීම, පාසල් අතහැර යෑම සිදුවේ. සමාජ පරිසරයට අනුගතවීම නිසා මෙම තත්ත්වය ඇතිවේ. කුඩා කාලයේ සිට දරුවන් සමාජගත කිරීමේ දී ඉතා ප්‍රවේසම් විය යුතුය. විශේෂයෙන්ම මේ පිළිබඳව සැළකිලිමත් විය යුතු පාර්ශවය වන්නේ දෙමාපියන්ය. පවුල තුළින් දරුවාට ගුණධර්ම කියා දී අනෙකුත් සමාජවලින් ද ආදර්ශ ලබා හොඳ හැදියාවකින් යුත් දරුවකු බිහිවීමට අවශ්‍ය මාර්ගෝපදේශය ලබා දිය යුතුය. එලෙස සිදුනොවන විට දරුවා හොඳ නරක හඳුනා නොගෙන ක්‍රියා කරනු ලැබේ. දරුවකුට දිගින් දිගටම ඇසුරට ලැබෙන්නේ සමාජ විරෝධි ක්‍රියා සිදුකරන පිරිස් වේද, එම දරුවා ද එම ක්‍රියාවලට අනුගතව අපරාධකාමී ක්‍රියා සිදුකරනු ලබයි. ඒ අනුව දරුවා අපරාධකරුවෙකුවීම කෙරෙහි ඍජුව හෝ වක්‍රව බලපෑම් කරනු ලැබුවේ සමාජයයි. දරුවකු උපතින් දරුවකු මිස අපරාධකාරයෙකු ලෙස හැඳින්විය නොහැකිය.

පාසල් දරුවා සමාජගතවීමේ දී නිවැරදි මාර්ගෝපදේශනය ලබාදෙන වැදගත් ආයතනයක් වේ. පාසල තුළින් ද දරුවන්ට හොඳ නරක කියා දෙමින් ශාස්ත්‍ර ඥානය ලබාදෙයි. විශේෂයෙන්ම හොඳ දේ අගය කරමින් එය දිගින් දිගටම එය සිදුකිරීමට කරුණු පහදා දෙනවා සේම, යම් අයහපත් වැරදි ක්‍රියාවල දී සමාජය ලබාදෙන දඬුවම, ඔවුන් සමාජය විසින් අගය නොකරන බව කියා දෙමින් දරුවන් අයහපතෙන් ඈත් කිරීමට කටයුතු කරයි. පාසල් සංස්ථාව තුළ සම වයස් කණ්ඩයාමක් සමඟ කටයුතු කරනු ලබන ආකාරය පාසල තුළින් දරුවන්ට පහදා දෙයි. සමගිව අදහස් හුවමාරුව, කණ්ඩායමක් සමඟ එකට වැඩ කිරීම ආදී ලෙස සමාජය තුළ අන්තර් සම්බන්ධතා පැවැත්වීමේ දී ඉතා වැදගත් සාරධර්ම, යහපත් චර්යාත්මක ඇගයුම් පාසල තුළින් ලබා දෙයි. පාසල තුළ දී නිවැරදි ව

සමාජානුයෝජනය නොවන දරුවා, පවුල තුළින් ද නිවැරදිව අනුනයනය නොවන විට අපරාධ කිරීමට ඉඩ ඇත.

### 3.8 ළමා හිමිකම් කඩකිරීම්

සමාජ සත්ත්වයෙකු වශයෙන් උපත ලබන සෑම පුද්ගලයෙකුටම මිනිසකු වශයෙන් ජීවත්වීමට අවශ්‍ය හිමිකම් සමාජය විසින් නිර්ණය කර ඇත. එහෙත් සමාජ ක්‍රියාකාරිත්වය තුළ පුද්ගලයන්ගේ හිමිකම් කඩකිරීම් සම්බන්ධව වාර්තා වේ. 2017 මාර්තු මාසය තුළ දී පළ වූ දිවයින හා ලංකාදීප පුවත් පත් ද්විත්වයෙහි ළමා හිමිකම් කඩකිරීම් සම්බන්ධ පුවත් වාර්තාවී තිබුණ අතර එය සංඛ්‍යාත්මකව පහත පරිදි දැක්විය හැකිය.

වගු අංක 3.8.1 ළමා හිමිකම් කඩකිරීම්

| **ළමා හිමිකම් කඩවීම් පුවත්පත්වල වාර්තා වූ අයුරු** | **දිවයින** | **ලංකාදීප** | **මුළු පුවත් සංඛ්‍යාව** |
|---|---|---|---|
| ලිංගික හිංසා කිරීම් | 08 | 04 | 12 |
| ඝාතනය කිරිම් | 02 | 03 | 05 |
| පහර දීම් | 0 | 01 | 01 |
| බලපෑම් කිරීම් (විවාහයන්/සැත්කම් කිරීම්) | 04 | 03 | 07 |
| වෙනත් | 10 | 06 | 16 |

**මූලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව 2017**

ළමා හිමිකම් කඩවීම් සම්බන්ධ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී වැඩි වශයෙන් වාර්තා වනුයේ ලිංගික හිංසා කිරීම් සම්බන්ධවය. ළමුන් අනාරක්ෂිතවීම මෙයට ප්‍රධානම සාධකයක් වශයෙන් හඳුනාගත හැකිය. ලිංගික හිංසා කිරීම් සම්බන්ධව වාර්තාවන පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී අනාවරණය වනුයේ දරුවන් විවිධ දේ පවසමින් රැවටීමත්, බලහත්කාර අයුරින් ලිංගික හිංසාවන් සිදු කිරීමත් සිදු කර ඇති බවයි. ළමුන් ඝාතනය කිරීම් සම්බන්ධව පුවත් 05ක් වාර්තා

වන අතර එහිදී අනියම් සම්බන්ධතාවයන්ගේ ප්‍රතිඵලයක් හේතුවෙන් ළමුන් ඝාතනය කිරීම් හා පවුල් ආරවුල් හේතුවෙන් ඇති වූ ගැටුම් හේතුවෙන් සිදු වූ ඝාතනයන් වාර්තා කර ඇත. ළමුන්ට සිදු වූ බලපෑම් කිරීම් සම්බන්ධ පුවත් 07ක් වාර්තා වන අතර එහිදී බලපෑම් සහගතව විවාහයන් කරවීම් සම්බන්ධ පුවත් හා කැමැත්ත නොවිමසා සැත්කම් කිරීම් සම්බන්ධ පුවත් වාර්තා වේ.

සෑම මනුෂ්‍යයකුම විවධ අවශ්‍යතාවයන් සහිතව උපත ලබයි. සමාජයක තනිව වාසය කළ නොහැක. පුද්ගලයකු තනිව සමාජයේ ජීවත්වනවා යැයි පවසන්නේ නම් එය පැහැදිලි අසත්‍යයකි. සමාජය සංවිධානයවීමේ දී ජාලගත සම්බන්ධතාවයන්ගෙන් සුසංවිධිතව ගොඩනැගී ඇත. උපතේ සිට මිය යන තෙක් පුද්ගලයා විවිධ අවශ්‍යතා ප්‍රහර්ෂණය කර ගනි. ආදරය, ආරක්ෂාව, ආහාර, අධ්‍යාපනය ආදී ප්‍රමුඛ අවශ්‍යතා වන අතර එම අවශ්‍යතා කුඩා කාලයේ සිට නොලැබෙන විට කුඩා කාලයේ සිට සිත තුළ කේන්තිය, වෛරය, ඊර්ෂ්‍යාව වැනි පුද්ගල අගතිගාමී දේ ඇතිවේ. මෙම තත්ත්වයන් තුළ කුඩා දරුවන් අපරාධ කිරීමට හුරුවේ. ලාංකීය සමාජයේ මව්වරුන් විදේශගතවීම නිසා මෙම තත්ත්වය ඇති වන ආකාරය හඳුනාගත හැකිය. කුඩා කාලයේ දරුවන් දෙමාපියන් සමඟ ඉතා කිට්ටුවෙන් ඇසුරට පත් වේ. මෙය යම් ආකාරයකට දුරස් වනුයේ දරුවා සමාජ ගතවීමේ දී විවිධ සමාජ කණ්ඩායම් හඳුනා ගැනීමෙනි. එහෙත් එය පුළුල් මට්ටමකින් සිදු නොවේ. දෙමාපියන් විදේශගතවීමේ දී දරුවාට ආදරය, ආරක්ෂාව, ආහාර, අධ්‍යාපනය ආදී අවශ්‍යතා ඉටු වෙනුයේ වෙනත් අයෙකු අතින්ය. එවැනි අවස්ථාවලදී ඇතැම් විට දරුවන්ගේ අවශ්‍යතා ඉටු නොවන විට දරුවන් අපරාධ ක්‍රියා සිදුකිරීමට පෙළඹේ.


දෙමාපියන් විදේශගත වනවිට ඔවුන්ගේ දරුවන් ආත්තම්මාට, සීයාට භාරදීම හෝ ඥාතියෙකුට භාර දී යති. එහෙත් ඔවුන් එය භාර දීම සිදු කරනුයේ අවබෝධයකින් තොරව විය හැකිය. කෙසේ හෝ දරුවන් හිතවතුන්ට භාර දී විදේශගත වන දෙමව්පියන් දරුවන්ට අහිමි වන දේ ගැන නොසිතයි. බොහෝවිට දෙමාපිය සෙනෙහස ලබාදීමට එම දරුවන් භාරගත් පාර්ශවය අපොහොසත් වේ. ටික කාලයක් ගතවන විට එම දරුවන් ඔවුන්ගේ නිවස තුළ වාසය කිරීම ඔවුනට කරදරයක් ලෙස සළකයි. ඉන්පසු එම දරුවන්ට නියමිත ලෙස ආහාර නොදී සිටීම, රැකවරණය ලබා නොදීම සිදු කරයි. එම දරුවන්ගේ අධ්‍යාපනය ගැන සොයා

නොබලයි. මෙවැනි දේ දිගින් දිගටම දරුවන්ට සිදු කිරීම නිසා දරුවන්ගේ අවශ්‍යයෙන්ම ලැබිය යුතු අවශ්‍යතා මඟ හැරී යයි. එවැනි තත්ත්වයක් තුළ දරුවන් අකීකරු දේ සිදුකරයි. කුසගින්න දැනෙන විට ගෙදරින් මුදල් සොරකම් කර හෝ කඩයකින් කුඩා දේවල් සොරකම් කරගෙන ආහාර අවශ්‍යතා ඉටුකර ගනියි. පොඩි පොඩි දේ සොරකම් කර පුරුදු වූ විට ගෙදර දී, කඩයක දී, පාසලේ දී සොරකම් කිරීමට පෙළඹේ. එවැනි අවස්ථාවල දී එම දරුවන් මිතුරන්ගෙන්, පාසලේ ගුරුවරුන්ගේ අප්‍රසාදයට ද, කොන් කිරීමට ද ලක්වුවහොත් එම දරුවන් පාසලෙන්, අධ්‍යාපනයෙන් ඈත් වීමට උත්සාහ දරයි. මෙවැනි දේ සිදුවෙන විට දරුවන් අපරාධකරුවන් ලෙස සමාජය අර්ථ නිරූපණය කරයි. එලෙස සමාජය විසින් දරුවන් අපරාධකරුවන් යැයි හඳුන්වනුයේ දරුවන් කරන ලද වරදට බව සත්‍යයකි. එහෙත් එම වැරදි ක්‍රියා සිදුකිරීමට අවශ්‍ය පසුබිම සකස් කරනු ලැබුවේ පවුල තුළින්, පාසල තුළින් දරුවන්ගේ මූලික අවශ්‍යතා ඉටු නොවීම නිසාය.

ලාංකීය සමාජය තුළ දරුවන්ගේ මූලික අවශ්‍යතා ඉටු නොවීමට බලපාන තවත් එක් කරුණක් වනුයේ බිඳුණු පවුල් බිහිවීමය. විශේෂයෙන්ම මව පියාගෙන් දික්කසාද වීම, මව හෝ පියා යන දෙදෙනාගෙන් කෙනෙකු මිය යෑම ආදී තත්ත්වයන් ලදී දුප්පත් පවුල්වල දරුවන්ගේ අවශ්‍යතා ඉටු කරදීමට අපොහොසත් වනවිට දරුවන් තුළ ආක්‍රමණකාරී ස්වභාවයන් නිර්මාණය වේ. තවද මව හෝ පියා දික්කසාදයෙන් පසුව හෝ මව හෝ පියාගෙන් කෙනෙකු මිය ගිය විට එම අඩුව පිරවීමට නැවත විවාහයක් කර ගැනීම හරහා මුල් විවාහයේ දරුවන්ට අසාධාරණකම් වන අවස්ථා බොහෝය. තම බිරිඳ මියගිය විට දරුවන්ගේ අවශ්‍යතා ඉටුකරදීමට තවත් විවාහයක් කර ගන්නා පියා, සිය පළමු විවාහයේ දරුවන් තම අලුත විවාහයේ බිරිඳට භාර කරති. එහෙත් කල්යත්ම මෙවැනි විවාහය සිදු වන පවුල්වල පළමු විවාහයේ දරුවන්ට විශාල අසාධාරණකම් සිදුවීමට ඉඩ ප්‍රස්ථාවන් සුලභය. දෙවන විවාහක කාන්තාවට දරුවන් සිටින විට මෙම තත්ත්වය තවත් උග්‍ර තත්වයට පත්වීමට හැක. බොහෝ විට එබඳු අවස්ථාවලදී පළමු විවාහයේ කුඩා දරුවන් කුඩම්මාගේ වද හිංසාවලට ගොදුරුවේ. එම දරුවන් ලවා ගේ දොර වැඩ කරවා ගැනීමට උත්සාහ දැරීම, පාසල් නොයවා ගෙදර වැඩ කරවා ගැනීම ආදී කුඩා දරුවන්ගේ වයසට මනසට නොසරිලන දේ සිදුවුවහොත් ඒ හරහා දරුවන් තුළ වෛරී සිතුවිලි හටගෙන අපරාධ ක්‍රියා කිරීමට පෙළඹේ. මෙයට හේතු වනුයේ දරුවන්ගේ අවශ්‍යතා ඉටු නොවිමය. දෙමාපිය ආදරය සෙනෙහස තිබෙන විට

දරුවන් දෙමාපියන්ට සමීපව ආදරය ලබමින් හොඳ නරක හඳුනා ගනී. එය සිදුනොවන විට දරුවෝ අපරාධ ක්‍රියා සිදු කිරීමට ඉඩ තිබේ.

ඉහතාකාරයේ තත්ත්වයන් තුළ දරුවන් අපරාධකරුවන් බවට පත්වනුයේ දරුවන්ගේම වැරදි නිසා නොව, මාස්ලෝ අවශ්‍යතා ධූරාවලියක් හරහා ඉදිරිපත් කරන ලද පුද්ගලයකුට අවශ්‍ය අවශ්‍යතා අහිමි වීම නිසා බව වටහා ගත හැක. මාස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද එම අවශ්‍යතා ධූරාවලිය දුප්පත්, පොහොසත් සියලු දරුවන්ට අවශ්‍ය වන්නේය. එම අවශ්‍යතා පවුල තුළින් ඉටුවිය යුතු ඒවාය. එහෙයින් බාල අපරාධවලට එක් හේතුවක් වන අවශ්‍යතා ඉටු කර ගැනීමට නොහැකිවීම නිසා බාල අපරාධකරුවන් බිහිවන බව මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය තුළින් අවබෝධ කර ගත හැකිය. මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය පහතාකාර වේ.




රූප සටහන 01 මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය

ඉහත මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය තුළින් පුද්ගලයෙකුගේ ප්‍රාථමික අවශ්‍යතාවයේ සිට ජීවිතය සාර්ථකත්වයට පත්වන ආකාරය ප්‍රත්‍යක්‍ෂ කර ගත හැක. එකී අවශ්‍යතා ඉටු නොවන විට දරුවන් තුළ ආක්‍රමණකාරී තත්ත්වයන් ඇති විය හැකිය. මෙයින් තහවුරු වන්නේ ළමා අවශ්‍යතා ඉටු නොවන විට බාලාපරාධ සිදුවෙන බවය. සමකාලීන ශ්‍රී ලංකාවේ මේ තත්ත්වය වර්ධනය වන ආකාරයක් පවතී.

### 3.9 පරිසරය සම්බන්ධව පළ වූ පුවත් සංඛ්‍යාව

මානවයා පරිභෝජනය කරනු ලබන්නේ පරිසරයේ තිබෙන භෞතික හා අභෞතික වස්තූන්ය. පරිසරය යනු අප අවට ඇති භෞතික හා භෞතික නොවන සියල්ලන්ගෙන් සමන්විත වන වට පිටාවයි. ජීවියෙකුගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍යයෙන්ම ජෛව විවිධත්වයෙන් යුතු ස්වාභාවික පරිසරයක් තිබිය යුතුමය. මානවයා හා පරිසරය අයථාකාරයෙන් භුක්තිවිඳීම හේතුවෙන් පාරසරික ගැටළු රැසක් නිර්මාණය වී තිබේ. පාරිසරික ගැටලු හඳුනා ගැනීම හා ඒවාට සුදුසු විසඳුම් සෙවීම සම්බන්ධයෙන් සාමාජයීය විද්‍යාඥයන්ගේ කාර්යභාරයේ ඇති වැදගත්කම සඳහා පාරිසරික ක්ෂේත්‍රයේ පිළිගැනීමක් හිමි විය. පාරිසරික ගැටළු පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීම පිළිබඳ සලකා බලනවිට ඒවා ස්වභාවයෙන්ම ඇති වූ ඒවා නොවන බව පෙනී යයි. එම ගැටළු බොහෝවිට විවිධ පුද්ගලයන් විසින් හෝ යම් යම් සංවිධාන තුළින් ඉස්මතු කර දක්වන ඒවා ලෙස සැලකිය හැකිය. පරිසරය සම්බන්ධයෙන් 2017 මාර්තු මාසයේ දිවයින හා ලංකාදීප යන පුවත් පත් ද්විත්වයෙහි වාර්තා වූ පුවත් පහත 3.9.1 වගුව තුළ දක්වා ඇත.

වගු අංක 3.9.1 පරිසරය සම්බන්ධව පළ වූ පුවත්

| පුවත් තේමාව | දිවයින | ලංකාදීප | මුළු පුවත් සංඛ්‍යාව |
|---|---|---|---|
| අලි මිනිස් ගැටුම් | 04 | 0 | 04 |
| සාගර සම්පත් විනාශයන් හා අයථා භාවිතයන් | 02 | 0 | 02 |
| ස්වභාවික සම්පත් විනාශ කිරීම් | 09 | 04 | 13 |
| පරිසර සංරක්ෂණය ආශ්‍රිත පුවත් | 05 | 0 | 05 |
| වෙනත් | 02 | 01 | 03 |

**මූලාශ්‍රය : පුවත් විශ්ලේෂණ වාර්තාව** 2017

පරිසරය සම්බන්ධව වාර්තා වී ඇති පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී වැඩි වශයෙන් වාර්තා වනුයේ ස්වභාවික සම්පත් විනාශය කිරීම් සම්බන්ධ පුවත් ය. පරිසරය ක්ෂය සම්පතක් වශයෙන් අවබෝධ කර නොගැනීම හේතුවෙන් පරිසරය දිගින් දිගටම විනාශයට පත් වේ.

### 3.10 අලි මිනිස් ගැටුම

වර්තමාන ජන සමාජයේ මිනිසා මුහුණ දෙන ප්‍රධානම පාරසරික ගැටලුවක් බවට අලි මිනිස් ගැටුම පත් වී ඇත. අලි මිනිස් ගැටුම කෙරෙහි බලපානු ලබනුයේ ජනගහනය අධික වීම, පාරිභෝජන අවශ්‍යතා සංකීර්ණ වීම, ප්‍රධාන ජීවනෝපාය ලෙස කෘෂි කර්මාන්තය පත් වීම නිසාවෙන් විශාල වශයෙන් වනාන්තර එළි පෙහෙළි කිරීම ය. පරිසරය ක්ෂය සම්පතක් වන හෙයින් ප්‍රජාවගේ මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී පරිසරයට කිසියම් බලපෑමක් කිරීමට සිදු වේ. ප්‍රජා අවශ්‍යතා සංකීර්ණ වීමත්, අවශ්‍යතා පූරණය සඳහා පරිසරික සම්පත් ප්‍රමාණවත් නොවීම නිසාවෙන් ගැටලු රැසකට මුහුණදීමට සිදුව ඇත. ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ට සාපේක්ෂව පාරිසරික සම්පත් ප්‍රමාණවත් නොවන හෙයින් වනාන්තරයේ සත්ත්ව කොට්ඨාසවල වාසස්ථාන සීමාවීම පදනම් කොට ගෙන ගැටුම් නිර්මාණය වී ඇත. මිනිසා තම අවශ්‍යතා ස්වාභාවික පරිසරය තුළින් ඉටු කර ගැනීමේ දී එයට යම් බලපෑමක් සිදු කරමින් සිය අවශ්‍යතා ඉටු කර ගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයවූයේ ස්වාභාවික පරිසරය හා මානවයා අතරත් මානවයා හා සත්ත්ව ප්‍රජාව අතරත් ගැටුම් නිර්මාණයවීමයි. පරිසරය හා මානවයා අතර ඇති වන ගැටුම් අතර ප්‍රධාන ගැටුමක් වනුයේ අලි මිනිස් ගැටුමය. අලි මිනිස් ගැටුමට ප්‍රධාන හේතුවවනුයේ මානවයා විසින් සිය මූලික අවශ්‍යතාවයන් උදෙසා වනාන්තර ප්‍රජාවට උරුම භූමිය උපයෝජනයට ගැනීමය. මෙහි ප්‍රතිඵලය වූයේ තම වාසස්ථාන අත්පත් කර ගැනීම සඳහා මානවයා සමඟ වන අලින්ට ගැටුමකට මුහුණ දීමට සිදු වීමය. මේ නිසාවෙන් වන ප්‍රජාවගේ භූමියේ නිවාස ඉදිකර ගෙන සිටින මිනිසුන්ගේ වාසස්ථාන විනාශ කිරීම, දේපොල විනාශ කිරීම, ගොවිතැන් විනාශ කිරීම ආදී නොයෙක් හානිකර තත්ත්වයන් වන අලින් විසින් සිදු කරනු ලබයි.

### 3.11 ස්වභාවික සම්පත් විනාශ කිරීම

අතීතයේ සිට වර්තමානය දක්වා සමාජ ප්‍රභවය සලකා බැලීමේ දී සමාජය සංකීර්ණත්වයට පත්ව තිබේ. අතීතයේ සරල සමාජ ක්‍රමයක් පැවතියත් වර්තමානයේ පවතිනුයේ ඉතා සංකීර්ණ සමාජ ක්‍රමයක් වේ. සරල සමාජයෙන් සංකීර්ණ සමාජයක් දක්වා සමාජ ක්‍රමය වෙනස් වනුයේ බටහිර යුරෝපා සමාජ තුළ සිදු වු ආගමික පුනරුදය, කාර්මික විප්ලවයත් සමඟ 1879 ඇති වු ප්‍රංශ විප්ලවයත් හේතුවෙන් යුරෝපා සමාජය තුළ පෙර නොවූ ආකාරයේ වෙනස්කම් රැසක් සිදුවීමත් සමඟය. මෙහි ප්‍රතිඵලයක් හේතුවෙන් සමාජයට නව නිෂ්පාදනයන් බිහිවිය. නව නිෂ්පාදනයන් සමඟ මිනිසාගේ අවශ්‍යතා සංකීර්ණත්වයට පත් වන්නට විය. මානව අවශ්‍යතා අසීමාන්තික වුවත් ඒවා තෘප්ත කර ගැනීමට වූ සම්පත් ක්ෂය වන්නට විය. ක්ෂය සම්පත් මඟින් අවශ්‍යතා පූරණය කරගැනීමට මිනිසා තරඟ වදින්නට විය. මෙලෙස මිනිසා වෙනසකට භාජනයවීමත් සමඟම මානවයා තුළ සාමූහිකත්වය වෙනුවට ආත්මාර්ථකාමීත්වය ඉස්මතු වන්නට විය. එහිදී ස්වාභාවික පරිසරය පිළිබඳව මිනිසා තුළ තිබූ ධනාත්මක ආකල්පය ද ක්‍රමයෙන් වෙනස්වීමට භාජනය විය. පරිසරය කෙරෙහි තිබූ හිතෛෂිභාවය පුද්ගලයින්ගෙන් ඉවත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ස්වාභාවික පරිසරයට ද හානි කරමින් මිනිසා පරිසරය භුක්තිවිඳින්නට විය.

පාරිසරික සංරක්ෂණය මිනිසාගෙන් ගිලිහීම හේතුවෙන් පරිසර විනාශයන් සීඝ්‍රයෙන් ඉහළ යන්නට විය. විශේෂයෙන් ම ස්වාභාවික වනාන්තර විනාශවීම, ජල උල්පත් සිඳී යාම, නාය යෑම් හා භූමි හායනය ඇතුළු ගැටළු රාශියක් උද්ගත විය. මේ නිසා මානවයා පවතින පරිසරය තුළ සම්පත් අත්පත් කර ගැනීමට තරඟකාරී අරගලයකට මුහුණ දෙන ලදී. ස්වාභාවික පරිසරය තුළ පවතින සම්පත් මානවයාට මෙන්ම සත්ත්ව කොට්ඨාසයන්ට ද භුක්තිවිඳීමේ අයිතියක් පවතී. නමුත් නූතන සංවර්ධන කාර්යයන්හි ප්‍රතිඵලයක් වශයෙන් පාරිසරික සම්පත් භුක්තිවිඳීමට හැකියාව ලැබී ඇත්තේ මානවයාට පමණි. අතීතයේ මානව සමාජය ස්වාභාවික පරිසරය සමඟ බද්ධ වී තිබුණි. සිය දෛනික අවශ්‍යතා තමා අවට පරිසරය තුළින් සොයාගත් අතර පරිසරය සමඟ ඉතා සමීප සම්බන්ධතාවයක් පවත්වා ගන්නට විය. පුද්ගලයාගේ ජීවිතය පවත්වා ගෙන යාමට ස්වාභාවික සම්පත් ඉවහල් කර ගත් අතර එම ස්වාභාවික සම්පත් අත් කර ගැනීමේ දී පරිසරයට හානිදායක

නොවන ආකාරයෙන් එය සිදු කරන ලදී. වර්තමානයේ මානවයාගේ පාරිසරික ආකල්පයන් පරිසරයට උචිත නොවීම හේතුවෙන් පරිසරයට විවිධ ආකාරයේ හානි සිදු වේ. කාර්මීකරණයත් නව සංවර්ධන සංකල්ප ඉස්මතුවීමත් මත සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමට මානවයා පෙළඹීමක් වූවා මිස පරිසරය හා එහි සිටින සත්ත්ව කොට්ඨාස ආරක්ෂා කිරීමට උනන්දුවක් නොදැක්වීම සිදු විය.

### 3.12 පරිසර සංරක්ෂණය ආශ්‍රිත පුවත්

පරිසරය විනාශයට පත්වෙමින් පවතින බව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වී තිබේ. එහෙයින් පරිසරය සංරක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. පරිසරය සංරක්ෂණය කිරීමෙහිලා විශාල මෙහෙයක් ඉටු කරනු ලබනුයේ අන්තර්ජාතික ලෝක සංරක්ෂණ සංගමයයි (IUCN). පරිසරයට විශාල වශයෙන් හානි සිදු වන්නටවූයේ කාර්මිකරණය හා නාගරීකරණය හේතුවෙන්ය. එසේම දෙවන ලෝක යුද්ධය නිමා වෙත්ම, පරිසරයට විශාල විනාශයක් සිදුවිය. පරිසරයට විශාල වශයෙන් හානි සිදු වන විට පරිසරය සංරක්ෂණය කර ගැනීමේ කතිකාවත් ආරම්භ වන්නට විය. පරිසරය සංරක්ෂණය කර ගැනීමේ අරමුණින් ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරනු ලබන ප්‍රධානතම සංවිධානය වනුයේ අන්තර්ජාතික ලෝක සංරක්ෂණ සංගමයයි. පරිසරය ආරක්ෂා කර ගැනීමේ මූලික අරමුණින් මෙම ලෝක සංරක්ෂණ සංගමය පිහිටුවා තිබේ. ලෝක සංරක්ෂණ සංගමය 1948 දී යුරෝපා රටවල පාරිසරික විද්‍යාඥයින් රැසකගේ සහභාගීත්වයෙන් ආරම්භ විය. ලෝක සංරක්ෂණ සංගමය පිහිටුවීමේ මූලික අරමුණ වනුයේ පරිසර සංරක්ෂණය ලෝකයේ ජෛව විවිධත්වය සුරැකීමත්, ස්වභාවික සම්පත් භාවිතය සාධාරණ හා තිරසාර ලෙස සිදු කිරීමට ලෝක වාසීන්ට උපදෙස්, උපකාර හා සහයෝගය ලබා දීමටත් ය. එසේම ඔවුන් විද්වතුන් හා තාක්ෂණ දැනීම හුවමාරු කර ගැනීම, පරිසර සංරක්ෂණ සම්බන්ධ නීති රීති කෙටුම්පත් සකස් කිරීමට සහාය වීම, අවදානමට ලක් වූ වඳ වූ ජීවී විශේෂ හා පරිසර පද්ධති සම්බන්ධ තොරතුරු රැස් කර රතු දත්ත පොත නිකුත් කිරීම ආදිය සිදු කරනු ලබයි. තවද ජෛව විවිධත්ව සංරක්ෂණය පිළිබඳ විවිධ ලිපි ගොනු සඟරා මුද්‍රණය කර බෙදා හැරීම ආදී විවිධ කාර්යයභාරයන් මෙම සංගමයෙන් ඉටුවේ. ලෝක සංරක්ෂණ සංගමයට අනුයුක්ත

ශ්‍රී ලාංකීය ආයතනය 1988 දී ආරම්භ කරන ලදී. රජය සමඟ ලෝක සංරක්ෂණ සංගමය අවබෝධතා ගිවිසුම 1993 දී අත්සන් කරන ලදී (කුරේ, 2006: පිටුව 37).

# හතරවන පරිච්ඡේදය

## සමාලෝචනය, නිගමන හා යෝජනා

### පරිච්ඡේදය පිළිබඳව හැඳින්වීම

විශ්ලේෂණ වාර්තාවේ සමස්ත අර්ථය මෙම පරිච්ඡේදය මඟින් අනාවරණය වේ. අධ්‍යයන වාර්තාවේ තෙවන පරිච්ඡේදය මඟින් දත්ත විශ්ලේෂණය කර ඇති අතර එහිදී 2017 මාර්තු මාසයේ දිවයින හා ලංකාදීප යන පුවත්පත් ද්විත්වයේ ළමයින් හා පරිසරය සම්බන්ධයෙන් පළ වූ පුවත් විවිධ තේමාවන් යටතේ විශ්ලේෂණයට ලක් කර ඇත.

තෙවන පරිච්ඡේදය මඟින් ළමයින් සම්බන්ධව හා පරිසරය සම්බන්ධයෙන් පළ වී තිබූ ගැටලුකාරී ස්වභාවයන්, අවධානය යොමු විය යුතු ක්ෂේත්‍රයන් පිළිබඳව, දැනුවත් කිරීම් සම්බන්ධ පුවත් පිළිබඳව ගුණාත්මක හා ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් සිදු කර ඇත.

අධ්‍යයන නිබන්ධයේ උක්ත තෙවන පරිච්ඡේදයන් මඟින් අනාවරණය වූ කරුණු අනුව අවසාන වශයෙන් එළඹිය හැකි නිගමනයන් පිළිබඳව සිව්වන පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කර ඇත. තවදුරටත් පුවත් වාර්තා කිරීමේ දී ඉදිරිපත් කිරීමේ දී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හා කරුණු යෝජනා වශයෙන් දක්වා ඇත.

ඒ අනුව අධ්‍යයනයේ සමස්තය සැලකිල්ලට ගනිමින් හතරවන පරිච්ඡේදය තුළ අධ්‍යයනය මඟින් අනාවරණය වූ කරුණු හා නිගමනයන් ද, ඉදිරි සැලසුම් හා ව්‍යාපෘතීන් සඳහා යෝග්‍යවන යෝජනාවන් ද ඉදිරිපත් කර ඇත.

## 4.1 සමාලෝචනය

රටේ යම් ස්ථානයක සිදුවන සිදුවීමක් එසැණින් වාර්තා කිරීමට වර්තමානයේ තාක්ෂණය දියුණු තත්ත්වයක පවතී. වර්තමාන සමාජයේ පුවත් වාර්තාකරණය ආකාර කිහිපයකට අනුව සිදුවේ. එය විද්‍යුත් හා මුද්‍රිත වේ. විද්‍යුත් මාධ්‍ය මඟින් එසැණින් පුවත් වාර්තා කිරීමේ හැකියාව පවතින අතර මුද්‍රිත මාධ්‍යයට එසේ හැකියාවක් නොමැත. එසේම මුද්‍රිත මාධ්‍ය මඟින් වාර්තා කරනු ලබන පුවත් හා තොරතුරු පළවීමට යම් කාලයක් ගත වන හෙයින් විශ්වාසවන්තව හා විස්තරාත්මකව පුවත් ඉදිරිපත් කිරීමේ හැකියාව හිමි වේ. විශ්වාසවන්තව හා විස්තරාත්මකව පුවත් ඉදිරිපත් කරනු ලබන මුද්‍රිත මාධ්‍ය මඟින් 2017 මාර්තු මාසයේ පළ වු දිවයින හා ලංකාදීප යන පුවත් පත්හි ළමයින් හා පරිසරය සම්බන්ධව පළ වූ පුවත් ඇසුරෙන් මෙම විශ්ලෙෂණ වාර්තාව සකස් කර ඇත.

පුවත් විශ්ලේෂණ වාර්තාව සඳහා ප්‍රධාන වශයෙන් ළමයින් සම්බන්ධ පුවත් හා පරිසරය සම්බන්ධ පුවත් විශ්ලේෂණයට ලක් කරන ලදී. සමාජයේ වැඩි අවධානයක් යොමුව ඇති ප්‍රජා කණ්ඩායමක් වශයෙන් ළමයින් හඳුනා ගත හැකිය. වර්තමාන සමාජයේ වැඩි වශයෙන් හිංසනයන්ට ගොදුරුවන මානව කණ්ඩායමක් වශයෙන් ද ළමා කණ්ඩායම හඳුනාගත හැකිය. විශේෂයෙන් ම කායිකව හා මානසිකව ළමුන්ව විවිධ හිංසනයන්ට ගොදුරුවීම නූතනයේ ප්‍රබල සමාජ ගැටළුවක් වේ. ළමයින් සම්බන්ධ ගැටළු මෙන් ම පරිසරය ද වර්තමානයේ අභියෝගයට ලක්ව ඇත. නූතන මානවයාගේ ප්‍රාථමික අවශ්‍යතා මෙන්ම ද්විතියික අවශ්‍යතා පරිසරය තුළින් ඉටු කර ගත්ත ද, පරිසරය කෙරෙහි අවධානය යොමුවීම සීමා වන්නට විය. මිනිසාගේ අවධානය පරිසරය කෙරෙහි යොමු නොවන විට පරිසරය තුළ සිදුවන වෙනස්වීම්, පරිසර විනාශයන් හා මානවයා හා පරිසරය අතර පවතින සම්බන්ධතාව අවබෝධ කර ගැනීමට නොහැකි වේ. එම තත්ත්වය තුළ මානව ක්‍රියාකාරකම් තුළින් පරිසරය විනාශයට පත්වේ.

2017 මාර්තු මාසයේ පළ වූ දිවයින හා ලංකාදීප යන් පුවත්පත් ද්විත්වයෙහි ළමයින් සම්බන්ධව පළ වූ පුවත් අතර ළමා ලිංගික හිංසනයන් සම්බන්ධව, ළමා ඝාතනයන් සම්බන්ධව, අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් මුහුණපාන ගැටලු, අනතුරු හේතුවෙන් ළමුන්ට සිදුවන හානි, ළමුන්ගේ චර්යාමය ගැටලු, ළමුන්ගේ

දක්ෂතා හා ඇගයුම් සම්බන්ධව පළ වූ පුවත් විශ්ලේෂණයට ලක් කර ඇත. පරිසරය සම්බන්ධයෙන් පළ වූ පුවත් අතර අලි මිනිස් ගැටුම්, සාගර සම්පත් විනාශයන් හා අයථා භාවිතයන්, ස්වභාවික සම්පත් විනාශ කිරීම්, පරිසර සංරක්ෂණය ආශ්‍රිත පුවත් පාදක කර ගනිමින් විශ්ලේෂණයට ලක් කර ඇත.

පුවත් විශ්ලේෂණ වාර්තාවට පාදක වූ පුවත් දෙස අවධානය යොමු කිරිමේ දී ළමුන් සම්බන්ධ පුවත් වාර්තාවීමේ වැඩි පුවණතාවයක් දක්නට ලැබේ. විශේෂයෙන් ම ළමයින් සම්බන්ධව පළ වූ පුවත් අතර ළමා හිමිකම් කඩකිරීම් සම්බන්ධ පුවත් වැඩිවශයෙන් වාර්තා වී තිබේ. සමාජය තුළ ළමුන් අනාරක්ෂිතවීමේ ස්වභාවයක් මෙම පුවත් දෙස අවධානය යොමු කිරීමේදී අනාවරණය වේ.

## 4.2 නිගමනය

විශ්ලේෂණයට ලක් කරන ලද මුළු පුවත් සංඛ්‍යාවෙන් වැඩි වශයෙන් වාර්තා වනුයේ ළමුන් සම්බන්ධ පුවත් වන අතර, පරිසරය සම්බන්ධයෙන් වාර්තාවන පුවත් සංඛ්‍යාව ඉතා සීමිතය. විශ්ලේෂණය සඳහා පුවත් 92 ක් පාදක කර ගත් අතර ඉන් ළමයින් සම්බන්ධව පළ වූ පුවත් සංඛ්‍යාව 67 ක් වන අතර, පරිසරය සම්බන්ධයෙන් පළ වූ පුවත් සංඛ්‍යාව 25 ක් වේ. මාර්තු මාසයේ පළ වූ දිවයින පුවත් පතේ ළමයින් සම්බන්ධව පළ වූ පුවත් සංඛ්‍යාව 34 ක් වන අතර, ලංකාදීප පුවත් පතේ පළ වූ පුවත් සංඛ්‍යාව 33 ක් වේ. ඒ අනුව නිගමනය කළ හැකි වන්නේ පුවත් පත් ද්විත්වයෙහි ම සමාන අයුරින් ළමයින් සම්බන්ධ පුවත් වාර්තා වේ. පරිසරය සම්බන්ධයෙන් පළ වූ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී දිවයින පුවත් පතේ පරිසරය සම්බන්ධව පුවත් 20 ක් වාර්තා වන අතර ලංකාදීප පුවත් පතේ පරිසරය සම්බන්ධව පුවත් 05 ක් පමණක් වාර්තා වේ. ඒ අනුව ලංකාදීප පුවත් පතේ පරිසරය සම්බන්ධයෙන් පුවත් වාර්තා වනුයේ සීමිත වශයෙනි. පුවත් පත් ද්විත්වයෙහිම ළමුන් සම්බන්ධ පුවත් වාර්තා කිරීමට වැඩි ප්‍රමුඛතාවයක් දී තිබේ.

අධ්‍යයනයට ලක් කරන ලද 2017 මාර්තු මාසයේ ළමයින් හා පරිසරය සම්බන්ධව පුවත් දෙස අවධානය යොමු කිරීමේදී අනාවරණය වනුයේ වැඩි වශයෙන් පුවත් වාර්තා වනුයේ යම් නිශේධාත්මක හෝ ඛේදනීය ගැටලුවක් ඉලක්ක කර ගත් පුවත් වන බවය. ළමයින් සම්බන්ධ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දි,

- ළමා ලිංගික හිංසනයන් සම්බන්ධව
- ළමා ඝාතනයන් සම්බන්ධව
- අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමුන් මුහුණපාන ගැටලු
- අනතුරු හේතුවෙන් ළමුන්ට සිදුවන හානි
- ළමුන්ගේ චර්යාමය ගැටලු

යන තේමාවන්ගෙන් පුවත් වැඩි වශයෙන් වාර්තා වී ඇත. පරිසරය සම්බන්ධ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී ද පුවත් වාර්තා වනුයේ යම් නිශේධාත්මක හෝ ඛේදනීය ගැටළුවක් ඉලක්ක කර ගත් පුවත් වන බවය. එනම්,

- අලි මිනිස් ගැටුම්
- සාගර සම්පත් විනාශයන් හා අයථා භාවිතයන්
- ස්වභාවික සම්පත් විනාශ කිරීම්

යන තේමාවන් පාදක කර ගනිමින් පුවත් වාර්තා කර ඇත.

ළමයින් සම්බන්ධව පුවත් ඉදිරිපත් කිරීමේ දී අනතුරු හේතුවෙන් ළමුන්ට වන හානි සම්බන්ධව හා ලිංගික හිංසනයන් නිසාවෙන් ළමුන්ට සිදු වන හානි සම්බන්ධව වැඩි වශයෙන් පුවත් වාර්තා කර ඇත. ළමයින් සම්බන්ධව වාර්තා කර ඇති පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී අනාවරණය වනුයේ ළමයින්ට වැඩි වශයෙන් ජීවත හානි වී ඇති බවය. කායිකව හානි වී ඇති ළමුන් සංඛ්‍යාව ද වැඩි වශයෙන් වාර්තා වේ.

පරිසරය සම්බන්ධව වාර්තා වී ඇති පුවත් දෙස අවධාරණය යොමු කිරීමේ දී පරිසර විනාශයන් සම්බන්ධ පුවත් බහුතරයක් වාර්තා වන අතර පරිසර විනාශයන් අවම කර ගැනීමට වැඩි වශයෙන් පියවර ගත යුතුව ඇත.

සමාජය තුළ පවතින අනාරක්ෂිතභාවය හේතුවෙන් ළමයින්ට කායික හා ජිවිත හානි සිදුවී ඇති පුවත් 11 ක් වාර්තා වන අතර එම අනතුරු වළක්වා ගත හැකි පුවත් වේ. විශේෂයෙන්ම එම අනතුරු ප්‍රජාවගේ නොසැලකිල්ල නිසාවෙන් සිදු වූ ඒවා වේ.

පරිසර විනාශයන් සම්බන්ධ පළ වූ පුවත් දෙස අවධානය යොමු කිරීමේ දී අනාවරණය වුයේ බලධාරීන්ගේ නිසි අවධානය යොමු නොවීම හේතුවෙන් එම පරිසර විනාශයන් සිදු ව ඇති බවයි. පරිසර විනාශයන් සම්බන්ධව අදාළ බලධාරින් දැනුවත් කිරීමේ පුවත් වාර්තාවන අතර එවැනි පුවත් වැඩි වශයෙන් වාර්තා වීම සමාජ අවශ්‍යතාවයක් වේ.

## 4.3 යෝජනා

මෙම විශ්ලේෂණ වාර්තාවට අනුව ඉදිරිපත් කළ හැකි යෝජනාවන් කිහිපයක් වේ.

- ළමා රක්ෂණය සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ගයන් ඇතුළත් පුවත් වාර්තා කිරීම
  - සිදුවීමට සම්බන්ධ ළමුන් සම්බන්ධ නීතිය සඳහන් කිරීම
  - නීතිය ක්‍රියාත්මක වන ආයතනයන් පිළිබඳව හා එම ආයතනයන් හා සම්බන්ධ වන ආකාරය පුවත් අන්තර්ගතයට ඇතුළත් කිරීම
  - ළමුන් අනාරක්ෂිතවන ආකාරය හා ඉන් මිදීමට අවශ්‍ය දැනුවත් කිරීම පුවත් අන්තර්ගතය තුළ ඇතුළත් කිරීම
- ළමා රක්ෂණය සඳහා ප්‍රජාව දැනුවත් කිරීමේ පුවත්, ලිපි ඉදිරිපත් කිරීම
  - ළමුන් සම්බන්ධ පුවත් අතරට විශේෂ අවධානය යොමුවන පරිදි ළමුන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රියාත්මක විය යුතු ආකරය පිළිබඳ දැනුවත් කිරීමේ ලිපි ඇතුළත් කිරීම
  - ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රජාවගේ ගැටළු විවෘතව හඳුනා ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයන් හඳුන්වා දීම
- ළමා හිංසනයන් සම්බන්ධව ගත හැකි නීතිමය ක්‍රියාමාර්ගයන් ද පුවත් තුළ අන්තර්ගත කිරීම
  - දණ්ඩ නීති සංග්‍රහය තුළ ළමුන්ගේ ගැටලුවලට අදාළ නීති මාලාවන් පුවත් තුළ අන්තර්ගත කිරීම

- පරිසරය සංරක්ෂණය කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීමේ පුවත් පත් ලිපි කලාත්මකව ඉදිරිපත් කිරීම
    - පරිසරය සංරක්ෂණය කිරීමට ප්‍රජාව උනන්දු කරවීම සඳහා ලිපි පළ කිරීම
    - පරිසරය සංරක්ෂණය කිරීමට අවශ්‍ය දැනවත් කිරීම් සිදු කිරීම
- පරිසරය සම්බන්ධව පුවත් ඉදිරිපත් කිරීමේ දී පරිසර විනාශය ජනතාවට හානිදායක වන ආකාරය පිළිබඳව ද පුවත් වාර්තාව තුළ අන්තර්ගත කිරීම
    - පරිසරය විනාශ කිරීම තුළින් ජනතාවට හානි සිදු වන ආකාරය ලිපි අන්තර්ගතය තුළ සඳහන් කිරීම
    - පරිසර විනාශයන් සිදුවීම ඔස්සේ ප්‍රජාවට සිදු වු විනාශයන් පිළිබඳව පූර්ව අත්දැකීම් ලිපි තුළ අන්තර්ගත කිරීම
- පරිසරය සංරක්ෂණය කිරීමේ දී ප්‍රජා දායකත්වය කෙසේ විය යුතු ද යන්නත් පුවත් තුළ අනතර්ගත කළ යුතුය
    - පරිසරය සංරක්ෂණය කිරීමේ දි ප්‍රජාවගේ සක්‍රිය දායකත්වය ලබා ගැනීමට අවශ්‍ය මැදිහත්වීමේ සැලැස්මක් ලිපි අනත්ර්ගතයට ඇතුළත් කිරීම
    - පරිසරය සංරක්ෂණය කිරීම සඳහා ප්‍රජාවගේ දැනුවත්වීම සඳහා වගකිවයුතු පාර්ශවයන් පිළිබඳව අනාවරණය කිරීම
- පරිසරය විනාශ කරන්නන්ට නීතිමය ක්‍රියාත්මක වීම හා ඊට හිමි වන දණ්ඩනයන් සම්බන්ධව ද පුවත් තුළ අන්තර්ගත කිරීම

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අබේසේකර, මෙන්දක සහ වීරක්කොඩි ඩී.එස්. , 1993
*අපේ දරුවන්ට සිදු වන්නේ කුමක්ද?* දෙහිවල සරණ මුද්‍රණාල ප්‍රකාශකයෝ

එදිරිවීර, ආරියසේන. 2011. *ශ්‍රී ලංකාවේ සහ අපරාධ විද්‍යාව.* කොළඹ 10 දයාවංශ ජයකොඩි සහ සමාගම

කරුණාතිලක, කේ. 1998. *අපරාධ, බාල අපරාධ හා පුනරුත්ථාපනය.* කොළඹ: මාලිංග ප්‍රකාශකයෝ

ගුණසේකර, සමරසිංහ - 2004- *රට රස්සාවලට ගිය අම්මලාගේ හෙට දවස අහිමි වූ දරුවෝ.* නුගේගොඩ : සුනෙර ප්‍රකාශකයෝ

*රත්නපාල, නන්දසේන- 2003- අපරාධ විද්‍යාවේ මූලධර්ම I.* වරකාපොළ : ආරියපොළ ප්‍රකාශකයෝ

*හෙට්ටිගේ, නිලන්ත, 2011 , අපරාධ සහ දඬුවම්.* කොළඹ : සමාධි ප්‍රකාශකයෝ.

www.answers.com/child

Oxford Advanced Learners's Dictionary 7th edition Oxford university press, 2005

## ඇමුණුම 01

**විශ්ලේෂණයට පාදක කර ගත් පුවත් තේමාවන්**

- නාමල් උයන 26 වසරයි; පරිසරය වනසන අයට සොබාදහමෙන් දඬුවම් ලැබෙනවා - දිවයින 2017 මාර්තු 21 අඟහරුවාදා
- කණුවක සිටි ඉත්තෑවෝ 5ක් උඩවලවට මුදාහැරෙති - ලංකාදීප 2017 මාර්තු 25 සෙනසුරාදා
- වගා ළිඳට වැටී කොන්ද කැඩුණු සද්ධන්තයා අවසන් ගමන් යයි - දිවයින 2017 මාර්තු 21 අඟහරුවාදා
- කිකිළියාමාන රක්ෂිතයේ දැව කඳන් 400ක් කැපූ පිය පුතු දේපළ රක්ෂිතයට - දිවයින - 2017 මාර්තු 04 සෙනසුරාදා
- සිංහරාජයේ මීවන පැළ ඇද්ද කුලී රිය රාජසන්තකයි ; ශාක සොරකම් කළ ජර්මන් මහාචාර්යවරයාට- බිරියට ලක්ෂ 18 දඩ - ලංකාදීප - 2017 මාර්තු 27 සඳුදා
- අනම් මනං නොවේ බොල්ගොඩ ගඟේ මේ මැනුම් බොල් වැඩම වේ - දිවයින 2017 මාර්තු 26 ඉරිදා
- අපේ මන්නාරම් බොක්ක මුහුදු ඌරන්ගේ පාරාදීසයක්; ගිය වසරේ ලංකාවේ 13ක් මරා දමලා - දිවයින 2017 මාර්තු 26 ඉරිදා
- අභය භූමියක් ලෙස නම් කර මාස කීපයයි; වැවේ ජලය සිඳීයාමෙන් කොටුඅත්තාවල අභය භූමියේ සතුන් පිපාසයෙන් - ලංකාදීප - 2017 මාර්තු 30 සඳුදා
- කැකිරාව - මිල්ලාගල, මහියංගණය- වේරගන්තොට වැලි මැරයෝ යකා නටති. ගම්වැසියන්ට මාධ්‍යවේදියාට ප්‍රහාර - දිවයින 2017 මාර්තු 12 ඉරිදා
- වැලි මාෆියාව දඹුලු ඔයටත් බැහැලා - දිවයින 2017 මාර්තු 12 ඉරිදා උසාවියෙන් ඇහෙන කුරුලු අවනඩුව - දිවයින 2017 මාර්තු 12 ඉරිදා
- ඩොල්ෆින් මසුන් 12 මරා ත්‍රිකුණාමල මුහුදේ සඟවලා; මාදැල් හිමිකරු ඇතුලු නවදෙනෙක් - අත්අඩංගුවට - දිවයින 2017 මාර්තු 10 සිකුරාදා
- ඔත්කැලේ කුණු නැවැත්තුවාට කොටුගොඩ නාහිමිගෙන් හා කාදිනල්තුමාගෙන් ජනපතිට පැසසුම් - දිවයින 2017 මාර්තු 10 සිකුරාදා

- කන්දකැටිය උල්පත ගම්මානයට වන අලින්ගෙන් අලි හිරිහැර - දිවයින - 2017 මාර්තු 07 අඟහරුවාදා
- තබ්බෝව අභය භූමියේ දැව ජාවාරම ජයටම නිළධාරින් 5කගේ වැඩ තහනම් - දිවයින 2017 මාර්තු 13 සඳුදා
- මාගල කුඩා ජලවිදුලි බලාගාරයක් පරිසරයට විනකටියි - දිවයින - 2017 මාර්තු 14 අඟහරුවාදා
- හබරණ කාශ්‍යප ගම ළිඳක් ගිලා බැහැලා - වතුර බොර වී පෙන එයි - දිවයින 2017 මාර්තු 09 බ්‍රහස්පතින්දා
- තල්දෙන හුණුකැටපිටියේ නිවසක් මතට පස් කන්දක් කඩා වැටේ - දිවයින 2017 මාර්තු 09 බ්‍රහස්පතින්දා
- බෙල්ලන්විල වැව අනතුරේ - ලංකාදීප - 2017 මාර්තු 10 සිකුරාදා
- සූරිය වැව ගම්රුසකට වන අලි තර්ජන - දිවයින - 2017 මාර්තු 14 අඟහරුවාදා
- වනජීවී සංරක්ෂණය සඳහා විශිෂ්ට පූර්ණ සේවා සම්මාන ලබති - දිවයින - 2017 මාර්තු 07 අඟහරුවාදා
- මධ්‍යම පරිසර අධිකාරිය "ජනාධිපති හරිත පරිසර සම්මාන - 2017"අයදුම්පත් කැඳවයි - දිවයින - 2017 මාර්තු 07 අඟහරුවාදා
- රිවර්ස්ටන් බලන්න එන අය තෙල්ගමු ඔය වනසති; පොලිතීන්, ප්ලාස්ටික්, පිළුණු කෑම ඉබාගාතේ. මත්ද්‍රව්‍ය භාවිතය නිසා ප්‍රදේශවාසීන්ටත් කරදර - දිවයින - 2017 මාර්තු 07 අඟහරුවාදා
- අවුරුදු 2200ක් ඉපැරණි හඳගල පුරා විදුබිම කාබාසිනියා කරලා - ලංකාදීප - 2017 මාර්තු 02 බ්‍රහස්පතින්දා
- ඉරිඟු හේනේ දී හක්ක පටස් කෑ වන අලියාගේ දිව කැඩිලා - දිවයින - 2017 මාර්තු 04 සෙනසුරාදා
- ළමාරක්ෂක නිළධාරියාගෙන් සිසුවකුට අමුතු ඇරයුමක් (සැකකරුගේ ජංගම දුරකථන වාර්තාවක් කැඳවයි) - ලංකාදීප 2017 මාර්තු අඟහරුවාදා
- දහතුන් හැවිරිදි දැරිය දූෂණය කළ "චූන්පාන්" වෙළෙන්දා අත්අඩංගුවට - දිවයින 2017 මාර්තු 29 බදාදා

- අලුත්ගම පාසල් සිසුන් දෙදෙනෙකුට එච් අයි වී - ඇසුරු කළ රූපලාවන්‍ය ශිල්පියා හා බ්‍රෝකර් අත්අඩංගුවට - දිවයින 2017 මාර්තු 13 සඳුදා
- බාලවයස් දැරිය අපහරණය කළ චීවරධාරියාට ශරීර ඇප දෙකක් - දිවයින 2017 මාර්තු 14 අඟහරුවාදා
- පෙම්වතා ජනේලය ගලවාගෙන ඇවිත් 14 හැවිරිදි දැරියට හදි කරලා - දිවයින 2017 මාර්තු 13 සඳුදා
- පෙම්වතාට පහර දී පෙම්වතිය දූෂණය කළාට දෙදෙනෙක් වසර 1 බැගින් හිරේ - ලංකාදීප 2017 මාර්තු 09 බ්‍රහස්පතින්දා
- සිසුන් දෙදෙනෙකුට අතවර කළ රූපලාවන්‍ය ශිල්පියෙක් රිමාන්ඩ් - ලංකාදීප 2017 මාර්තු 13 සඳුදා
- පහළොස් හැවිරිදි සිසුවියට අතවර කළැයි 61 වියැති විවාහකයා රිමාන්ඩ් - දිවයින 2017 මාර්තු 06 සඳුදා
- දැරණියගල ගමක සත් හැවිරිදි දැරිය කපා කොටා මරා දමලා ඥාතියෙකුත් මරුට අවුරුදු 19ක තරුණයකු අල්ලන්න හොයයි - ලංකාදීප 2017 මාර්තු 08 බදාදා
- දුරකථනයෙන් ප්‍රේම කර බාලවයස් දැරිය පැහැරගෙන ගිහින් පෙම්වතාත් උදව් කළ තරුණයාත් කොටු - දිවයින 2017 මාර්තු 15 බදාදා
- යුද සෙබළාගෙන් පහ වසරේ දැරියට අතවර - දිවයින 2017 මාර්තු 02 බ්‍රහස්පතින්දා
- රන්ටැඹේ ශිෂ්‍ය භට කඳවුරේ දී සිසුන් 6 දෙනෙකු නිරුවත් කර වීඩියෝ කරලා - ලංකාදීප 2017 මාර්තු 02 බ්‍රහස්පතින්දා
- අටහැවිරිදි දැරිය පැහැරගෙන ගොස් දූෂණය කර මරා දැමීම : මම මේ වැඩේට බැස්සේ හොඳටම බීලා ළමයා ගෙනිච්චේ මරණ චේතනාවෙන් නොවෙයි. විත්තිකරු අධිකරණයේදී පාපොච්චාරණය කරයි ලංකාදීප 2017 මාර්තු 02 බ්‍රහස්පතින්දා
- කටේ කිරි සුවඳ යන්නට පෙර කිරි දීමේ ඛේදවාචකය - දිවයින 2017 මාර්තු 12 ඉරිදා
- අම්මලාගේ කට නිසා බබාලා ලෙඩ වෙති - දිවයින 2017 මාර්තු 28 අඟහරුවාදා

- යතුරුපැදිය බසයක ගැටී අම්මයි පුතයි මරුට - ලංකාදීප 2017 මාර්තු 25 සෙනසුරාදා
- මහානාමයේ සිසුහු යශෝධරාවට පැන යකා නටති - දිවයින 2017 මාර්තු 22 බදාදා
- තැලසීමියාව සැඳුණු අයියාගෙත් නංගිගෙත් කඳුළු කතාව - දිවයින 2017 මාර්තු 22 බදාදා
- බාලවයස්කාරිය රවටා සොහොයුරාට විවාහ කර දෙන්න ගෙදර එක්ක ගිහින් - ලංකාදීප 2017 මාර්තු 18 සෙනසුරාදා
- බල්ලෙක් හපා කෑ අවුඃ 3 1/2 දැරියට එන්නත් ගන්න කි මී 70ක් දුර ගිහින් - ලංකාදීප 2017 මාර්තු 18 සෙනසුරාදා
- බාලවයස් දියණිය සහ පුතා සමඟ පියා හොරකමේ ගිහින් - දිවයින 2017 මාර්තු 17 සිකුරාදා
- පියා මධුසාදයේ සිටිය දී දරුවා අයාලේ ගිහින් - ලංකාදීප 2017 මාර්තු 23 බ්‍රහස්පතින්දා
- අම්බලන්ගොඩ ධර්මාශෝකයේ 2 වැනි පන්තියේ සිසුවා අහුලාගත් මාලය අයිතිකාරියට - ලංකාදීප 2017 මාර්තු 23 බ්‍රහස්පතින්දා
- යාපනය කතරගම බස්රිය මිද්දෙණියේ නිවසකට කඩා වදී - දරු දෙදෙනාත් මවත් පියාත් රෝහලේ - ලංකාදීප 2017 මාර්තු 27 සඳුදා
- බිග්මැච් අස්සේ අමුතු මැච් එකක් ගහපු මදාවියෝ - දිවයින 2017 මාර්තු 26 ඉරිදා
- පච්..... අපේ දරු පැටව් - දිවයින 2017 මාර්තු 20 සඳුදා
- පාසල් සුපරික්ෂණ අවශ්‍ය ඇයි - දිවයින 2017 මාර්තු 20 සඳුදා
- නංගිට යන්ට කතා කළ අබේපිටියේ සැකකරු රිමාන්ඩ් - දිවයින 2017 මාර්තු 20 සඳුදා
- මවගේ දානයට බඩු ගේන්න බස්රියක් එනතුරු ඉඳලා එගොඩඋයන බස්නැවතුමට ලොරියක් කඩාවැදී මව-දියණිය හා තවත් අයෙක් මියයති - ලංකාදීප 2017 මාර්තු 20 සඳුදා
- ත්‍රිරෝද රිය ලයිට් කණුවක හැපී පියාට දුවට බරපතලයි - ලංකාදීප 2017 මාර්තු 20 සඳුදා

- හැදූ මව පොල්ලකින් ගසා සිව් හැවිරිදි පුතු මරා දමලා - දිවයින 2017 මාර්තු 16 බ්‍රහස්පතින්දා
- දරුවන්ගේ රැකවරණය හා ආරක්ෂාව තහවුරු කිරීමට වෙබ් අඩවියක් - දිවයින 2017 මාර්තු 16 බ්‍රහස්පතින්දා
- දැරණියගල දී කුඩා දැරියක හා ඥාතියා කපා කොටා ඝාතනය කරලා - දිවයින 2017 මාර්තු 08 බදාදා
- මේක අපායක්...... මේ ආත්මයෙන් යනවා........ මම යන්නේ දිව්‍ය ලෝකේ - දිවයින 2017 මාර්තු 08 බදාදා
- රත්නපුර පන්සලක ටියුෂන් පන්තියක දැරියක් වැසිකිළි බිත්තියකට යට වී මරුට - ලංකාදීප 2017 මාර්තු 14 අඟහරුවාදා
- ළමා සිත් කෙළෙසන මවුපියෝ - ලංකාදීප 2017 මාර්තු 09 බ්‍රහස්පතින්දා
- පාසල් සිසුවියන් 32 ගිය ලොරියේ තට්ටුව කඩා වැටේ
- 17ක් රෝහලේ ලොරිය පදවා ඇත්තේ එම පාසලේ ම ගුරුවරයෙක් - දිවයින 2017 මාර්තු 10 සිකුරාදා
- තුන්මාසේ කිරි දරුවාගේ මරණයට අම්මා අත්අඩංගුවට - ලංකාදීප 2017 මාර්තු 07 අඟහරුවාදා
- අලුත උපන් බබා බෑග් එකක දමා ගෙයක් ළඟ තියලා - දිවයින 2017 මාර්තු 13 සඳුදා
- යකාල ගල්වළක දිය නෑ පාසල් සිසුවෙක් දියේ ගිලී මරුට - දිවයින 2017 මාර්තු 14 අඟහරුවාදා
- දැරියට පාසල් අහිමි කළ ඒඩ්ස් හංවඩුවේ ශෝකාන්තය - ලංකාදීප 2017 මාර්තු 31 සිකුරාදා
- පොල් උලකින් ඇන බිරිය මැරූ සැමියා එය දුටු අවු 06 ක දුවත් මරලා මහාධිකරණයෙන් මරණ දඬුවම - ලංකාදීප 2017 මාර්තු 31 සිකුරාදා
- විදුහලේ වහළය කඩා වැටී සිසුහු 21 රෝහලේ - ලංකාදීප 2017 මාර්තු 31 සිකුරාදා
- කොටවෙල අනාරක්ෂිත ළිඳක වැටී දෙහැවිරිදි දරුවා මිය යයි - ලංකාදීප 2017 මාර්තු 31 සිකුරාදා

- දින තුනක් වයසැති බිළිඳා උගුරේ කිරි හිර වී මරුට - දිවයින 2017 මාර්තු 09 බ්‍රහස්පතින්දා
- මේ දරුවා ගැන තොරතුරක් වෙතොත් ළඟම පොලිසියට කියන්න - දිවයින 2017 මාර්තු 09 බ්‍රහස්පතින්දා
- දැරියකට හම්බන්තොට රෝහලේ දී උපත් පාලන සැත්කමක් කරලා - ලංකාදීප 2017 මාර්තු 10 සිකුරාදා
- දරු දෙදෙනා අකුණු සැර වැදී රෝහලේ - ලංකාදීප 2017 මාර්තු 09 බ්‍රහස්පතින්දා
- අවුරුදු එකහමාරක දරුවා වතුර වළකට බිලි - ලංකාදීප 2017 මාර්තු 09 බ්‍රහස්පතින්දා
- දෙමහල් ගොඩනැගිල්ලකින් වැටී උසස් පෙළ සිසුවා මියයයි - ලංකාදීප 2017 මාර්තු 13 සඳුදා
- පාරේ දමාගොස් සිටි අලුත උපන් දරුවා රෝහලේ දී සුවයෙන් - ලංකාදීප 2017 මාර්තු 13 සඳුදා
- උල්ලෙයි කුලම් වැවේ නාද්දී කිඹුලෙකු ඇදගෙන ගිය සිසු දැරිය මියයයි - ලංකාදීප 2017 මාර්තු 13 සඳුදා
- පානදුර පටු පාරක දී සොයා ගත් බිළිඳා රෝහල් ගත කෙරේ - දිවයින 2017 මාර්තු 11 සෙනසුරාදා
- සිවු හැවිරිදි දරුවාට පටියකින් පහර දී අත කැඩූ පියා අත්අඩංගුවට - ලංකාදීප 2017 මාර්තු 13 සඳුදා
- දරුවාගේ කොන්දට වින කටින පාසල් බෑග් - ලංකාදීප 2017 මාර්තු 13 සඳුදා
- මැණික් ව්‍යාපාරික නිවසකින් මුදල් සොරා ගැනීම : නිල සුනඛ ඉවෙන් 17 හැවිරිදි සිසුවෙක් අත්අඩංගුවට - ලංකාදීප 2017 මාර්තු 06 සඳුදා
- පාසලේ දී රෝගාතුරව මියගිය 12 හැවිරිදි සිසුවාගේ මරණය ගැන විවෘත තීන්දුවක් - දිවයින 2017 මාර්තු 06 සඳුදා
- සිසුන් දෙදෙනෙකුගෙන් රු 2500 ක් බලෙන් අරන්; මහනුවර පාසල් සිසුහු 3ක් රිමාන්ඩ් - දිවයින 2017 මාර්තු 06 සඳුදා

- අම්බලන්ගොඩ බස් නැවතුමක දමාගොස් සිටි දරුවා පොලිසියෙන් රෝහලට - දිවයින 2017 මාර්තු 06 සඳුදා
- ත්‍රීරෝදය පෙරළීමෙන් පාසල් ශිෂ්‍යයා මරුට - දිවයින 2017 මාර්තු 04 සෙනසුරාදා
- මීයා එළවන්න ගිය පාසල් සිසුවා ඇන්ටනා බටයක් මතට වැටී මරුට - දිවයින 2017 මාර්තු 03 සිකුරාදා
- බෙන්තොට මුහුදේ නාන්න ගිය සිසුවෙක් මරුට; බේරාගත් අනිත් සිසුහු දෙදෙනා රෝහලේ - ලංකාදීප 2017 මාර්තු 02 බ්‍රහස්පතින්දා
- සාමාන්‍ය තුවාලයකටවගේ බෙහෙත් දමා ටිකට් කැපුවා; මගේ පුතා මිය ගියේ ගොකරැල්ල රෝහලේ වෛද්‍යවරුන්ගේ නොසැලකිල්ලෙන් - දිවයින 2017 මාර්තු 06 සඳුදා
- නොදරුවාට අරක්කු පෙවූ නරුම බේබද්දෙක් - දිවයින 2017 මාර්තු 07 අඟහරුවාදා